TECKY THANOMYA

sinhalaebooks.com



බිඳුනු හීන ගණනාවකට යළි පණ දුන් අහිංසකාවිය

# පාරූ

♥♥♥♥♥♥♥♥♥

©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

# 1 කොටස

සුපුරුදු පරිදි අන්තිමටම වෑන් එකට නැග්ගේ මම. අද තමා අපේ ඉස්කෝලේ ඒ ලෙවල් බැජ් එකේ කාලයක් තිස්සෙ ප්ලෑන් කරපු ඩ්‍රීම් ට්‍රිප් එක. ට්‍රිප් එකක් කිව්වට ට්‍රිප් එකක්ම නෙමේ පොඩි කෑම්පින් වැඩක්. ඒක කරන්න අපි ලෑස්ති කර ගත්තේ නාවුල භාහිර පුහුණු මධ්‍යස්ථානය. අර නායකත්ව පුහුණු වැඩමුළු එහෙම පැවැත්වෙන්නේ එන්න එහේ. බැජ් එකේ එකෙක්ගේ පෞද්ගලික හැඳුනුම්කමක් මත තමයි මේ ගමන සෙට් උනේ. කට්ටි කට්ටි වෑන් වල තමා යන්නේ..

මම පාරු. පාරු කිව්වට සම්පූර්ණ නම තයිශූ පාරින්ද්‍ර අධිකාරි. ඒ ලෙවල්ස් කරේ ලැන්වේජ් ස්ට්‍රීම් එකෙන්. රිසල්ට්ස් අවුට් වෙනවත් එක්කම අප්පච්චිත් එක්ක ප්‍රයිවට් කැම්පස් එකක රෙජිස්ටර් උනා. තාම පටන් ගත්තේ නම් නෑ. ඊට කලින් තමයි මේ කෑම්පින් එක ද ගත්තේ.

මාත් එක්ක මේ වෑන් එකේ ඉන්නව මගේ පාප මිත්‍රයෝ 9 දෙනෙක්. අපි 10 දෙනා තමයි ක්ලාස් ගියේ. බැජ් වල අනිත් සැට් එක ඒ ඒ අයගේ වාහන වල ඔක්කොම මන් හිතන්නේ 75 ක් විතර ඉන්නවා මේ කෑම්පින් වැඩේට. තව අපි නොදන්න අයත් එනවලු ඉතින් ගිහිල්ලම බලමුකෝ තේද.

අඳුන්වලා දෙන්න බැරි උනානේ මගේ පාප මිත්‍රයෝ තම දෙනා ඔන්න පිලිවෙලින්

01.දූන්‍යා (දූනී)
02.මිහානා (මිහූ)
03.මින්රාධා (මිනූ)
04.ආන්‍යා (ඈන්)
05.දිනිඳු (දිඳූ)
06.අශස් (අශ්)
07.ගීශාන් (ගී)
08.යසිරු ( යසී)
09.හිරුන් (හිරූ)

ඔතනින් ඉතින් මගේ බෙස්ට් තමා දූනී. දූන්‍යා විහංගි. අපි දෙන්නා තමා මොට්ටසෝරි කාලේ ඉඳලම එකට ඉන්නේ.. ඔතනින් මිහානා, මින්රාධා, ආන්‍යා, දිනිඳු, අශස්, යසිරු මේ ඔක්කොම ඒ ලෙවල්ස් කරන්න අපේ ස්කූල් එකට ආපු අය ගීශානුයි හිරුනුයි දූනී මායි තමා 1 වසරේ ඉඳන්ම එකට ආවේ. ඕකේ දැනට ඔය විස්තර ඇති යමු ගමන

කොළඹින් පටන් අරගෙන පැය 3.30ක 4 ක විතර ගමනකට මන් වාඩි උනේ පිටිපස්සෙම සීට් එකේ. ඒකේ නේ හතර දෙනෙක්ට යන්න පුළුවන් පිස්සෝ හතර දෙනා තමයි දූනී, මමයි , ගී යි , හිරු යි. අනිත් සැට් එක තුන් දෙනා තුන් දෙනා ගානේ ඉස්සරහ. කැම්ප් එක දවස් තුනක් නේ දවස් තුනකට ඇති වෙන්න ඇඳුම් අනම් මනම්

ඔක්කොම අරගෙන මේ යන්නේ. හැමදාමත් වගේ දුනී වමනේ යනවයි කියල ජනේලේ අයිනට වෙද්දි එයාගේ ප්‍රේම භූංග රාජයා නොහොත් අපේ ගී කොලුවා ශිශාන් ත් දුනීගේ ලගින්ම ඉදගත්තේ අහිංසක තනිකඩ මායි හිරුවයි අනිත් පැත්තට වෙද්දි. උදේට කෑම කාලා 11 ට විතර අපි පිටත් උනේ නාවුල බලලා. සිංදු කියල කියල එපා වෙලා එක එක පෙරේතයෝ පොලේ ගහල වගේ ඔහේ ඉන්නවා. තවත් ඉවසනු බැරි තැන මන් කෑ ගැහුවේ

"බඩගිනී ප්‍රෙන්ස්"

"අඩී තව පැය බාගයයි බම් ගිහින්ම කමු" ඒ ඩ්‍රයිවර් අයියත් එක්කම සීට් එකේ හිටිය දිනිදුවා

"බෑ බෑ බෑ හොදටම බඩගිනි දැන් නම්"

වැඩි කැමැත්ත මැද්දේ කෝම හරි කට්ටිය නාවුල භාහිර පුහුණු මධ්‍යස්ථානයට පැය බාගෙක වගේ දුරක් තියලා අයිනකින් නවත්තලා කෑම ගත්තේ වෑන් 7 ම එක දිගට එක පෙලට නවත්තලා. හවස 3 ට විතර නිසා උදේ ගත්තු බත් පාර්සල් චුට්ටක් නරක් වෙන්නත් ඇවිත්. කාල මරනත් අකාලා මරනත් කියල කාල මරනත් තෝරගෙන යහමෙන් බඩ කට පුරෝගෙන අපි ආවේ තැනට.

පුදනකොටම කාපි යකා කියල ඉස්සල්ලාම අඩිය තිබ්බ ගමන් දුන්නා නේද හොඳ දේශනයක්.

අපි විතරක් නෙමේ තව සෑහෙන ලමයි ගොඩක් එතන හිටියා.

ගෑනු ලමයි වෙනම හොස්ටෙල් එකක නවතින්නේ, පිරිමි ලමයි ඊට ගොඩා.........ක් ඈත හොස්ටෙල් එකක නවතින්නේ රෑ කෑමෙන් පස්සේ ගෑනු ලමයි පිරිමි ලමයි හමුවීම සපුරා තහනම්.
පිරිමි ලමුන්ට ගෑනු ලමයින්ගේ හොස්ටෙල් එක අසලටවත් ගෑනු ලමුන්ට පිරිමි ලමුන්ගේ හොස්ටෙල් එක අසලටවත් යෑම් ඒම් තහනම්.
උදෑසන 5ට ව්‍යායාම.
මෙහි දවස් තුන තුළ සිදු කරන්නා වූ සියලු ක්‍රියාකාරකම් සඳහා සහභාගි වීම අනිවාර්යයයි. සියල්ලන්ගෙම වෛද්‍ය සහතිකයක් ලබාගෙන ඇතුලත කර ගත් බැවින් කිසිඳු හේතුවක් මත ක්‍රියාකාරකම් වලට සහභාගි නොවී සිටීම කල නොහැක.
හොස්ටල් එක තුළ හැරෙන්න ජංගම දූරකථන භාවිතය සපුරා තහනම්.

හම්මෝ කපල් වල මූණු දෙක වෙද්දි තනිකඩ අපිට හිනා ගියේ හොඳම වැඩේ කියලයි. මොනා උනත් කාටවත් අමතක නොවෙන විදියේ දෙයක් වෙයි කියල අපිට හිතුනේ දේශනය අතර තුර එයාලා පෙන්නපු වීඩියෝ දර්ශන වලිනුයි. ක්‍රේන් වල යන ඒවා, අර නෙට් දිගේ උඩට නගින ඒවා, රෑ ගිනිමැලේ, බෝට් රයිඩින්, අම්මෝ එක එක විදියේ දේවල්.

ඒ දේශනයත් ඉවර වෙලා අපි ආවේ ගැහැණු ඉන්ස්ට්‍රක්ටර් කෙනෙක් එක්ක ගැහැනු ලමයින්ගේ හොස්ටල් එකට. බුදු අම්මේ අපේ ඉස්කෝලේ මේන් හෝල් එක සයිස් දිගට දිගට දිග..........ට ඇදවල් දාලා. ඇදවල් තුන තුන වෙන් කරලා හැම ඇදක් උඩම තව ඇදක්. කොටින්ම ගෑනු ලමයි 100 ක් විතර ඉදලත් ඒ හැමෝටම වැඩිත් වෙන්න තරම් ඇදවල් සහ ඉඩ ප්‍රමාණය. ඒ තරම් දිග ලොකු හෝල් එකක්. තම තමන්ගේ කැමැත්තට තැන් හොයාගෙන බඩු අස් කරලා ගෙවල් වලටත් කතා කරලා විස්තරේ කියල අපි වොශ් එකක් ඒම ද ගත්තේ අම්මේ ඉතින් නිදා ගන්න තිබ්බ හෝල් එක වගේම තමා වෙනම හදල තියෙන්නේ 20 කට 30 කට එක පාර වොශ් කරන්න පුළුවන් තැනක්. වතුර නම් අල්ලන්න බැරි ගාන සීතල. පරිසරයත් සීතලයි. මේ සීතලේ දවස් තුනක් එක දිගට 5 ට ඇහැරෙයිද කියන ප්‍රශ්නෙත් එක්ක අපි ඉක්මනට ලෑස්ති උනේ රෑ කෑමට කෑම කන හෝල් එකට යන්න. 8.30 ගානට වෙලාවට අර ලේඩි ඉන්ස්ට්‍රක්ටර් ඇවිත් උන්නේ 8.30 කියන්නේ 8.25 වත් 8.35 වත් නෙමේ කියල උපදෙස් දෙමිනුයි. ඉක්මනට කෑම ගන්න හෝල් එකට ගියාමයි දැක්කේ අම්මේ අපේ කොම්ලෝ ටික හොඳට කනවා. අපේ සෙට් එක එක්කම වාඩිවෙලා කෑම කාලා ආයෙම හොස්ටල් වලට වැදුනේ හොදට නිදා ගන්න හිතලයි.

උදෙන්ම නැගිටින්න ඕනි නිසා නිදා ගන්න හැදුවත් නෑ

නින්දක් අහලකවත් නැත් වෙනස් නේ. ඉතින් කාටවත් නිදි මත නැ කෑ ගහන්නත් බැ මොකද එහා පැත්තේ තියෙන්නේ ගැහැනු ඉන්ස්ට්‍රක්ටර්ස්ලාගේ හොස්ටල් එක. එක පාරට මැසේජ් එකක් ආවේ හිරුගෙන්

"පාරු"

"ම්ම්ම්"

"නින්ද යන් නැ නේ "

"අපිටත් "

එක පාරට ෆොටෝ ටිකක් ආවේ එන ටිකට වෑන් එක ඇතුලේ අපි කරපු කෝලම් වලයි. හිනා වෙවී බල බල ඉද්දි එක පාරට දැක්ක්කේ.. මේ යක්සයට හේත්තු වෙලා මත් හොඳට නිදි. විලි ලැජ්ජාවයි. ඇත්තටම හිරුත් දුනී තරම්ම මට ලගම යාලුවෙක්. ඕනි දෙයක් කියන්න පුළුවන් කිව්වම දුනීටත් වඩා ඉක්මනට තේරුම් ගන්න පුළුවන් යාලුවෙක්. රිසල්ට්ස් අවුට් උන ද ඉදන් හිරු එයාගේ හිතේ මොකක් හරි දෙයක් හිර කර ගෙන ඉන්නවා කියල දැනුනත් ඒ දේ මොකක්ද අහන්න මමත් බය උනා. ඔව් ඔයාලා හිතන එකම තමයි. හිරු මාත් එක්ක මීට වැඩිය ඉස්සරහට යන්න කැමති උනත් එයා බයයි අන්තිමට යාලුකමත් නැති වෙයි කියල. ඇත්තටම මේ විදියට හැරෙන්න වෙන විදියකට ඉස්සරහට යන්න පුළුවන්

හැඟීමක් මටත් ඔහු ගැන නෑ. ඒ හින්ද නොතේරෙන විදියට යාලුකමත් තියාගෙන ඉන්න මන් ගොඩක් ඔට්ටු උනා.හිරූ කියන්නේ තාත්තා ත් නැතුව අම්මයි අක්කයි එක්ක හැදුන ලමයෙක්. හරිම හොඳයි

ඉතින් කියන්න එහෙම වැරැද්දක් නෑ.බලමුකෝ ඉස්සරහට.

වෙලාව රාත්‍රී 12 ටත් ලගයි. යන්තම් නින්ද ගිහින් තිබ්බත් ඉන්න බැරි බඩේ කැක්කුමක් එක්ක මන් නැගිට්ටේ හවස නරක් වෙන්න ඔන්න මෙන්න තියල කාපු බත් එක මතක් වෙලා ඒත් කොහොම යන්නද අපේ හොස්ටල් එක එලියෙන් ලොක් කරලා යතුර ගන්නවා ඉන්ස්ට්‍රක්ටර්ස් ලා. ඇඹරි ඇඹරි දූනියට කතා කරේ ඒක හොදට නිදි. මන් වගේම ඇඹරි ඇඹරි ඈන් නැගිට්ටේ ත් බඩ රිදෙනව බත් ගාගෙනමයි. හරි බඩුම තමයි එකා දෙන්නා ඇහැරෙන්නේ බඩවල් අල්ලන්. අපේ කසුකුසුව ඇහිලා ඉන්ස්ට්‍රක්ටර් කෙනෙක් ඇවිත් ලොක් එක ඇරියේ එකා දෙන්නා ටොයිලට් බලා දුවද්දියි. හරියන් නෑ දෙපාර තුන් පාර හතර පාර යන්නේ.. ඒත් බඩවල් රිදෙනවා. අසමෝදගම් බීලා බීලා කෝපි බීලා බීලා අපි සෙට් එක ඇදවල් වලට උනේ මරලා දලා වගෙයි කාල මරනන් ම තමයි. නින්ද ගිය වෙලාවක් මතක නෑ කට්ටියගේ අලාම් වල 4.00 වැදෙන්න ගත්තේ පැයක් ඇතුලත 100 දෙනෙක් අවම පහසුකම් බැලන්ස් කරගෙන ලෑස්ති වියයුතු බැවිනුයි. කට්ටිය 4 ට නැගිට්නව කියල දැන දැනම බොරුවට පොර කන්න ඕනි නැති හින්ද  4 ට විනාඩි 15 ක් විතර

තියල මායි දුනි ඇහැරිලා ඉක්මනට වැඩ ටික කර ගත්තේ බොටම ඇදල ශූස් දලා ටී එක යට කරලා කැප් එක දලා ආයෙමත් ඇදට.

හරියට 5 වෙද්දි අපේ ඉන්ස්ට්‍රක්ටර්ස් ලත් අපි වගේම ඇදුම් ඇදගෙන හරියට 5 ට ග්‍රවුන්ඩ් එකට ආවේ කට කට ගාලා ගැහි ගැහි. කොම්ලෝ සෙට් එකත් සෙට් උනේ උදෑසන ව්‍යායාම පටන් ගනිමින්. හරියටම පැයක් ව්‍යායාම වල යෙදුනේ හරියට ඉන්නේ කවුද කියල වත් නොපෙනෙන කරුවලෙයි. ඉර එලිය වැටීගෙන එද්දියි මූණු දැක්කේ. එක එක ජාතියේ කොම්ලෝ කෙම්ලෝ 200 ක් විතර. 50 ගානෙ හිටවල පෝලිම් හතරක් හැදුවේ ඒ ඉන්ස්ට්‍රක්ටර්ස්

ලාමයි. 1234,1234,1234, කියන් යන්න කියමින් කණ්ඩායම් හතරකට අපිව වෙන් කරේ අතිජාත මිත්‍රයො අපි එක එක කණ්ඩායම් වලට කැඩෙමින්. මාවයි ඇන්වයි එකට වැටුනා හම්මෝ සී සී කඩ අනිත් සැට් එක. මන් අංක 1 වෙද්දි දුනී 2 මීහු 3 මිනු 4 හම්මේ මූණු බෙරි කරගෙන ඉදන් ඉන්නවා අපේ කොම්ලෝ ටික බලද්දි හිරූ 1 ගී 4 ද කොහෙද ඒක තමා දුනියා වැලපෙන්නේ

කෝමින් කෝම හරි අංක අනුව අපිව වෙන් කර ඉන්දෙව්වා.

"ඕකේ ලමයි, දැන් ඔය බෙදිලා තියෙන ටීම් එක තමයි

මේ දවස් තුනට ඔයාලගේ ටීම් එක වෙන්නේ. කවුරු හරි ඉන්නවද ටීම් මාරු වකට කැමති.මට මේකේ ඉන්න බෑ යාලුවා අරකේ. ඕම ඕම ඉන්න්නව නම් නැගිටින්න බලන්න"

හම්මෝ බාගෙට බාගයක්ම නැගිට්ටා

"තිකම් විහිලුවට වගේ ඇහුවේ ලමයි. ඉදගන්න දැන්. කාටවත් ටීම් මාරු කරන්න බෑ. ඔය ටීම් එකේම ඉන්න ඕනා දවස් තුනම. දැන් මේ බෙදිලා තියෙන විදියට එක ටීම් එකකට 50 ගානේ වැටිලා තියෙනවා. ඒ කියන්නේ ටීම් හතරෙම ඔක්කොම ලමයි 200යි. අද දවස ඇතුලත තමන්ගේ ටීම් එකේ ඉන්න ලමයි 50ම නම් තමන්ට මතක තියෙන්න ඕනා.. අන්න ඒකයි අපේ පලවෙනි රූල් එක.නම් අමතක උනොත් අන්තිම දවසේ මේ ටීම් හතරේ තරගෙන් ලකුනු අඩු වෙයි. මෙතැන් පටන් ඔයාලගේ ටීම් අතර තරගේ ඇරඹෙනවා.ආ ඊට කලින් ඔයාලට ලැබෙනවා පොඩි නිධානයක්, එන්න ඒ නිධානේ ඔයාලා ආරක්ශා කරන්න ඕනා දවස් තුනක් යනකම්. දැන් ඔයාලට ලැබෙයි ඒ නිධානේ"

අපි හැමෝම හරි උනන්දුවෙන් නිධානේ අතට ගද්දි

දැක්කේ ඒක කුකුල් බිත්තරයක්. හැමෝටම එක ගානේ බිත්තර හම්බුනා

" හරි ළමයි දැන් ඔයාලට නිධානේ හම්බුනා. ඕක පරිස්සම් කර ගන්න දවස් තුනක් අන්තිම දවසේ ලකුනු වලට සෑහෙන ප්‍රයෝජනයක් වෙයි. ක්‍රියාකාරකම් වලදී හොස්ටල් එක ඇතුලෙයි හැරෙන්න ඕක තමන් ලගම තමන්ගේ අතේම තිබිය යුතුයි. අපේ ඉන්ස්ට්‍රක්ටර් කෙනෙක් ඇවිත් පෙන්නන්න කිවොත් ඒ වෙලාවට තමන්ගේ අතේ තියෙන්න ඕනා.. ඕකේ."

"මේ මොන විකාරයක් ද බන් දවස් තුනක් යනකම් මේ බිත්තරයක් පරිස්සම් කරන්න කියන්නේ "

කට්ටියගේ කසු කුසු මැදින්

"ඕකේ දැන් ඔයාලගේ ටීම් හතරට අදාලව ඉන්ස්ට්‍රක්ටර්ස් ලා හතර දෙනෙක් ලැබෙයි. එයාලා එක්ක තමයි ඔයාල දිනන්න ඕන, හරි දැන් පටන් ගන්න.එකමුතුව ඉන්න. ටීම් එක තමයි අංක එක විය යුත්තේ ඔයාලගේ"

අපිට හම්බුනේ එතන හිටපුඅයගෙන් තරුණම ඉන්ස්ට්‍රක්ටර්. තරුණ කිවට එතන හිටපු අයගෙන් තමා වයස නම් 40 ක් 45 ක් වත් ඇති ඉන්ස්ට්‍රක්ටර් ලා වෙනම සාකච්ඡාවක ඉද්දි. මන් බැලුවේ අපේ ටීම් එකට වැටිලා උන්නු අනිත් අයගෙ මූණු. හම්මේ එක එක විදියේ ඩයල්

ඔම බල බල ඉද්දි දැක්කේ හම්මෝ අපේ සැට් එකේ කෙම්ලෝ ටික බලන් ඉන්නවා කන්න වගේ ඒ මැන්ස් දිහා.

ලස්සනට වවලා තියෙන ඝන රැවුල, කොන්ඩෙත් සාමන්‍ය ගානට වවලා. ජිම් ගිහින් හදා ගත්තු ඇඟ. තලෙලු

හම.කෙම්ලෙක් දෙපාරක් හැරිලා බලන ජාතියේ පෙනුමක් මෑන් ලග තිබුනා.දෙපාරක් නෙමේ අපේ සැට් එක මෙලහට සිය දහස් වාරයක් බලන්න ඇති. අනිත් උන් වගේම මමත් ඇස් වලින් අනුභව කර කර ඉද්දි එක පාරටම බැලුව්වෙ මන් ගැස්සිලා අහල බලාගද්දි. විලි ලැජ්ජාවේ බෑ. ආයේ නම් බලන් නෑ කියල හිතන ටිකට තව එක පාරක් බැලුනේ මගේ නම්බුව බම්ලට දලා. හිනා වෙනවා නේද මෑන් ඒ පාර. අම්මෝ ඉතින් ඒ හිනාව හිත සලින වෙලා ගත මිලින වෙලා යනවා

"ඒ ඒ අඩොව් පාරු.මෙච්චර වෙලා අපි බල බල හිටියා අපිව ගනන් වත් ගත්තේ නෑ.බෝ නිකම් ඇහැ දැම්මා විතරයි බලපන්කෝ හිනාව. ඒ අපිටත් චාන්ස් එකක් දියන් බම්" කෙල්ලෝ ටික විහිලු කරන්න ගත්තේ මට වහ කන්න හිතෙද්දි..

"අනේ අනේ මේ අහිංසක මට නම් එපා.. මන් මේ බොලාලා බලන හින්ද පොඩ්ඩක් බැලුවේ.බොලාලම තියා ගනිම්ලා. මට එපා. අනිවා කෙල්ලො 7ක් 8 ක් වත් ඇති ඕකට නම් "

කතාවට බාධා කරමින් හිරු කොහෙන්දෝ මන්ද ඉදන් ඇවිත් මගේ එහා පැත්තෙන් ඉද ගත්තේ.

"බඩගිනි නැද්ද මි"

"බඩගිනි අප්පා දැන් කන්න දෙයි නේද හුම්"

"අම්මෝ සාගතකාරයා" කියලා නහය මිරිකුවේ වෙනදාවගේම හච්චිමකුත් ගීත් නහයත් එක්ක මුලු මූණම රතු වෙද්දි.

"අනේ හිරූ නරකයි අප්පා ඔයා "

"පිස්සි " කියලා ආයෙමත් සැරයක් හරි අමාරුවෙන් උඩට කරල බැඳන් උන්නු කොන්ඩේ ඇවිස්සුවේ නොදැනුවත්වම අර මෑන් දිහා මට ආයේ පාරක් බැලෙද්දි. අම්මෝ ඒ පාර රවනවා නේද මට එකසිය ගානට. හොදටම කේන්ති ගිහින් ඉන්න මූණක්. නලලත් රැලි කරලා මන් පිටිපස්ස බැලුවේ ශුවර් එකටම රවන්නේ මටමද කියල බලා ගන්නයි. ඔව් මටම තමා. සමහර විට මන් මේ යකාට කෙල්ලෝ හත අටක් ඇති කිව එක ඇහිල වත් ද දන් නැ. අනෙ මන් නම් බය වෙයි හුම්

"ලමයි හරි ඔන්න වෙන්න ඕනි වැඩ පිලිවෙල අපි කතා කර ගත්තා දැන් ඔයාලගේ උදේ කෑම ලෑස්ති ගිහින් කෑම කාලා ආයෙම මෙතනට එන්න. කෑම පැය තුල ඔයාලට ඕනි දෙයක් කරහැකි. හොස්ටල් යනව නම් ගිහින් වොශ් රූම් යනව නම් ගිහින් ඕනි දෙයක් කරල හරියට පැයකින්

මෙතනට එන්න."

පාන්දර ඉදන් නැගිටල උපරිම බඩිගින්නේ හිටිය අපි ඉක්මනට ගිහින් කෑම කාල වොශ් රූම් ගිහින් එහෙම ආයෙම පැයකින් අතනට එකතු උනේ. කට්ටිය අඳුර ගන්නව එක එක්කෙනා කතා කරලා. ඇයි නම් අමතක වෙන්න බෑ කිවනේ. ඔක්කොමත් හරි අර නපුරා ලගට නම් යන් නෑ කියල හිතා ගෙන අතිත් ඔක්කොටම වගේ කතා කරේ බොහොම අමාරුවෙන් මූනුයි නම් ටිකයි මතක තියාගනිමින්. එක පාර බෑ නේ ඉතින් බලමුකෝ.

"ඒ රකීත් ලූ නම "

අම්මෝ එච්චර ලස්සන නමක් ද ඒ නපුරට හිත හිත ඉද්දි

එක පාරට ඇදිලා ගියේ පිටිපස්සට හිතන්නවත් වෙලාවක් නොතියා. ඔව් ඔව් අර යක්සයා තමා. ගෑවෙන නොගෑවෙන ගානට මූණට ලං කරගෙන අතින් ඇදගෙන

"මොකක්ද නම"

"ත...යි...ශූ"

"වයස"

"දහ..නවයයි.."

"හරි"

පුදුම මනුස්සයෙක් නේ යකූ. කන්න වගේ බලන් හිටියයි ප්‍රශ්න දෙක ඇහුවයි ගියයි.

"හරි ළමයි.. ඔයාලගේ පලවෙනි ඇක්ටිවිටි එකට යමු එහෙනම් ෆලෝ මී"

ඉන්ස්ට්‍රක්ටර්ගේ පස්සෙන් ගියේ අපි හම්මෝ දැක්කම බය හිතෙනව ඉතින් කවදා කරපු දේවල් ද.. අර ලොකූ දැලක් ගහල ඒක දිගේ නගින්නයි බහින්නයි තියෙන්නේ වැටුනොත් ඒම සද සොත්ති හම්මෝ ඉතින් ඉන්ස්ට්‍රක්ටර් කිව්ව විදියටම අපි ඉතින් නැග්ගයි බැස්සයි හැමෝම. ඒක හරි ජොලි. ටිකක් බය හිතෙනව උඩට යද්දි. සමහර කෙම්ලෝ බෑ කිව්වා ඒත් මෙහෙදි බෑ කියවිලි බෑ කියල අඩ අඩ හරි නැග්ගුවා කට්ටියවම.

දෙවෙනි ඇක්ටිවිටි එක තිබ්බේ අඩි පහලවක විතර උසකට අට්ටාලයක් වගේ එකක් බැදලා. කට්ටියම ඒක ලගට ගියේ වෙන්නේ මොකක්ද කියල හිතා ගන්න බැරුව. ඒ අට්ටාලේ

උඩ හිටියා ඉන්ස්ට්‍රක්ටර් එක්ක තව අයියලා දෙන්නෙක් යුනිෆෝම් ඇදගත්තු අය. අපි පල්ලහැ.. මුලින්ම කරේ ඒ

එක අයියා කෙනෙක්ගේ අත් දෙක එකට තියල ගැට ගැහුවා.කකුලුත් එකට තියල ගැට ගහලා. අනිත් පැත්ත හැරෙව්වා.. ඊට පස්සේ ඉන්ස්ට්‍රක්ටර් පල්ලහැට ඇවිත් අපිට කියල දුන්නා අත් වලින් දැලක් වගේ හද ගන්න විදියක්.. උඩ ඉදන් පල්ලහැට එයාව තල්ලු කරනවලු යට ඉන්න අපි එයාව අල්ල ගන්න ඕනිලු. තිකම් හරි එහෙ මෙහෙ උනොත් ඒ ගැන කතා නොකර ඉමු අපේ එකා දෙන්නා ඒ විදියට උඩට යනව අත් කකුල් බැදල අනිත් පැත්ත හරවලා ඉන්ස්ට්‍රක්ටර් පොඩි තල්ලුවක් දෙනවා.. යට ඉන්න අය අල්ල ගන්නව.. කවුරුත් වැටුන් නැ ඉතින්. ගැල්ල්මයි ඒම හූ කියනව ඉතින්. කෝම හරි මගේ චාන්ස් එක හම්බුනාම ගැහි ගැහි උඩට ගිහින් අර විදියටම අත් කකුල් බැදල තල්ලු කරා තේද ආයේ මොකුත් නැ පපුව කීන් ගෑවෙනවා ඒකට නම්. කෝම හරි පල්ලහැ හිටිය අය අල්ල ගත්තා. අර නපුරා එහෙම පොඩි හිනාවක් වත් නැ ඒ මූණේ. හිරූ නම් බය උනත් වගේ වැටෙද්දි. කොම හරි ඔය දෙකම ඉවර වෙද්දි ලන්ච් ටයිම් එකත් පහු උනා.. පැයකින් විතර ලන්ච් එකත් අරගෙන අපිට දැනුම් දුන්නේ හොස්ටල් වලට ගිහින් රෙස්ට් කරල හවස ගිනිමැලයක් එක්ක සිංදු කියනව ඒකට සහභාගි වෙන්න කියල යි.

හවසත් ඒ කිව වෙලාවට අපි ගිනිමැලය හද හද හිටිය ග්‍රුවුන්ඩ් එක අසලට ගියත් තාම ඒක හදනවා කියල අපිට යැව්වේ මේන් හෝල් එකකට. එතනත් ටීම් වෙන් වෙන්න කිව්වා තැන් හතරකට වෙන් උනා.

" ළමයි ගිනිමැලයට කලින් ඔන්න පුංචි තරගයක් තියන්නයි සූදානම අපි බලමු කවුද මේ තරගෙන් දිනන ටීම් එක කියල.. මේකයි කරන්න තියෙන්නේ අපි ඔයාලට දෙනවා පත්තර

කඩදාසි සහ සෙලෝටේප්.. මේ අමුද්‍රව්‍ය දෙක විතරක් යොදා ගෙන ඔයාලා ඔයාලාගේ ටීම් එකේ ඉන්න ලස්සනම කපල් එකට ඇඳුම් නිර්මාණය කරන්න ඕනා.. ඒ කියන්නේ ඒ දෙන්නට කඩදාසි වලින් ඇඳුම් අන්දන්න ඕනා. අපි තෝරනවා ලස්සනම ඇඳුම මොකක්ද කියල වෙලාව හම්බෙනවා හරියටම පැයක්. ඔකේ දැන් පටන් ගන්න. "

ගත් කටටම කට්ටියම හූ කියකිය දැන් හොයනව අන්දන්න දෙන්නෙක්. හිතන්න එක විනාඩියක් නොතියා මොකෙක් හරි මාව තල්ලු කරේ මැද්දට.. ඒ වගේම අර නපුරාගේ යාලුවො වගේකුත් එයාව තල්ලු කරේ.. කට්ටියම හරි ඉක්මනට ඉක්මනට අපි දෙන්නගේවටේටම පත්තර කෑලි අලවන්න පටන් ගද්දි මොන ලැප්ජාවක් ද දෙයියනේ.. අත් දෙකත් උස්සන් එහෙට මෙහෙට කරකව කරකව කෝම හරි පැයක් යද්දි. මට ලස්සන ෆ්‍රොක් එකකුයි අරයට ලස්සන කෝට් කිට් එකක් වගේ එකකුයි හදවලා. මොනා උනත් ඇත්තටම හරිම දක්ශයෝ හරි නිර්මාණශීලි අය හිටියා ටීම් එකේ. කොහොම හරි වෙලාව ඉවර වෙද්දි කණ්ඩායම් හතරෙම කපල් හතර ලෑස්ති..

"ශා.. ඔය ඉන්නේ ළමයි ලස්සන ට.. දැන් එමුකෝ

sinhalaebooks.com

බලන්න කපල් ටික ඉස්සරහට. ඇඳුම් පේන්න පොඩි ෆැශන් ශෝ එකක් කරමු ඒනම්"

අනිත් කපල් තුනම අත් වලින් අල්ලන් නැලවි නැලවි ගියේ අඩියතියද්දි ඉරුනත් එක්ක සමහර කෑලි. කෝම හරි ඊලගට අපි දෙන්නා. බලන්නත් බයයි ඇයි තාම පුපුරනවනේ හේතුවක් දන්නෙත් නෑ. බිම බලාගෙන ඉද්දි හැමෝම ඉස්සරහා අත දිග් කරේ.. මමත් ලැජ්ජා වෙන්න බැරි තැන මගේ අතත් පටලවද්දි.. එකම හූවයි.. ජය මංගලම් ත් කියනව ශේප් එකේ අඩි තිබ්බා ඇඳුම් කෑලි ඉරෙන් නැති විදියට.. එක පාරටම දැම්මේ කපල් ඩාන්ස්

මියිසික් එකක්

"ෆැශන් ශෝ එකෙන් විතරක් තෝරන්න බෑ ලමයි.. ඩාන්ස් එක අනිවාර්යයෙන්.. ඩාන්ස් එකේදි ඉරුනොත් එහෙම වැඩක් නෑ නේ..මිනිත්තු 15 ක ඩාන්ස් එකක්.. ඕකේ නව් ස්ටාර්ට්"

කපල් ටික නටන්නත් ගත්තා. කරන්න දෙයක් නැති තැන ඒ මූණ දිහා බැලුවේ එක අතකින් අල්ලන් අනිත් අත ඉනෙන් තියද්දි..අයියා එක්ක වෙඩින් වලදි ඩාන්ස් කරල තියෙන හින්ද මමත් ඒ විදියටම ඩාන්ස් කරා. අමතක උනානේ කියන්න මට ඉන්නව අයියා කෙනෙක් මගේම අයියා තශේල් පාරින්ද්‍ර අධිකාරි. මට වැඩිය අවුරුදු 5 ක් වැඩිමල්. එයා ඔටෝමොබයිල් ෆීල්ඩ් එකේ තමයි ජොබ්

එක. මිනිත්තු තුන හතරක් ගත වෙද්දි අල්ලන් උන්නු ඒ අත් වල ග්‍රහණය වැඩි වෙනවත් එක්කම ඒ මූණ දිහා බැලුවේ. එක එල්ලෙම බලන් ඉන්නවා. එන්න එන්නම මගේ අත් ඉන හිර වෙද්දි..

"අනේ ඇයි කොනිත්තන්නේ... රිදෙනවානේ"

"කවුද ඒ කොල්ලා" කාටවත් නෑසෙන විදියට කනට කොඳුරන්නේ නැටුමත් නොනවත්තාමයි.

"කවුද"

"උදේ ඇවිත් නහය මිරිකුවේ"

"අනේ..රිදෙනවා නේ" ඒ ඇස් කේන්තියෙන්.. මගේ ඇස් වලට කඳුලු පිරුනේ ඒ තරමට රිදුනු නිසයි. එහෙම්මම බිම බලා ගත්තේ අනිත් අය කඳුලු දකී කියන බයට.

"මට කියපන් කවුද ඒ"

"හිරු..."

"කවුරු"

"හිරුන්.."

sinhalaebooks.com

"තමෙන් වැඩක් නෑ.. ඌ තමුසෙගේ කවුද?"

"ම...ගේ යාලුවෙක්.."

"බෝයිෆ්‍රෙන්ඩ් නෙමේද? "

"නෑ..."

"එහෙම එකෙක් ඉන්නවද? "

"අනේ නෑ ප්ලිස් අහාරින්නකො"

දූක හිතිලද කොහෙද ආයෙමත් අතෙනුයි ඉනෙනුයි රිදෙන් නැති විදියට අල්ලගත්තේ. ඇඟිලි වලින් හෙමිහිට අත ගාන ගමන්. තාමත් බිම බලාගෙනම උන්නු තාමත් ඇස් වල කඳුලු නිසයි.

"තයිශූ.."

මන් නෙමේ ඇහැක් ඇරලා බැලුවේ..

"කෝ..මගේ හා පැටියා බලන්න මන් දිහා.."

හා පැටියා මෙච්චර වෙලා රිද්දලා රිද්දල දැන් හා

පැටියලූ..බිම බලාගෙනම කුටු කුටු ගෑවේ ඇහෙන් නැති

වෙන්න. හැ මොන හා පැටියා කිව්වා.. මගේ හා පැටියා .. යකොව් එහෙම වෙන්නේ කොහොමද කියල බලන්නයි ඔලුව ඉස්සුවේ.. හිනා වෙනව නේද ඒ පාර..

"මගේ හා පැටියා නේද මිමි"

බලන් ඉද්දි ඇස් බෝල ගෙඩි උනේ.. මෙච්චර කාලෙකට මේ තරම් අඩුම්මි ගානේ මෙහෙම වචනෙකින් වත් අයියා එක්ක හැරෙන්න මම බෝයි කෙනෙක්ට ලන් වෙලා තිබුන් නෑ.

මිනිත්තු 15 ඉවර වෙලා ඩාන්ස් එක නැවත්තුවේ හැමෝගෙම හූ හඩවල් මැද්දේ..තවත් මිනිත්තු කීපයකින් ලස්සනම ඇදුම් ඇදන් උන්නු කපල් එක විදියට අපි දෙන්නව තේරුනේ සියුම් හිනාවක් මූණට එද්දි. ඊලගට අපි හැමෝවම යැව්වේ රෑ කෑම කන හෝල් එකට. ඉක්මනට කෑමත් කාලා අපි ගියේ ආයෙමත් ග්‍රවුන්ඩ් එකට. දෙයියනේ හරි ලස්සනයි. ලොකු ගිනිමැලයක්. මන් වගේ දෙගුණයක් විතර උස ලොකු ගිනිමැලයක්. කැමති තැනකින් බිමින් වාඩිවෙන්න කියල උපදෙස් ලැබුනයින් අපි වාඩි උනේ දුනියලව හොයන ගමන්.මොකද මේ වෙලාවේ වාඩි වෙන්න කිවේ ටීම් අනුව නෙමෙයි නොර්මල්. දුනීලා ත් අපි එක්කම වාඩි වෙනවත් එක්කම හිතන්න මොහොතක් වත් නොතියා අරයා ඇවිත් වාඩි උනේ එයාගේ යාලුවොත් එක්ක.

අපේ කෙම්ලෝ හෙන කසුකුසුව ඉතින්. ටිකක් වෙලා ගිහින් හැමෝම සිංදු කියනවා නටනවා.. පලවෙනි අත්දැකීම එහෙම දේක. ගෙදරින් පර්මිශන් ලැබුනෙම නෑ දවස තුනක් තියා අඩුම ගානේ එක දවසක්වත් ගෙදරින් පිට අම්මිලා නැතුව මන් ඉදල නෑ. අන්තිමට අයියව ශේප් කරගෙන තමයි මේ ගමන ආවෙ. එන්න එන්න රෑ වෙද්දි පින්නත්

එක්කම හරි සීතලයි. දුනිලා අත් දිග ටී ශර්ට් ඇදන් ආවත් මට ඒක එච්චර ගානක් නොවුනා. තවත් මිනිත්තු දෙකක් විතර ඉද්දි. හරි අමුතු පර්ෆියුම් සුවඳක් තියෙන ජර්සි එකක් උරහිස් මතට දැනුනේ මන් ගැස්සිලා ඒ රුව දිහා බලද්දි.මෙච්චර වෙලා එහා පැත්තෙන් ඉදගෙන හිටියත් මන් නෙමේ ඇහැක් ඇරලා බැලුවේ. ඒකටත් හරියන්න දැන් නම් ඇස් බෝල ගෙඩි වෙලා.

"සීතයි නේද හා පැටියෝ.."

මොකුත්ම නොකියා බලන් උන්නේ කියන්න වචනයක් වත් ආපු නැති තැනයි.

"ඔයා...ට සීතල නැද්ද.."

"ම්ම්.. නෑ.. මගේ හා පැටියා ඉන්නවනේ මන් ලග.."

ඒ වචන වලට කෙලත් ගිලෙද්දි. ලාවට හිනා උනේ හිනා නොවී බැරි තැනයි. එයාට නම් හොදටම හිනා. රෑ 11 ට

සියල්ල නිමා උනේ හැමෝම හොස්ටල් වලට යන්න් පිටත් වෙද්දි. ඉස්සල්ලා දැම්ම ජර්සි එක ගලවලා ආපහු දෙන්න ලෑස්ති වෙද්දිම.

"දැන් එපා.. පස්සේ ගමු.. හා පැටියෝ" ලස්සන හිනාවක් ඒ මූණේ. මොකුත්ම නොකියා ඇස් බෝල ගෙඩි කරන් බලන් උන්නේ.. හෙමිහිට ලන් වෙලා මගේ කම්මුලකට හරු පරිස්සමට චූටි හාදුවක් තවරද්දි. මුලු ගතම සීතල වෙලා යද්දි.

## 2 කොටස

පුළුවන් තරම් ඉක්මනට ආපහු හැරිලා ආවේ දූනිලත් ඒ ඔක්කොම බලන් ඉද්දියි. කතා නම් හෝ ගාල කියනවා. ඉක්මනට හොස්ටල් ඇවිත් ජර්සි එක ඉවත් කරේ, ඇත්තටම හරි සුවඳයි ඒ පර්ෆියුම් එක වශියක් ද මන්ද. ලස්සනට නවල අරන් තියද්දි දැක්කේ කවුද්‍ෙ මන් අඳුනන් නැති ගෑනු ලමයෙක් මන් දිහයි ජර්සි එක දිහයි බලලා රැව්වා රැවිල්ලක් ආයේ. දන් නෑ හේතුව මොකක්ද එයා කවුද කියන්න. වැඩි හිතන් නැතුව අර උදේ ඉදන් අතේ තියන් ඉන්න බිත්තර නිධානෙත් පැත්තක තියල අපි නින්දට වැටුනේ අපිටත් නොදැනිමයි.

පහුවදත් පාන්දර 5 වෙද්දි ආයෙම ග්‍රවුන්ඩ් එකට ගියේ ව්‍යායාම සඳහායි. අත් දිග ඇරල කකුල් ගසලා දල වැඩේට බහින්න හදද්දිම චකස් ගාල් බිත්තරේ කුඩු උනේ මගේ විතරක් නම් නෙමේ ළමයි 200 ගෙකම බිත්තර බර තොගයක් බිදිලා.

උදෙන්ම තිබ්බේ ඔන්න චූටි ගේම් එකක් ටීම් හතර පෝලිමකට තියල එකින් එකට දුන්නා වියතක් විතර පලල් පොඩි පොඩි ලී කැබලි 20 ක්. ඒ ලී තමා අපේ පාලම එතකොට අපි අඩිය තියන්න ඕනි ඒ ලී වලට විතරයි. ලී වලින් අහකට අඩිය තිබ්බොත් අවුට්. මොකද ඒ තියෙන්නේ ලාවා ඒකට කියන්නේ ලාවා ගේම්

ටීම් හතරෙම එකින් එකට ඉන්න ඕන වයසක කෙනෙක්, චූටි බබෙක් , ප්‍රෙග්නට් කෙනෙක් , වගේම ආබාධිත යෙක්.ඒ කියන්නේ ඒම හතර දෙනෙක්ව පාලමකින් ගෙනියන විදිය අපි කරල පෙන්නන්න ඕනි.ඉක්මනට මුලින්ම ඒ කට්ටියවමයි අනිත් අයයි එගොඩ වෙන අයයි දිනුම්. ඊට අමතරම ලී කෑලි 20නුත් 10 ක්ම සැරින් සැරේ එයාල අර ගන්නවා. ඒ හින්දු මුලින්ම අර කිව හතර දෙනාව එගොඩ කරල පස්සෙ තමයි අනිත් අය යන්නේ. මොකද ලී කෑලි 20 , 10 වෙනව කියන්න්නේ හෙන දුරට අඩි තියන්න ඕනිනේ.

කෝම හරි ඔන්න එක කොම්ලෙක්ව අල්ලගෙන කට්ටිය ගිහින් දැම්මා උන්දෑ තමා වයසක සීයා කෙනෙක් වගේ

රගපෑවේ.. එයාවත් වාරු කරගෙන වගේ ගිහින් දැම්මා. ඊලගට ප්‍රෙග්නට් අම්මා කෙනෙක් වගේ රගපාල ගෑල්ලමයෙක්වත් ගීන් දැම්මා. ඊලගට ආබාධිතයෙක්

විදියට රෝද පුටුවක යන එක්කෙනෙක් වගේ තව පිරිමි ලමයෙකුත් ගිහින් දැම්මා. අන්තිමට බබා දැන් . දැන් හොයපල්ලකෝ බබෙක්ව. හිතන්න තත්පරයක් වත් නොතියා අර බිම් බස්සා ගත්තා නේද බබෙක්ව වගේ මාව හරහට කට්ටියට හික් ගෑවුනා. හරහට අරගෙන තියන තියන අඩියක් ගානේ මූණ දිහා බලන් හිනා වෙනවා ලැජ්ජාවේ බෑ

"හා පැටියෝ.."

මොකුත්ම නොකියා බලන් උන්නේ මොනා කියන්න ද කියල හිතා ගන්න බැරුවයි

"බර නෑ නේ චුට්ටක් වත්, කෑම කන් නැද්ද මිම්"

"දැන් ඔයා මාව උස්ස ගත්තේ බර බලන්නද"

"ආහ් ආහ්..කටකුත් තියෙනව එහෙනම්. මොකද සද්දේ ආ ගහනවා උස්සලා පොලේ වැඩිය කියවන් ආවොත්."

"ඉතින් උස්සන් නේ ඉන්නේ ගහන්නකෝ බලන්න පොලේ"

"ආ එහෙමද තෝනා" කියන ගමන් මූණට නැඹුරු උනේ.. මන් ඇස් තදින් පියාගද්දි

"ඇස් අරිනවා මෙතන කිස් කරන්න නෙමෙව් හැදුවේ කෝමත්"

මෑන් ව ශුවර් නැති හින්දම එක ඇහැක් විතරක් ඇරල බැලුවේ ඒ වෙද්දි ඇවිත් අපි. එහෙම්ම පරිස්සමට බිමින් තියලා එයා ආයෙම ගියේ අනිත් කට්ටියවත් එක්කන් එන්න.කෝම හරි ඒ ගේම් එකත් දින්නේ අපි. ඊලගට

ඉන්ස්ට්‍රක්ටර් අපිව එක්කන් ගියේ අර උඩ කේබල් වලින් යන්න තියෙන්නේ මීටර් අටසීයක නමසීයක වගේ දුරක් තමයි එහෙම යන්න තියෙන්නේ.. ඉතින් ඔය හැම ක්‍රියාකාරකමක් ම කරේ වැටෙන් නැති වෙන්න ඔක්කොම සේෆ්ටි බෙල්ට් වලින් සේෆ්ටි කිට් එකක් ඇදගෙන තමයි.මට නම් ඒ කේබල් වල යන එක තමයී තිබ්බ හොදම ඇක්ටිවිටි එක. ඒකේ යද්දි තමන්ගේ නමයි කොහේ ඉදන්ද ආවේ කියලයි කෑ ගහල කියන්න ඕනා.. එහෙම තමයි එයාලා උපදෙස් දෙන්නේ දෙයියනේ ඒ උනාට උඩට නැග්ගම තමන්ගේ නමත් අමතක වෙනවා කෑ ගහන්න තියා. පිරිමි ලමයින්ට නම් ගානක් වත් නෑ.ගෑල්ලමයි නම් වැලපෙනවා.අපේ ඈන් එහෙම අඩපු නැති ටික විතරයි

ලන්ච් ටයිම් එකෙත් වෙනදා වගේම කෑම කාලා අපිට

උපදෙස් ලැබුන විදියට ආයෙම ග්‍රවුන්ඩ් එකට ආවා.

"ඔකේ ලමයි. ටිකක් ෆ්‍රී එකේ ඉන්න. ටීම් ඒකේ අයව අඳුනගන්න. අදට ඇක්ටිවිටිස් ඉවරයි. හවස ප්ලෑන් එක ගඟ ලගට ගිහින් සිංදුවක් දෙකක් කියල පොඩි ෆන් එකක් ගන්න එක. ඒකට බඩු හාහිරාදිය තාම ලෑස්ති කරනවා.. එතකම් ග්‍රවුන්ඩ් එකේ ඉන්න නිදහසේ ඉන්න..ආහ් ගොඩක් අය ඉල්ලනවා මොබයිල් ෆෝන් ස් ගේන්නද සර් ගේන්නද සර් කියල. උබලගෙනුත් පුදුම වදයක් තියෙන්නේ. ඔන්න ගේන්න පර්මිශන් දෙනවා. ඔන්න එහෙම පුළුවන් ඇක්ටිවිටීස් නොවෙන තැන් වල විතරයි. ඕකේ."

කට්ටිය හූ කිවේ දැනුන සතුටටයි. ඔක්කොම වගෙ දිව්වේ හොස්ටල් වලට ෆෝන්ස් අරන් එන්නයි. ග්‍රවුන්ඩ් එකේ අයින දිගට ගානට වවලා තිබ්බ තණ කොළ උඩ හැමෝම වටෙටම වාඩිවෙලා තැනින් තැන. මටත් නොදැනීම මන් හෙව්වේ අර නපුරගේ රුව. ඒත් නෑ පේන්න. මන්

හිතන්නේ අපෙ ඉන්ස්ට්‍රක්ටර් එක්ක යන්න ඇති. මොකද මේ දවස් දෙකට එයාල ඉන්ස්ට්‍රක්ටර් සර් එක්ක ඉන්නේ තිකම් යාලුවෝ වගේ.. ඒ තරමට ෆිට් වෙලා..ටික වෙලාවකින් එක පාරට මගෙන් එහා පැත්තෙන් වාඩි උනේ හිරු. ඒ මූණ ටිකක් අමුතුයි.

"හිරු අසනීපෙන්ද"

"ම්ම් නෑ ඇයි"

"ම්ම් නෑ මූණ තඩිස්සි වෙලා වගේනේ.."

ඇසිල්ලකින් හිතන්න තත්පරයක් වත් නොතියා හිරූ තදින් මාව වැලඳගත්තේ ඉදන් උන්නුම ඉරියව්වෙන්. වැඩිය කාගෙවත් අවධානේ අපේ පැත්තට නොතිබ්බ එකම හොදට ගියා. එක විනාඩියක් වත් ඒ විදියට නොඉද ඉක්මනට ඒ ගතින් මෑත් උනේ, ඊයේ නහය මිරිකපු එක දැකලා අච්චර නාඩගමක් නැටුව එකේ අද මේක දැක්කොත් එහෙම මොනවා කරයිද කියල ඇති උන බයටයි. ඒ විනාඩියට ඇත්තටම මාව ගැහෙන්න ගත්තේ අර කියන්නා වගේ හාවෙක් වගේම තමා.

"හිරු ඇයි මේ"

"පාරු..මන් ආදරේ කරනවා කියල හොදටම දැන දැනත් ඇයි මෙහෙම කරන්නේ."

උදූ වෙන්නම එපා කියල පතපු මොහොතක් උදූ උනේ මටත් නොදැනිමයි. කියාගන්න වචන නැති තැන මොනා උනත් වචනෙකින් වත් කාහෙවත් හිතක් රිද්දන්න හිත නැවු නැති තැන සද්දේ නැතුව හිටියේ විශේෂයෙන්ම ඒ මගේ

හොදම යාලුවා හින්ද වගේම එයා හිතේ තියන් ඉන් නැතුව ප්‍රෙශර් එක පිට කරන එක එයාටත් සැනසීමක් හින්දයි.

"හිරූ"

"ශ් පාරූ..ඔයා කතා කරන්න එපා. ප්ලිස් මන් කියන ටික අහ ගන්න"

"හ්ම්ම්"

"මැතික මන් උඹට ආදරේ කරේ උඹව දැක්ක දවසේ ඉදන් මයි. අයි මීන් චූටි කාලේ ඉදන්මයි. අවුරුදු ගානක් එක දිගට ඔයා මාත් එක්ක එකට හැදුනේ. මට සමාවෙයන් මන් වැරැද්දක් කරා නම්, ඒත් උඹට හිතා ගන්නවත් බැරි තරමට මන් උඹට ආදරේ කරා, කරනවා ඉස්සරහටත් කරයි. ආදරේ කියන්නේ මොකක්ද කියල නොතේරෙ වයසේ ඉදන්ම, ආදරේ කියන්නේ මොකක්ද කියල තේරුම් ගන්න පුළුවන් මේ කාලේ වෙනකම්ම. අවුරුදු ගානක් තිස්සේ උඹ හිනා වෙද්දි උඹට වැඩිට මම සතුටු උනා. උඹ අඩද්දි උඹට වැඩිය මට රිදුනා. අම්මා අක්කාගෙන් පස්සේ මගේ ජීවිතේ ළඟට හිටියේ ඔයා මැතික.ඒත් ඔයාගේ හිතේ එහෙම කිසිම දෙයක් තිබ්බේ නැ කියන්න මන් දන්නවා ම්ම්. සමහර විට මේ කැම්ප් එක වෙන්නැති අපිත් හම්බෙන අන්තිම දවස. මෙතනින් එහාට අපි කොහේ කොහේ නවතීද ඉදීද මොනා කරයිද කියන්න අපිවත් දන්

නෑ. කොහේ හිටියත් මොනවා කරත් පරිස්සමින් මැතික. ඕනිම වෙලාවක ඕනිම තැනකදී ඕනි දේකට මන් ඉන්නවා ඔයත් එක්ක මිමී. හොයන් එන්න චූටී කාලේ වගේම "අනේ හිරූ..." කියන්. කෝ දැන් හිනා වෙන්න පිස්සි. මේ ටික කියල මගේ වෙන්න කියල ඉල්ලුවා නෙමෙයි මෝඩ් මන්. ඉන්න තැනක ඔයා ඉන්නේ සතුටින් ඉන්නයි ඕනි.දැන් හිනා වෙනා පිස්සි."

"හිනා වෙන්නකෝ මිමී"

"අපූරුවට හිටිය කෙල්ලගේ ඔලුවට නිකම් බරක් පැටෙව්ව නේද මන්"

"අනේ නෑ හිරූ"

"අයිම් සොරි පාරු"

"අනේ සොරි කියන්න ඕනි නෑ හිරූ මමනේ සොරි කියන්න ඕනි"

"ඒ ඇයි"

"ඔයාව තාමත් හොදම යාලුවෙක් විදියට දකින එකට"

"අම්මෝ පැහිච්ච ආච්චි. තේරෙන් නෑ තාම පිස්සිට පැහිච්ච කතා කියන්න. ඔය මොකුත් හිතන් නැතුව හිනා වෙන්න. කරන හැම දෙයක්ම පරිස්සමින් හොදද" කියල ලස්සන ට හිනා වෙලා ඔළුව අතගෑවේ මමත් ලස්සනට හිනා වෙද්දි. ඒත් එක්කම වගේ පිටිපස්සෙන් ආවේ නපුරා. දෙයියනේ අදත් මොකක් වෙයිද කියල එකසිය ගානට මාව ගැහෙන්න ගත්තේ මන් හිරුගේ පිටිපස්සට වෙද්දි. ඒත් ටිකකින් ඒ දෙන්නට දෙන්නා පිටට තට්ටුවක් දලා හිනා උනේ මගේ ඇස් උඩ යද්දි. මට කතා කරන්න් කලින් හිරු එයා එක්ක කතා කරල තියෙනව කියල හිතුනේ මට එවෙලෙයි.

ටික වෙලාවකින් අපිට උපදෙස් ලැබුනේ ගඟ ලගට යාමටයි. ඉන්ස්ට්‍රක්ටර් කෙනෙක් පස්සෙන් අපිත් ගියේ දෙයියනේ පුදුම තරම් ලස්සනක්. කැමති තැනකින් ඉද ගන්න කිව්වයින් හැමෝවම පේන්න ඕනි හින්ද අපි කට්ටිය ඉද ගත්තේ ටිකක් උස ගල් දෙකක් උඩින්. කට්ටිය සිංදු කියනවා.. එතන සැන්ච්චි බාබකියු හදලා ශෝයි ඉතින්. ඊට පස්සේ හැමෝටම එන්න කිවේ මැද්දට ඩාන්ස් කරන්නයි. අපිත් යන්න නැගිට්ටේ ඩාන්ස් කරන්නයි ඒත් ගලෙන් බිමට බහින්න හදද්දිම ගල උඩ හිටපු කවුරු හරි දන් උන්නු ශූස් එකකට මගේ අත පෑගුනේ ආහ් කියල අත ගද්දි. කාගේ ශූ එකටද පෑගුනේ බලන්න ආයෙම හැරෙද්දි දැක්කේ අර ගර්ල්. එදා හොස්ටල් එක ඇතුලේ අරයාගේ ජර්සි එක දිහයි මන් දිහයි බලලා කේන්තියෙන් ගිය ගර්ල් . හිතන්න තත්පරයක් වත් නොතියා මාව

තල්ලු උනේ. කන්ට්‍රෝල් නැතුව ගල මතින් බිමට වැටෙද්දි. තත්පර ගානක් ඇතුලත ඔක්කොම වට උනේ. ලේඩි ඉන්ස්ට්‍රක්ටර් කෙනෙක් ඇවිත් මාව නැගිට්ට වන්න හදද්දි. රිදෙන්නේ පැගුනු අතයි. එක කකුලකුයි. රිදෙන තරමට ඇස් වලින් කඳුලු වැටෙන්නේ ඉවසා ගන්න බැරි තැනයි

"පුතේ නැගිටින්න පුළුවන් ද"

බැ කියල ඔලුව වැනුවේ කඳුලින්මයි.

"සර් හොස්පිට්ල් අරන් යන්න වෙයි නේද" කියන ගමන් ඒ මැඩම් නැගිට්ටේ ඉන්ස්ට්‍රක්ටර් සර් කෙනෙක් එක්ක වාහනයක් ගේන්න කෝල් කරමින්

"තයිශූ මගේ රත්තරන්..මොකද මැනික මේ උනේ.."

කිසිත් නොකියා ඔලුව වැනුවේ දන් නැ කියන්නයි.

"රකීත්, ගමු කෙල්ලව..වෑන් එක මග එනවලු.. කෝකටත් හොදයි ස්කෑන් එකක් කරගමු. මාධවි මිස් මිසුත් එන්නකෝ මේ තව ගෑනු ළමයෙක් එක්ක. "

ගත් කටටම හරි පරිස්සමට මාව හරහට ගත්තේ, මාධවී මැඩම් එක්ක දුනිත් පස්සෙන් එද්දි. මිනිත්තු 15 කින් විතර අපි ආවේ හොස්පිට්ල් එකට. කකුලේ X-Ray එකකුත් ගත්තා. විලුඹ ලගින් චුට් ඩැමේජ් එකක් තියේ

කිව්වා. ලොකු අවුලක් නෑ ලු. බැන්ඩේජ් එකක් දාන්න ඕනි කියල චුට්ටක් තියා ගත්තා.

"සර් මෙයාගේ ගෙදර ට කියන්න වෙයි නේද විස්තරේ"

"ඔව් මිස් මාත් මේ කියන්න ගියේ. දැනුම් දෙන එක හොඳයිනේ"

" දෙන්නකෝ පුතේ ගෙදර අම්මිගේ හරි තාත්තිගේ හරි මොබයිල් නම්බර් එක"

"මොකෝ ද්‍රෝණී බය වෙලාද ඉන්නේ"

"නෑ මැඩම්, ගෙදර ට කිව්වොත් එයාලා බය වෙලා දැන්ම එයිනේ මෙහේ

"ඔව්..ඉතින්?"

"ඉතින් එතකොට අප්පච්චිලා මාව අදම ගෙදර එක්කන් යනවනේ"

සර් එක්කම මැඩම් හොඳට හිනා වෙනවා

"ඒත් පුතේ දැන් නොකියා ඉඳලා බැන්ඩේජ් එක පිටින් ගෙදර ගියාම අපිට නේ බනින්නේ මිමි"

"අනේ ප්ලීස් මැඩම් මගේ අප්පච්චි ඒම නෑ. ගෙදර ගීත් චූටි දෙයක් උනේ කියන්නම්. අනේ අනේ යවන්නෙපා මාව ගෙදර මන් අයියට කියන්න ම් එහෙනම් අප්පච්චි ලට නම් බෑ"

"බලන්නකෝ සර් තියෙන හුරතලේ.. සර්ගේ දේණිව මතක් උනේ මට නම්. එයත් කරන්නෙම මේම වැඩනේ."

"මටත් මේ හිතා ගියේ ඒක තමා මිස් මාධවී. නුවී ගේ කපාපු පලුව. හරි හරි දේණි ඒනම් අයියට කෝල් එකක් දෙන්නකෝ. අපි එලියෙන් ඉන්නම් යාලුවෝ දෙන්නා ඉන්නවනේ. අද රෑ ඉන්න කියයිද දන්නෙත් නෑ මෙහේ. බලමුකෝ "

"යේ.... හා සර්"

සර් එක්ක මැඩම් එලියට යද්දිම මේ වෙනකම් ඔක්කොම කට පියන් බලන් උන්නු අර රාස්සයා එලියට ආවේ මාව කන්න තරම් තරහකින් මන් දිහා බලාගෙන.

"මොනාද තමුසේ මේ කර ගන්නේ. උඩ බලාගෙනද අඩි තියන්නේ. පුළුවන් දිහාක ඉන් නැතුව නගින්න යනව උඩ. බලනව දැන් ඉතින් ප්ලාස්ටර් දන් ඉන්නව. රිදෙනවා නේද. ආහ්. මමත් පල්ලහැ ඉදන් බලන් හිටියේ තියෙන දැගලිල්ල. ඒකට වැටිලා බේරුන එක තමා පුදුමේ.."

sinhalaebooks.com

"බලන්න එපා මන් දිහා ඔය විදියට "

"කිව්වා එක පාරක් "

"අම්මෝහ් හරි හරි ඔන්න. දැන් වෙලා ඉවරයි නේ"

"කපටියා"

"රිදෙනවා නේද පැංචි"

"හුම්"

කතාවට ඩිස්ටර්බ් කරේ දූනියා

"පාරු.. අයියට කෝල් කරල කියාම් බම් ඉන්න හම්බෙන් නෑ නැත්නම්"

"හුම්ගමු ගමු ඉන්නකෝ"

"මොන පාරුද"

"අයියෝ අයියේ. ඔයා මෙයාට කියන්නේ තයිශූ උනාට අපි කියන්නේ පාරු කියල හාද "

"එතකොට මොකක්ද මෙයාගේ සම්පූර්ණ නම"

"තයිශූ පාරින්ද්‍යා අධිකාරි"

"වාව්"

"ඊයා ඔහොම පැනි පෙරන්න එපා හලෝ"

"කාද යකොව් පැනි පෙරුවේ. මේ දැන් කාලේ හැදෙන කෙල්ලෝ නම් අනේ මන්ද "

" මේ ඔයාල දෙන්නා පස්සේ රණ්ඩු වෙනවද මට මගේ අයියට කෝල් එකක් ගන්න ඕනා"

"ගන්නව ඉතින් මටත් හම්බවෙන්න ඕනා අයියව"

"මගේ අයියව ඒම හම්බෙන්න බැ හරිද. ඒකට විශේශ අවසරයක් තියෙන්න ඕනා. මේ ඉන්නේ බලන්න එයාගේ හැම්සම් ලුක් එක ඔයා වගේ නටි ලූස් නැ හම්"

"බැන්ඩේජ් එක ගහන්න ඕනා කකුලට තෙමේ කටට. හොද වෙලා එන්නකෝ බබා ඔයා. කෝ බලන්න ඔය මහ ලොකු අයියව පෙන්නනවා"

"මේ ඉන්නේ..."

"ඔහ් ගෝඩ්.."

"මොකද"

"මේ තශේල් නේද..තශේල් පාරින්ද්‍ර..විද්‍යානන්දේ ප්‍රින්සිපල් සර් ගෙයි ආනන්දි මැඩම්ගෙයි පුතා"

"හැ..ඔයා කොහොමද අපේ අයියව දන්නේ.."

දූතියයි මායි මූණට මූණ බලා ගත්තේ මේ මොකෑ වෙන්නේ බලාගෙනයි

"අපි ක්ලාස් මේට්ස් ලා දෙයියනේ. මේ යකා අබ්‍රෝඩ් උනානේද. මේ ලගදිනේ ආවේ"

"ඔව් තාම මාසයක් නෑ"

"මේ බලනවා මගේ කෝල් හිස්ට්‍රිය"

ඉක්මනට අරගෙන එයාගේ ෆෝන් එකේ තිබ්බ කෝල් හිස්ට්‍රිය පෙන්නුවේ ශේල් ශේල් ශේල් ශේල් වැඩි හරියක්ම කෝල් අරන් තියෙන්නේ අපේ අයියගේ නම්බර් එකට.

sinhalaebooks.com

"ඔයාලා අඳුරනවද"

"මෝඩ්. අයියලා මට කියන්නේ රිකී කියල.. මන් මේ යකාට කිව්වා කැම්පින් යමන් ගගා. කොහෙද ආවේ නෑ. ටූ වීක්ස් දෙන්න කිව්වා මොකක්ද වැඩ වගයක් තියේ කියල. ඊට පස්සේ සෙට් වෙමු කිව්වා. මේකා ආවත් හරි දැක්කෙවත් නෑ තාම..කොච්චර වද දුන්නද මූට මන් එමු කියල. අන්තිමට බැරිම තැනයි අපි ආවේ..දෙයියනේ එතකොට මේ ඒ දවස් වල ජංගි කොටේ ඇඳන් දුව දුව හිටපු කෙල්ලද මෙච්චර ලොකු වෙලා තියෙන්නේ"

"එතකොට ඔයාද අප්පා මේ රිකී රිකී කියන්නේ.. අපේ අයියගේ කටේම තියෙන්නේ ඔය නම විතරයි ආපු මාසෙම. මන් දන්නවද අනේ ඒ ඔයා කියල ලැජ්ජාවේ බෑ"

"හම්මෝ. දැන් ගන්නවකෝ බලන්න ඔය අයියට කෝල් එක. හොට්ටි ස්පීකර් දානවා"

"ඇයි මේ අපහාස"

"සුදූ"

"අයියා"

"මොකද මේ වෙලාවේ"

"අයියා.. මේ පොඩි දෙයක් කියන්න ගත්තේ.ඔන්න කෑ ගහන්න එපා මෙතන හෙනට කට්ටිය ඉන්නව ස්පීකර් දල තියෙන්නේ "

"මොකක්ද තමුසේ කරපු කුපාඩි වැඩේ ආහ්"

"අනේ අයියා ස්පීකර් හලෝ"

"හා කියනවකෝ කියනවකෝ"

"මේ මාව වැටුනනේ හලෝ"

"මොකක්... ඒ මොනා කරන්න ගිහින්ද"

"බැලන්ස් නැතුව ගිහින්"

"බැල්න්ස් නැතුව ගිහින් සුදු මේ මොකද උනේ කියනව ඉක්මනට. දැන් මොකද කොහෙද තුවාල උනේ. තමුසේ කොහෙද ඉන්නේ කෑම්ප් එකේ ද "

"නෑ අයියා මන් හොස්පිට්ල් ඉන්නේ"

"දෙයියනේ සුදු මොනාද ඕයි ඔය කරගන්නේ. ඉන්නව අපි දැන්ම එනව ඔහේ"

"අනේ කෑ ගහන්න එපා අයියා අහන්නකෝ චුට්ටක්.මට අවුලක් නෑ කකුල පොඩ්ඩක් උලුක් වෙලා බැන්ඩේජ් එකක් දැම්මම හරි කිව්වා"

"සුදූ...ඔයා මාව කේන්ති අවුස්සනවා.දැන් කවුද ඉන්නේ ලග හිරුන් ඉන්නවද? දෙනව ෆෝන් එක ඉන්න එකෙක්ට"

"හිරූ නම් නෑ ඒ උනාට මේ බලන්නකෝ ඔයා අදුරන කෙනෙක් ඉන්නවා"

"සුදූ ඔය එක එක ඇටකිච්චියොන්ට දීලා මගේ තරහ තවත් වැඩි කරන්න එපා"

"නෑ නෑ අනේ කතා කරන්නකෝ"

ෆෝන් එක අරයට දුන්නේ කතා කරන්න කියල. හිනා වෙලා හිටියට රිදෙනවා ඒත් එක්කම වගේ නර්ස් කෙනෙක් ඇවිත් කකුල බැන්ඩේජ් කරේ අරයා ෆෝන් එකත් අරන් එලියට යද්දි කෑ ගහන්න බැරි කමට දිව හපාගෙන හිටියා ඉවසන්

"හල්ලෝ මේ මම"

"රිකී උඹ. උඹ කොහොමද යකෝ. වෙයිට් වට්. උඹ මෙච්චර දවසක් මේ කැම්පින් යමු කැම්පින් යමු කිවේ ඔහෙද හල්ලෝ"

"හම්මේ ඔව් ඔව් බම්.."

"ඒත් සුද්දි කොහොමද උඹව අඳුරන්නේ"

"මේ මෝඩි මේ ගලකින් බහින්න ගිහින් පතබෑවා අන්තිමට ඉන්ස්ට්‍රක්ටර් කෙනෙකුයි මායි උස්සන් ආවා ලේඩි ඉන්ස්ට්‍රක්ටර් කෙනෙකුයි මේ මෝඩි වගේම නට් ලූස් කෙල්ලෙකුයි එක්ක හොස්පිටල්. වැඩි කේස් එකක් නෑ උලුක්කුවක් වගේ තියෙන්නේ.බැන්ඩේජ් එක දැම්මම හරි කිවා. ගෙදර ට දැනුම් දෙන්න නම්බර් එකක් ඉල්ලුවම දෙන්න බෑ කියල නාහෙන් ඇඬුවා ගෙදර ට කිවොත් ඇවිත් එක්කන් යයි ඕනි නම් මන් අයියට කියන්නම් ගගා. ඊට පස්සේ කියෝ කියෝ ඉදලා කෝල් එක ගන්න යද්දි. මට කියනව. ඔයා වගේ නට් ලූස් නෑ ලූ මේ ඉන්නේ මගේ අයියලූ ගගා උඹේ ෆොටෝ එකක් එතකොටයි දැන ගත්තෙ හල්ලෝ"

"මාර සිද්දිනේ වෙන්නේ ඩෝ. මේ ඒක නෙමේ සුද්දිට අමාරු නෑ නේ ද බන්. ඔය මගේ පණ ටික කියන්න දන්නවනේ උඹ."

"මන් උඹට බොරු කියනවද බන්. "

"හරි හරි මන් දැන්ම එන්නම් එහෙනම් මෙයාව ගන්න"

sinhalaebooks.com

"දැන් එන්නෙපා. ආනන්දි මැඩම් දැන ගත්තොත් දන්න්න්වනේ."

"අම්මද"

"ඔව් ඔව් මෙතන දෙකක් කරල එක්කන් යයි කෙල්ලව. පෞ බම් හෙන ආසාවෙන් එන්ජෝයි කරනව. උඹ හෙට උදෙන්ම වරෙම්. කොහොමත් හෙට හවස් වෙද්දි මෙහේ වැඩ ඉවරයි නේ."

"උඹ තාමත් අපේ අම්මට බයයිද බම්"

"බය නැද්ද බම්. මේ බලන්නකෝ ආනන්ද මේ දැන් හැදෙන ලමයි නම් කියල පටන් ගති ආයේ බණ පරාදයි"

"වරෙන්කෝ ගෙදර ඕක නම් කියනව. හා හා මේ එහෙනම් මන් හෙට උදෙන්ම එන්නම්. අනේ මන් එනකම් මගේ පණ ටික බලාගනිම් එහෙනම් ඇ.මන් දන්න්න්ව නරියට කුකුල්ලු භාර දුන්නා වගෙ තමා කියල ඒ උනාට කමක් නෑ. මන් එනකම් බලා ගනිම් ඇහැක් වගේ. ඕකට හොදටම විසේ."

"බිය නොවියන් මස්සිනේ"

"ශික් මට තේරුනා ගොනා හැරෙන්නේ පොල් පැලේ කන්න තමා කියල ඉදපන්කෝ ඉදපන්කෝ මන් එනකම් ඔතන

sinhalaebooks.com

වෙන්නේ මොකද බලන්න"

කෝල් එක ඉවර වෙලා මෙයා එද්දි බැන්ඩේජ් එක දලා ඉවරයි. හොස්පිටල් ඇඩ්මිට් වෙන්න ඕනි වෙන් නෑ කියල ආයෙම අපි ආවේ කෑම්ප් එකට. රිදුනත් ඇවිදගන්න පුළුවන්

උන හින්ද එච්චර අවුලක් උනේ නෑ.අපි එද්දි ඉතිම් සිංදු කියල ඉවරයි කට්ටිය ගීන් හොස්ටල් වලට. මාවත් හොස්ටල් එක ලගට එක්කන් යන ගමන් ඉන්ස්ට්‍රක්ටර්ස් ලාත් එක්ක

"සුද්දී.."

"ම්ම්"

"අයියා හෙට උදෙන්ම එනවා කිව්වා හොඳද."

"උදෙන්ම එක්කන් යනව කිව්වද මාව"

" නෑ නෑ පිස්සි. අපි අයියව තියා ගමු හවස් වෙනකම්ම ඕකෙ.හැපී??"

"යේ....හැපී"

හෙමිහිට දෙතොල් ලන් කලේ නළලට උනුසුම් කෙටි

හාදුවක් දෙමින්. කරුමේ කියන්නේ ඒක දැක්කේ ඉන්ස්ට්‍රක්ටර් සර්

"ඈ කොල්ලෝ"

"ඕ සර්"

"කෙල්ල උඹේ බූදලේද"

"සර්ට වෙඩිම කියන්නම්කෝ. මේ මගේ හොඳම යාලුවගේ නංගි මාත් දන්නේ දැන්"

"හොඳම යාලුවා දන්නවද බන් දැන් නංගිව අරගන තමා මේ කොකා පාන්නේ කියල "

"කෝල් එකේදි තේරුනා මන් හිතන්නේ සර්.."

"අපේ කාලේ ඕම තිබ්බේ නෑ නේද මාධවී මිස්. උබල දෙන්නගේ වෙලාවට මෙතන අපි දෙන්නා හිටියේ. ඉරුගල්බණ්ඩාර සර් එහෙම හිටියා නම් දෙන්නව මීටර් 16 පරතරයෙන් යවන්නේ "

කතාවෙන් කතාව මාව හොස්ටල් එකෙනුත් දලා එයාලා ගියේ හොස්පිටිල් එකෙන් දුන්නු පේන් කිලර්ස් වලට මටත් නොදැනිම මට නින්ද යද්දි. උදේ ඇහැරෙද්දි හොස්ටල් එකේ එකෙක්වත් නෑ අප්පට සිරි වෙලාව උදේ අටයි. කෑම

ටයිම් එක. කොමත් කකුල උස්සත් එක්සයිස් කරන්න බෑ නේ. නැගිට්ටින්න හදද්දිම වගේ දූනීලා ආවේ.

" අන්න අන්න ලස්සන කෑල්ලක් බැහැල කියල අර කෙල්ලො උඹේ අයියට ඉන්න දෙන් නෑ ගිහින් බලාම් පාරු"

"අනේ පෞ මගේ අයියා කොච්චා "

ඉක්මනට දූනීලගේ උදව්වෙන් ලෑස්ති වෙලා මාත් ගියේ ග්‍රවුන්ඩ් එකට. අප්පා යාලුවෝ සෙට් එක සෙට් වෙලා ඉතින් . ඇත තියල මාව දැක්ක ගමන් අයියා ඇවිත් දූනීගේන් අරගෙන මාව වාරු කර ගත්තේ. අයියා ඒම තමයි මට චුටි දෙයක් උනත් මහා ලොකුවට බය වෙනවා. අයියගේ පණ ඉතින් මන්.

"අමාරුවක් නෑ නේද මගේ සුද්දි"

"චුට්ටක් රිදේ අයියා ගානක් නෑ "

උදේ කෑමෙන් පස්සෙ අපිට තිබ්බේ අන්තිම ඇක්ටිවිටි එක බෝට් රයිඩින්. අනේ ඉතින් කකුල හින්ද ඒ චාන්ස් එක මට නැති උනා. ඇඩෙන්න ඔන්න මෙන්න තියල බලන් ඉද්දි,

"මන් සුද්දිට ඇති වෙනකම් බෝට් රයිඩින් කරන්න

එක්කත් යනවා කකුල හොද උන ගමන්. හොඳද..ඔන්න ප්‍රොමිස්. "

"ඇත්තමද අයියා"

"ඇත්තමයි මගේ රත්තරන්."

මම් නොගිය හින්දම මට දුක හිතෙයි කියල අයියයි අරයයි දෙන්නම නොගිහින් හිටියා. ඇත්තටම ඒ දෙන්නා විතරක් නෙමේ. හිරුත් ගියේ නෑ. ඒ පැය කීපයත් ඒ විදියට ඉවර වෙලා ලන්ච් එකෙන් පස්සේ අන්තිමට උදා උනේ සර්ටිෆිකේට්ස් ලබා දීම සහ විසිර යාමයි. හරී දුකයි ඉතින් දවස් තුනක් මෙච්චර ඉක්මනට ගෙවුනා කිව්වම. අදුරන් නැති ගොඩාක් යාලුවෝ හම්බුනා ඇත්තටම මේ දවස් තුනට. අන්තිම කතාවෙදි ආයෙමත් සැරයක් ඉන්ස්ට්‍රක්ටර් සර්ගේ කතාවෙදි ඇහුවා. දැනුත් ටීම් මාරු කරන්න කැමති කවුරු හරි ඉන්නවද කියල. ඇත්තටම එදා නැගිටපු එක්කෙනෙක් වත් හිටියේ නෑ අද වෙද්දි. ඒ තරම් එකමුතු වෙලා හැමෝම. ඒත් තාමත් මන් මගෙන්ම අහන ප්‍රශ්නයක් කාටවත් නොකියපු කවුද අර ගර්ල්. ඇයි මට එහෙම කරේ කියල යි.

# 3 කොටස

ඊළගට උදා වෙලා තිබුනේ දිනපු ටීම් එක කියන එක. ඔව් තිබ්බ ඇක්ටිවිටිස් වලින් තරග වලින් ලකුනු වැඩියෙන්ම අරන් තිබ්බේ අපි. ඒත් විනාඩියක් විතර අපි ඒම සතුටු වෙද්දි බිත්තර නිධාන වල ලකුනු එකතු කරේ එවෙලෙයි. කියන්න සන්තෝසයි බිත්තර වැඩියෙන්ම කුඩු කරන් තිබ්බේ අපේ ටීම් එක. එක බිත්තරයකට 100 ගානේ අනිත් හැම ටීම් එකකටම ලකුනු එකතු වෙද්දි අඩුම බිත්තර එකතුව ලෙස අපි බැස්සේ හතර වෙනි ස්ථානයට. ඒකෙනුත් මොකක්දෝ අමුතුම පාඩමක් ඉගෙන ගෙන, ලැබූ ජය සාමකාමීව සැමරුවේ සර්ටිෆිකේට්ස් ටිකත් අතට ගනිමින්.

දුකින් උනත් හැමොටම සමු දීලා අරන් ආපු බඩු ටිකත් අරගෙන අපි ආවේ ගේට් එක ලගට. එතනනේ වාහන පාක් එක. අපේ ස්කුල් එකෙන් ආපු වෑන් ඔක්කොම පිටත් වෙද්දි, අපිත් හැරුනේ ආපහු එන්නයි. මායි අයියයි දෙන්නම කාර් එකේ බොනට් එකට හේත්තු වෙලා හිටියේ රිකි අයියල එනකනුයි.

"සුද්දි, බෑග් ටික කාර් එකට දැම්මා නේද ඔක්කොම ගත්තනේ."

"ඔව් අයියා දුනී ඔක්කොම දැම්මා"

"මිම් ඒනම් යමුද.."

"මන් රෙඩී.."

"පිස්සි. රිකීලා නෑ නේ පේන්න. උන් ටික තාම එලියට ආවේ නෑ..තව කොහෙද මන්දත් යමුද කියල ඇහුවා. ගිහින්ම එමුද"

"හා"

"ඒවට නම් කැමතී නේද.."

"යෙප් හී හි ආ අර එන්නෙ කට්ටිය.."ඈතින් එන එයාලව පෙන්නුවේ මන් අත දිග් කරලා. දැකපු දෙයින් මගේ ඇස් නලලට ගියේ රිකී අයියා එක්කම එන අර ගර්ල් ව දැක්කමයි. මාව දැක්ක ගමන් එයාට නම් හිනා කටයි. ඒත් අර ගර්ල් නම් ඒත් රවාගෙනමයි.

"අරෙහෙත් යමු නේද එහෙනම්" අපේ අයියගේ පිටට තට්ටුවක් දමින් මටත් ඇහැක් ඉගිමරල ඇහුවේ මන් අර

ගර්ල් දිහා උවමනාවෙන් බලද්දි.

"ආහ් අඳුරන් නෑ නේ බන් මේ මගේ නංගි.. අඳුරගන්න තයිශු මේ මගේ නංගි රවිනා"

sinhalaebooks.com

මවා ගත්තු හිනාවකින් සංග්‍රහ කරේ හිතින් ප්‍රශ්න කොටියක් අසමින්. යන්න උන්නු ගමනත් යන්නබෑ කියල හිතුනේ ඇය නිසාමයි.

"යමු නේද සුද්දි අපි"

"මහන්සි අයියා කොහෙවත් නොයා අපි ගෙදර යමුද"

"දැන් අපි එක්ක එන්න හා කිව්වා නේද බබා.." රිකී අයියට අමුත්තක් දැනෙන්න ඇති. එත් හිත කිවේම නොයා ඉන්න කියල යි.

"කකුල රිදෙනව කිය කිය හිටියේ බන් අපි වෙන දවසක සෙට් වෙමු කොහේ හරි යන්න. "

ඒත් ඒ ඇස් කැමති නෑ ඒක පිලිගන්න. මොනවදෙ හොයනවා මගේ ඇස් වලින්. ඇස් මගාරින්න ඕනි හින්දම මන් අයියට හේත්තු උනේ. හිනා වෙලා යමු කියාගෙනයි.

"එහෙනම් රිකී අපි යනෝ මෙහෙන්. උඹලා එන්ජෝයි කරහල්ලා. පිටට තට්ටුවක් දලා අයියා රිකිට සමු දුන්නේ.අනිත් අයටත් ඒ විදියටම සමු දෙන්න පටන් ගනිම්නුයි. අයියා ඈත් වෙනවත් එක්කම අඩියට දෙකට රිකී ලන් උනේ

sinhalaebooks.com

"පැංචි"

"ම්ම්ම්"

"ආ යූ ඕකේ"

"යා"

"ම්ම් නෝප් නතින්.."

"හ්ම්ම්"

හිතන්න තත්පරයක් වත් නොතියා වැලඳගත්තේ..

"පරිස්සමින් මගේ පැංචි. පරිස්සමට යන්න අයිය එක්ක. ගෙදර ගිය ගමන් කෝල් එකක් දෙන්න මට. මන් ඉක්මනට එනව ඔයාව බලන්න"

ලා හිනාවක් පාලා ඔලුව වැනුවේ ඔයත් පරිස්සමින් කියල කනට කොඳුරමින්. එයා අයින් වෙනවත් එක්කම රවීනා ඇවිත් හග් කරේ අයියට පේන්න බොරු හිනාවක් මවාගෙන. "මගේ අයියගෙන් ඈත් වෙලා ඉන්නවා" කනට කොඳුරලා එහෙම කියද්දි කිසිත් නොකියා අනිත් අයට පේන්න හිනාවක් පාලා කාර් එකේ දෙර ඇරියේ නගින්න. බැන්ඩේජ් එක හින්ද චුට්ටක් අමාරුයි. චුට් ට්‍රයි එකක් දුන්නත් තනියම අමාරු හින්ද අයියා දිහා බැලුවත් අයියා

තාම කතාවක එයාගේ පරණ යාලුවෝ එක්ක. හිතන්න මොහොතක් නොතියා පිටිපස්සෙන් ඇවිත් හරහට ගත්තේ ලස්සන හිනාවකින්.දෙරත් ඇරලා හරි පරිස්සමට කකුල රිදෙන් නැති වෙන්න ඉන්දෙව්වේ නළලත සියුම් හාදුවක් ලබා දෙමින්. කිසිත් නොකියා ඒ රුව දිහා බලන් උන්නේ, ඇත්තටම හරි ලෝබයි. ආදරෙයි ද කියල අහන්නෙවත්

නැතුව ආදරේ කරන මෝඩයෙක් දැක්කමයි මත්. ඒත් ඒ ආදරේ විදින්නත් කලින් මේ ආපු ප්‍රශ්නේ ගැන හිතද්දි පිස්සු වගේ. ඇයි රවීනා මත් එක්ක එච්චර තරහා. ඇයි මට එච්චටම අකමැති. අඩුම ගානේ දුරින් වත් මාව ආශ්‍රේ කරන් නැතුව ඇයි එයා මට රිද්දුවේ. ඇයි එච්චර තරහක්..

"පැංචී..."

"ම්ම්ම්" සිහියට ආවේ එවෙලෙයි.

"අතාරින් නැද්ද මගේ බෙල්ල මිම්"

එතකොටයි මතක් උනේ. හිටිය කල්පනාවේ තරමට තවමත් මත් හරහට ගත් වෙලේ ඔහුගේ ගෙල පිටිපසින් අත් පැටලවූ ගමන්මයි. වස ලැජ්ජාව

"අනේ සොලි අප්පා"

"මොනාද රත්තරන් කල්පනා කරේ මිමි"

"මොකුත් නෑ අනේ"

"හ්මි හ්මි බොරු කියන්නේ කියල දන්නවා. සනීප වෙන්නකෝ මිමි ඊට පස්සේ හොයාගන්නම් මන්"

ඒත් එක්කම වගේ අයියා ආවේ අරයා හිනා වෙලා මෑත් වෙද්දි. එයාලා තවත් කොයිදෝ යන්න පිටත් වෙද්දි අපි ආවේ ආපහු ගෙදර එන්න. මග දුරක් එද්දි

"සුද්දී.."

"අයියා.."

"රිකීගේ නංගි මොනාද කිවේ ඔයාට මිමි"

"අයියා"

"මගේ සුද්දි දන්නවනේ අයියා ගැන. අයියට තේරෙනවා මිමි. කියන්න මොනාද එයා කිවේ"

කෑම්ප් එකටගිය දවසේ ඉදන් මේ වෙනකම්ම රවීනා එක්ක උනු හැමදෙයක්ම අයියට කිවේ නිහඬවම ඔහු හැමදෙයක්ම අහනිද්දි.

"ම්ම්ම් ඒකයි එහෙනම් උනේ නේද

"ඇයි අයියා රවීනා එහෙම කරේ මට. ඔක්කොමත් හරි රැව්ව එකත් කමක් නෑ එයාගේ ශූ එකෙන් මගේ අත පෑගුව එකත් කමක් නෑ එයාගේ අයියගෙන් ඇත් වෙලා ඉන්න කිව එකත් කමක් නෑ ඇයි අයියා එයා මාව තල්ලු කලේ ඔලුව හරි කොන්ද හරි වැදුනා නම්"

"ශ්...ඔයාලා තාම චූටි ළමයි මගේ රත්තරන්. තේරෙන් නෑ නේ මිම් බරපතලකමක්. ඒ වෙලාවට කේන්තියට හිතට එන දේ කරනව මිසක් හිතා මතා කරන්න නැතුව ඇති කියල හිතෙන්නේ මැනික අයියට.."

"හ්ම්ම්"

"දැන් හිතන් නැතුව ඉන්න මගේ චූටි කෙල්ල. දැන් අප්පච්චි ට කියන්න බොරුවක් හදා ගන්නවා. කකුල් දෙකෙන් එලියට බැස්ස එක තනි අණ්ඩෙන් එද්දි. ආයේ යවන එකක් නෑ ඔන්න. ආයේ මට චුරු චුරු ගාන්න එන්නෙපා"

"මොනා හරි කියන්නකෝ අප්පච්චි ට"

"අනේ නටහන්, මන් කියනව ඔක්කොම ඇත්ත ගිහින් මගේ යාලුවවත් දැලේ දාගෙන පොඩ් කමට කියල"

"දෙයියනේ ඇයි මේ අපහාස. අඩුම ගානේ ඔයා මට කැමතිද කියල වත් අහන් නැතුවයි ඔය මහ ලොකු යාලුවා මෙච්චර නාඩගම් නටන්නේ"

"අනෙ බොල ඒ කියන්නේ තමුසේ ඉන්නේ ඌ අහනකම් ද"

"ඇයි හලෝ මාව මෙහෙම චාටර් කරන්නේ"

"මේ අයියා..."

"ම්ම්"

"එයා හොඳ කෙනෙක් හින්දද ඔයා මේකට පර්මිශන් දුන්නේ"

"මන් ඕකට පර්මිශන් දුන් නෑ සුද්දි.."

"ආහ්.. ඔයා මේකට කැමති නැද්ද අයියා"

"මේ අහනවා සුදූ.. රිකි ඇත්තටම පට්ටම හොඳ කොල්ලෙක්. වැදගත් අම්මිලා අප්පච්චි ලා එක්ක හොද පවුලක හොදට ඉගෙන ගෙන තියෙන හොඳ කොල්ලෙක්. අනික ඌ ගැන මන් තරම් දන්න කවුරුත් නැතුවැති. අන්න ඒකයි මන් මොකුත් නොකියන්නේ. නැත්නම් ඔයා දන්නවනේ අයියට

කේන්ති ගියාම කොහොමද කියන්න . ඔතන රිකී නොයිද වෙන රස්තියාදු කාරයෙක් වගේ එකෙක් හිටියා නම් ඌටත් ගහල තමුසෙටත් ගහල මන් එක්කන් එන්නේ..හැබැයි ඒකෙන් මන් කියන් නෑ මන් මේකට පර්මිශන් දුන්නා කියල."

"මට තේරෙන් නෑ අයියා ඔයා කියන දේ"

"මෝඩ් මේ අහනවා. ආදරේ කියන්නේ සෑහෙන දේවල් ගොඩක ගැලපීමක්. මන් කියන්නේ ඌ හොඳ උනාට ඌ ඔයාට ගැලපෙනවද ඔයාලගේ අදහස් ගැලපෙනවද ඔයාලට එකට ඉන්න පුළුවන් ද යාලුකමක් තියන් යනවා වගේ නෙමේ ආදරේ කරද්දි. ඌ ආදරේ කරද්දි කෝමද කියන්න මන් දන් නෑ මොකද අපි දෙන්නා ලව් කරල නෑ නේ. ඉතින් ඔය සම්බන්ධේ ගැන තීරණේ කරන්න ඕන ඔය දෙන්නාමයි. ඕකේ තේරුනාද මිම්..දැන් අර හිරුන් මොකෝ.. ඌත් තමුසෙට කැමති නේද.. "

"ඔයා කෝමද අයියා ඕවා දන්නේ"

"මන් තමුසෙගේ අයියා ඕයි. ජර්මන් වල නෙමේ මන් හඳේ හිටියත් තමුසේ ගැන ඇහැ ගහගෙන ඉන්නේ තමුසේ ඔය ක්ලාස් කට් කරල කට්ටි පැන්න ඒවා. පාට් දැම්ම ඒවා. අර කවුද කොල්ලෙක්ට ගහලත් තිබ්බා නේද තමුසේ තමුසෙගේ කරාටි වැඩ කිඩ ටික දලා.. ඕවා ඒම

sinhalaebooks.com

අප්පච්චිලා නොදන්නව උනාට මත් දන්නවා"

"ඉතින් ඒ ගැහුවේ නම් ඒ යකා ආවා මෙතන මට කුකුල් පාට් දගෙන අනම් මනම් කියාගෙන. එකයි දුන්නේ ඉතින්"

"ඒ එක දීලා තිබ්බ විදිය ඇති. ඒකගේ මුලු අනාගතේම අඳුරුයිද දන් නෑ මේ වෙද්දි හරි මත් කියන්නේ ඔය

ඔක්කොම දැනගෙනත් මත් සද්දේ නැතුව හිටියේ සහ ඉන්නේ තමුසේ මේ වෙනකම් කිසිම වැරදි දෙයක් කරල නැති හින්ද. වැරදි කියන්නේ ක්ලාස් කට් කරපුවා නෙමේ. ඒව ඉතින් කොල්ලො කෙල්ලො කාලේ ඕන කෙනෙක් කරන ඒවනේ. තමුසේ ක්ලාස් කට් කරපුවා අම්මිමා දන්නව නම් පුනරුත්ථාපනය ට දනව ශුවර් "

"අයි ලෞ යූ අයියා"

"මස්තේ පාර දන් නැතුව හිටාම්'

"එහෙම පාරක් නෙමේ හලෝ ඇත්තටම කිවේ. මාව මේ තරමටම තේරුම් ගන්නේ නෑ නේ අම්මි අප්පච්චි වත්. "

"ඒකට තමා අයියා ඉන්නේ මෝඩ්. මෙච්චර කල් පරිස්සම් උනා වගේ. ඉතුරු ටිකත් පරිස්සම් වෙන්න මගේ මැනික දන්නව කියන්න අයියා දන්නවා."

"මට තේරෙනවා අයියා. අයි ලෞ යූ"

"ලෞ යූ ටූ සුද්දි"

පැය 4 ක පමණ ගමනකින් පස්සේ අපි ආවේ ගෙදර ට. එකම යුද්ධේ ඉතින් කකුල කඩන් ආවයි කියල අයියව මැද්දට තියලා කකුලත් උස්සන් කාමරේට ආවේ පොඩි වොශ් එකක් ද ගන්න. මගින් කෑම අරන් කාර් එකේ ඉදගෙනම කෑවේ කකුල එක්ක කඩයක් ඇතුලට යන්න අමාරු හින්දයි. ඒ හින්ද බඩගින්නක් තිබ්බෙත් නෑ. අමාරුවෙන් වොශ් එකක් දගෙන ඇදට ආවේ වෙලාව රෑ 8 යි. ගෙදර ගිහින් කියන්න කිවට අර මෝඩයා මන් ලග නම්බර් එක නෑ නේ ඉතින්. මේ වෙලාවේ අපේ අයියගෙන් ඉල්ලුවොත් ඒම ඒ යකා මාව ලැජ්ජා කරයි. ඒ හින්දම ෆෝන් එක බලන්නෙවත්

නැතුව නින්දට වැටුනේ මටත් නොදැනිම.

වේලාසන නිද ගත්තු හින්ද ටිකක් උදෙන්ම ඇහැරුනේ වෙලාව පාන්දර 5යි. නිදිමතේම හැමදාම වගේ ෆෝන් එක අරන් බැලුවේ..අම්මේගේ මැසේජ් 1000 ක් විතර එහෙන් ගෲප් චැට්. එහෙන් දූනියා. මෙහෙන් හිරූ අම්මේ ඔක්කොටම හපන් සේව් කරල නැති නම්බර් එකකින්. ආයේ බලන්නදෙයක් නෑ අර යක්ස පැටියා තමා.

'පැංචි ගෙදර ගියාද'

sinhalaebooks.com

‘පැංචියේ කොයිද්‍දෝ’
‘චූටි ගෙදර ආවද කොහෙද ඉන්නේ’
‘බබා....’
‘දැන් නම් මට කේන්ති යනවා’
කීයද දැන් වෙලාව මේ වෙද්දි යන්න ඕනි ගෙදර
‘ඕයි’
‘ඉන්නවා මන් මහ ලොකු අයියටම කෝල් එකක් ගන්න ගෙදර ආවලු නේ ගිය ගමන් කියන්න කිව්වම කරන්න බැ. ආයේ අහු වෙන්නකෝ බබා ඔයා’
‘බලාගමු’

අම්මොහ් මැසේජ් 200 ක් විතර එයාගෙන්ම. බැරිම තැන අයියට අරගෙනලු. පිස්සා . ඔය ඔක්කොටම හරියන්න එකම එක මැසේජ් එකක් දැම්මේ

"ගුම්මෝනින්, දෙයි ගියා හොදටම බනින්නෙපා "

ඕක දැක්කම එයා සල්ලම් හුම්

සතියක් විතර යනකම් අපි මොබයිල් එකෙන් විතරක් කතා බහ කරේ මගේ කකුල හොද වෙනකම්. දැන් නම් කලින් වගේමයි චූට්ටක් වත් රිදෙන් නෑ. සතියක් තිස්සෙම ගෙදර ඉදල කම්මැලිකමටම අයියට ශේප් පාරක් දන්න හිතන්

"අයියා............"

sinhalaebooks.com

කීක් නෑ ඒ යකා

"අයියා...."

"මොකද මොකාටද තමුසේ ඒ පාර එන්න යන්නේ"

"ආපෝ මන් මේ රසම රස ෆලූඩා එකක් හැදුවා දෙන්න ආවේ "

"අනේ නංගි මේ. වෙනදා මේ යටි ගිරියෙන් කෑ ගහල් වැදල තමුසෙට කියල මන් මගේ කිරි එක ගෙන්න ගන්නේ දැන් එනව ෆලූඩා එකක් උස්සන්. ඇත්තටම මොනාද ඕයි ඕනා "

"ඔයා එක්ක බෑ අයියා.. "

"අයියා..."

"මොකද බන් වෙලා තියෙන්නේ. කොහෙද යන්න ඕනා"

"කොහේ හරි යන්කෝ කම්මැලි ගෙදර ඉන්න "

"පිස්සුද හලෝ. මට වැඩ"

"අනේ අනේ අයියා දවස තිස්සෙම ඔය ලැප් එකට මූණ

ඔබත් ඉන්න එක කම්මැලි නැද්ද හලෝ අපි යමුකෝ කොහේ හරි "

"කොහේ යන්නද බන්"

"ම්ම්ම්ම්ම් කොහේ හරි"

"ඇයි අරූ එනව කිව්ද "

"නෑ අනේ.. මත් මේ නිකම් කිව්වේ "

"අනේ යමන් බන් යන්න"

අඩල අඩල අඩලා අන්තිමට අපි දෙන්නම ගෙදරින් පැන ගත්තේ ශොපින් යනවයි කියල. කෝම හරි ටික දුරක් එද්දි හරස් පාරක ඉදන් ආපු කාර් එකක් අපේ කාර් එකේ වදින නොවදින ගානට හිතා මතාම ඇක්සිඩන්ට් කරන්න හිතන් ආවා වගේම උපරිම වේගෙන් ආවේ අයියාගේ වගේම මගෙත් මූනු ගතම සීතල වේගන යද්දි....වදින නොවදින ගානට ඒක මිස් වෙද්දි අයියට උපරිම කේන්ති ගිහින් කාර් එකෙන් බැස්සේ මමත් ඒ පස්සෙන්ම වැටෙද්දි..

## 4 කොටස

ඒ පැත්තෙනුත් ආව එක්කෙනා කේන්තියෙන් මෙන් බහිද්දී..හති දදා අයියාගේ පස්සෙන් ආපු මට අපරාදේ කියල හිතුනේ දෙන්නට දෙන්නා හිනා වෙද්දියි. ඔව් ඔව් අර පොල් බෑ මූණා තමයි. අයියත් දැනගෙනමනේ දෙයියනේ බොරුවට රගපෑවේ.

"දැන් දෙන්නම කාවද ඔය රවට්ටන්නේ ආහ්"

"අම්මේ කොච්චි කරලට ඩෝන් ගිහින්"

"අයියා මේ මන් තරහයි හලෝ තමුසේ එක්ක"

අත් දෙකත් බැදගෙන ඒ දෙන්නට රව රව මන් කෑ ගහන්නේ ආපු කේන්තියටමයි

"අයියා එක්ක තරා උනාට මා එක්ක තරහ නැනේ මගේ හාවි.."

"ඔයා ඔයා තමා මෙතන අංක එක කතා කරන්න එපා මන් එක්ක "

"කෝ බලන්න ඔය තරහා " කියන ගමන් අයියා ඉස්සරහම චුට්ටක් පහත් වෙලා කම්මුලකට කෙටි හාදුවක්

sinhalaebooks.com

තැවරුවේ අයියා ඉස්සරහ පොලව පලන් යන්න තරම් ලැජ්ජාවක් දැනෙද්දි

"අඩෝ උඹ කාගෙද බන්. යකෝ අයියා ඉස්සරහම නංගිව කිස් කරන සිරිතක් තියේද. අයියා නංගි පැත්තකින් තියපන් අඩුම ගානේ කුලුදුල් කිස් එක වත් දීලා නැති මන් ගැන පව් කියල හිතෙන් නැද්ද "

"අනේ ශේල් මගෙන් අහ ගන් නැතුව හිටාම් නංගිට කියන්නම්කෝ මන් අයියගේ විස්තරේ."

"මඩ ප්‍රචාර ගහන්නෙපා හල්ලෝ."

"හරි හොක්ක ටූ ලේට් නේ පැංචි. අපි යනවා "

"හරි හරි මේ යන මගුලක පරිස්සමට යමන්, මගේ කෙල්ලව ඇහැක් වගේ පරිස්සම් කරපන්. නොකෙරුවොත් දන්නවනේ හොයන් ඇවිත් මරන්නේ. "

"දන්නවනේ මස්සිනේ මගේ ඩ්‍රයිවින්"

"ඔව් ඔව් දන්න හින්ද තමයි එවන්නේ මගේ කෙල්ලව "

"සුද්දි.."

"ම්ම්ම්"

"පරිස්සමින් රත්තරන්..රිකී අයියා එක්ක ගීත් එනවා පරිස්සමට..අයියා ඔෆිස් එකට යනවා. එද්දි කෝල් එකක් දෙන්න මත් ගන්න එන්නම් ම්ම්"

ඇත්තටම මේ දේවල් මේ විදියට කරන අයියලා ඉන්නවද හිතිලා එක පාරට ආදරේ හිතිලා අයියට තුරුල් උනේ.

"අම්මෝ මේ බොරුවට කෝලම් නොදා ඉන්නවා"

"බොරුවට නෙමේ "

"ආහ් බොරුවට නෙමේද පිස්සි. ලෞ යූ මැනික."

"ලෞ යූ ටූ අයියා"

අයියට සමුදීලා අයියා පිටත් වෙද්දි මෙයා එක්ක ගීත් මත් කාර් එකට නැග්ගේ යන්නේ කොහෙද කියල වත් නොදැන.

"පැංචි.."

"ම්ම්"

"සුවඳයි..."

"මොකක්"

sinhalaebooks.com

"පරිෆියුම් එක මෝඩ්.."

"සුවඳයි තමයි..ඔයා කියන්න ඕනි නෑ ඒක"

"ආහ් හා.. වැඩී කට..දනව උස්සන් ගිහින් මුහුදට.."

"මාව මුහුදට දල ඔයා ඉන්න ඈ මෙහේ"

"ඇයි"

"දල බලන්නකෝ එහෙනම් "

"හරි ඉන්නවා"

පිස්සුද මන්ද මේ යකාට. කියල කට ගන්න හම්බුන් නෑ දැම්මා නේද පමුණුගම බීච් එකට. වැඩි සෙනගත් නෑ දෙයියනේ ඇත්තටම දන්නද මන්ද..

"බහිනවා"

"බෑ"

මාව ඇතුලෙම තියල බැස්සා නේද එලියට. එහා පැත්තෙන් ඇවිත් මගේ පැත්තේ දොරත් ඇරල එලියට ගත්තේ අත් දෙකටම අරගෙන.

sinhalaebooks.com

අද නම් හරි මුහුදේ තමා.. හත් දෙයියනේ පීනන්නත් මතක නෑ.. ඇත්තටම දයිද හිතින් කුටු කුටු ගගා ගියේ

මේන් රැල්ල ලගටම් ගියාම ඒ යක්සයා හිනා වෙනවා.

"මොකද හිනා වෙන්නේ "

"බෙල්ල අතෑරහම් යෝධියේ.. හුස්ම ගන්නත් බෑ.. මරන්නද හදන්නේ.මහ ලොකුවට කිවේ නම් දනවකෝ ගිහින් බලන්න කියල. ලන් වෙද්දි මගේ කරේ."

වස ලැජ්ජාව. ශේප් එකේ බෙල්ල අතෑරියේ බිමින් තියයි කියල හිතල. ඒත් නෑ.. ශේප් එකේ ලස්සන හිනාවක් දැම්මේ ඇස් චුට් කරල එහෙම හරි බිමට බැහැ ගත්තයි. කොහෙද ඒත් නෑ ලස්සන හිනාවකින් මගේ මුලු මූණම හොදට ස්කෑන් කරනවා. ලැජ්ජාවේ බෑ.. එන්න එන්න රතු උනේ බලන් ඉද්දි.

"ලස්සනයි බම්.. හා පැටියෙක් වගෙමයි..තලන්න ලෝබයි.."

කිව්ව වචනයක් වචනයක් ගානේ තවත් රතු උනේ මාව ලැජ්ජාවට තවත් පිම්බෙද්දි.

"ජම්බු ගෙඩිය මගේ. බහිනා දැන්. උස්සන් ඉන්නකොට කේක් ගෙඩිය වගේ අපූරුවට ඉන්නවා. "

ශේප් එකේ බිමට බැහැලා

" ඉතින් කවුද දැන් කිවෙ මාව උස්සන් ඉන්න කියල ඔයාට" කියල විරිත්තලා දිව්වේ ආයේ අල්ලයි නැට්ට කියල.

"බබා රැල්ල බලාගෙන.."

"පැත්තවත් නොබලා මන් දිව්වේ කේන්ති ගස්සන්නමයි"

"තයිශු දූවන්නෙපා ඔය ඇති.."

රැල්ල පැත්තටම දිව්වේ ආසාවටත් එක්කමයි.

"තයිශු නැවතියන්"

ඉද්ද ගහල වගේ නැවතිලා පිටිපස්ස බැලුවේ හොඳටම කේන්ති ගිහින්. ඇස් වලින් ගින්දර පිටවෙන තරම්. හයියෙන් වේගෙන් උස් පහත් වෙන පපුව. කේන්තියට නහර ඉලිප්පෙනවා.

හෝ ගාලා ලොකු රැල්ලක් ආවේ එක පාරමයි. ඒ ශක්තිමත් තුරුලට ඇද ගත්තේ දෙන්නම වතුරෙන් නැව්ලා යද්දි උනත් ඒ තුරුල ඒ දෑත නොතිබෙන්න ඒ රැල්ලට නම් මාව කන්ට්‍රෝල් නැතුව යන්න තිබ්බ ඉඩ කඩ ගොඩක්

වැඩී. ආයෙමත් රැල්ලක් එන්න කලින් ඇදගෙන ගියේ වෙරළට. බයට ගැහෙනවා මාව හොදටම. වෙරළට ආවත් හරි චටාස් ගාලා වැදුනේ කම්මුල් පාරක් ඇස් දෙකෙන් කදුලු උනද්දි. ඇස් තදින් පියාගෙන තද කරගෙන හිටි ඉරියව්වෙන්ම උන්නු මන් අප්පච්චිගෙන් අයියගෙන් වත් සැර කිරිල්ලක් මිසක් චුටි පාරකටවත් තැලිලා නැති මට දැනුනු අපහසුවටයි.ඒටත් වඩා දුකයි. ඒ ක්ශනයෙන් ම ආයෙත් සැරයක් මා වැළඳ ගත්තත් හිතුන් නෑ බලන්න නම්. යන්තම් ගැහෙන ඉකිය හරි අමාරුවෙන් පාලනේ කර ගත්තේ කදුලු පිහිදගනිමින්. තවත් මිනිත්තු 10 ක් විතර ගෙවුනේ කිසිම හාවක් හූවක් නැතුව.

"ඔයා දන් නෑ මගේ රත්තරන් මන් කොච්චර බය උනාද කියන්න. මගේ හොදම යාලුවගේ පණ ටික ඒටත් වඩා දැක්ක වෙලේ ඉදන් මගේ හුස්ම ටික අයියට කේන්ති යන් නැද්ද මගේ රත්තරන් ඔයාට මොනා හරි උනානම් එහෙම. ශ්.... නාඩ ඉන්න මගේ මැනික..අනේ සොරි මගේ රත්තරන්

ගැහුවට..කෝ ඉන්න අයියට බලන්න දෙන්න මූණ"

වචනයක් වත් නොකියා ඔහුගෙන් මෑත් උනේ තවත් එතන ඉන්න හිතක් නොතිබ්බ නිසයි.

"මැනික මට බලන්න දෙන්න එක පාරක් හිතුවක්කාර නොවී"

"ප්ලීස් මාව ගෙදර ගිහින් දාන්න. එහෙම නැත්නම් අයියට එන්න කියන්න "

"මගේ රත්තරන් ඔයා කරපු හිතුවක්කාර වැඩේටනේ ගැහුවේ මැනික. අයියා සොරි කිව්වනේ දෙයියෝ. කෝ එන්න මන් ලගට.."

"අල්ලන්න එපා මාව.. ප්ලීස්.."

අතකින් වත් අල්ලන්න් නොදී කාර් එක දෙසට ඇවිදන් ආවත් දාන් ආපු චුටි ශූස් දෙක තාමත් වෙරළේ. ආයෙමත් යන්න බැරි කමට ගිහින් කාර් එක ඇතුලෙන් ඉද ගත්තේ.. සීට් එකට හේත්තු වෙලා නිදහසෙ කදුලූ වලට යන්න දීලා.. ඔහු තවමත් උන් තැනමයි. දුකයි. ඉපදුන ද ඉදන් කොච්චර හිතුවක්කාර වැඩ කලත් අප්පච්චි අයියා අම්මා චුටි පාරක් වත් ගහලා තිබුන් නෑ. පැයක් එකහමාරකින් විතර ගැස්සිලා ඇහැරුනේ.. ඒ අඩපු ටිකට, ටික වෙලාවක් නින්දත් ගිහින්. කාර් එකේ බොනට් එකටහේත්තු වෙලා ඔහු තවමත් හිටගෙන. මොහොතකට හිත උණුවෙද්දි හෙමිහිට කාර් එකෙන් බැහැලා ඇවිදන් ගියේ. රතු වෙලා තිබ්බ කම්මුල දිහාම බලන් උන්නෙ ඔහු

"ඇහැරුනාද පැංචි..අයියට කෝල් එකක් දෙන්න පැංචි. ඔයාව ගන්න එන්න කියන්න මෙතනට. ලොකේශන් වට්සැප් කරන්න අයියට එයා එයි පැංචිව ගන්න" ඉවත බලාගෙන

චුට්ටක් වත් ලත් නොවී ඇතිත් ඉදගෙනම ඔහු කිවේ එහෙමයි.

"අයියා ඇහුවොත් මොකද උනේ කියල "

"අයියට ඇත්ත කියන්න පැංචි"

"ඔයා මට ගැහුවා කියල"

"මිම් පැංචිට හිතෙන විදියකට කියන්න"

කිසිත් නොකියා ඔහු ලගට දුවන් ගිහින් තුරුල් උනේ..පුලුවන් උපරිම තදින් ඔහුත් මා වැලඳගතිද්දි

"රිදෙනවද මගේ රත්තරන්..අයියා ගහපු එක රිදෙනවද මැතික.."

"මන් ආයේ එන් නෑ පැංචිට රිද්දන්න මිම්"

"කෝ යමු අපි මිම්.. මේ ශූස් මන් ගෙනාවා. ඉන්නකෝ."

ඔහුම නැවිලා කකුලේ තිබ්බ වැලි පිහිදලා ශූස් දෙකම දැම්මේ මගෙ කඳුලු ආයෙම අලුත් වෙද්දි. අනේ මට රිදුනටත් වැඩිය මන් එයාව රිද්දලද කොහෙද. ආයෙමත්

මගේ කදුලු දැකලා හෙමිහිට ඇගිලි වලින් දැනෙන්නේවත් නැති තරමට කදුලු පිස දැම්මේ.. නාඩ ඉන්න මැතික කියන ගමන් මවා ගත් හිනාවකින්.

"කෝ යමු පැංචි අපි.."

"ආයේ එන් නැද්ද"

"මමද මිමි"

"නැ අපි"

"ආයේ එන්න ඕනි ද මැතිකට මාත් එක්ක"

"ඔව්"

ලස්සන හිනාවකින් ආයෙමත් සැරයක් ඒ පපුවට තුරුල් කර ගත්තේ

"මට ආදරෙයි ද මගේ වස්තුව"

"ආදරෙයිද කියන්නකෝ පැංචි. තරහා නැද්ද මන් එක්ක මිමි. අල්ලන්නත් එපා කිවේ.."

"මිමිමි ආදලෙයි"

sinhalaebooks.com

"බය උනා රත්තරන් මන්. ඔයාට මොනා හරි උනා නම් එහෙම. ඔයාගේ අයියගෙන් පරිස්සමට මලක් වගේ අරන් ආපු මන් මොනවා කියන්නද මගේ මැතික මොනා හරි උනානම්.."

"ශ්..... ඇති අප්පා"

"ඇති තමයි හා හා පුරා කියල පටන් ගන්න හදද්දිම නැති උනා තමයි කියල හිතුවේ මිම්"

"ඉතින් ඇයි නැති කර ගන්නේ අල්ලන්න එපා කියල විතරයි නේ කිවේ"

"ඔයාට විහිලු පැංචි"

"ආයේ රිද්දන්න එන්නේ නැ කිවම දුක හිතුනා "

"ඒ කියන්නේ රිදුනත් මා එක්ක ඉන්න කැමතිද මිම්"

කට පුරෝලා හිනා උනේ මොකුත්ම නොකියා. තත්පරයක් නොතියා ඉනෙන් උස්සලා අරම් බොනට් එක උඩින් තිබ්බේ ලස්සන හිනාවක් පුරෝගෙන. ටිකක් වෙලා රතු වෙලා තිබ්බ කම්මුල දිහා දුකින් වගේ බලන් උන්නේ මන් බෙල්ල ඇල කරලා හිනා වෙද්දි. රිදෙන් නැති වෙන්න හරි පරිස්සමට මුලු මුණම දෝතටම අරගෙන හෙම්හිට දෙතොල්

තද කරේ රතු වෙලා තිබ්බ කම්මුලකටයි. ආයේ ආයේ ආයේ ආයේ හිමිට පරිස්සමට කෙටි හාදු ගොඩාක් දුන්නේ.. කම්මුල විතරක් නෙමේ මුලු ඇඟම විලියෙන් රතු වෙද්දි.

ඒ පාර හාදු දෙන එක නවත්තලා හිනා වෙනවා නේද..

"මොකද හුම් හිනා වෙන්නේ"

"මොකද හුම් තමයි. දීගෙන ඉන්නවා කිස් කරනකම් නේද "

"එහෙම නෑ හරිද ලැජ්ජාවේ බෑ"

ආයෙමත් ලස්සන හිනාවකින් හිමිට පරිස්සමට මගේ කච

කච ගාල කියෝන චූටි දෙතොල් වලට නැඹුරු උනේ කවදවත් නොවින්ද ඒ පහස කුලුදුල් දෙතොලත හාදුවට මගේ ඇස් පිය වෙද්දි වගේම ඒ කුලුදුල් පහසට චූටි කදුලු බිදු දෙකක් ඇස් අග තෙත් කරද්දි. තත්පර කීපයක් ඒ පහස විදගෙන ඇස් අග තිබ්බ කදුලු බිදු දැක

"මගේ චූටි මැනික..දුකයි අප්පා"

"ඇයි"

"ඕම තලන්න දුකයි මැනික.."

sinhalaebooks.com

"හරි හිනා නේද.."

"මොනාද බම් ඒ රහ.."

"මොන රහද"

"ලිප්ස්..හරි රහයිනේ ඒයි"

"අයියෝ ඒ ලිප් ග්ලෝස් අනේ..ස්ට්‍රෝබෙරි ෆ්ලේවර් එක"

"ඒ මොනාද ඕයි ඒ"

"අයියෝ ඔයා දන්න ඉටිගෙඩිය, මට අයියා ගෙනත් දුන්නේ රට ඉදන් එද්දි හුම්"

"අනේ අනේ මේ. මන් දන් නෑ ඔය මේකප් මගුල්. අයියා එකක් ගෙනත් දුන්නා නම් එකට දහයක් ගෙනත් දෙන්නම්කෝ මන්"

"හා ගෙනත් දෙන්නකෝ බලන්න..මේ ඒක නෙමේ හොදටම බාකිනී අයියට කියනව මන් ඔයා කන්නවත් අරන් දුන් නෑ කියල "

"අම්මෝහ් එනවා එනවා යමු කමු කොහෙන් හරි"

"තව එකක් ඕනි "

"මොකක්ද මිමි"

"ආයෙම කාල ඇවිත් රැල්ල පාගන්න ඕනි"

"පිස්සි මගේ එනා එනා කමු අපි. මොනාද කන්න ඕනි මගේ පැංචිට KFC , Mc Donalds"

"එපා මට ඕනි අර අර අපි එද්දි අර අර වම් පැත්තට හැරුනේ. අර සුරුවමක් එක්ක තිබ්බේ එහා පැත්තට වෙන්න සයිවර් කඩයක්..එන්න ඒකෙන් පරාටයි උලුඳු වඩෙයි කන්න ඕනි"

"ආහ් මගේ චූටි මැනික ඒවලිනුත් කනවද මිම්මි..ඒකට අපේ එක. එහෙම කඩයක් දැක්කොත් අප්පිරියා කරල පණ යයි."

"රවීනාද"

"මිමි ඔව්"

"එයා වසයිද"

"ඇයි ඒම අහන්නේ "

"නිකම් ඉතින්"

"වසයි ද නම් මන්ද..ඔයයි අයියයි වගේ නම් එකතු නෑ අපි දෙන්නා..මිම් ඒත් අයියට ඔයා වගේමයි මටත් ඒ මගේ පණ ටික"

"ම්ම්ම්"

අර කීව කඩෙන් උනු උනු පරාටයි උලුදු වඩෙයි කාල එලියට එද්දි තවත් ලොකු පාර්සල් එකක් මගේ අතට දුන්නේ මේ පිස්සා..

"මේ මොකටද"

"ආසයිනේ මේවට.. ඒකයි ගත්තේ කනවා ඇතිවෙන්න පිස්සි.."

"අම්මූ තැම්කූ හුම්"

ආයෙම බීච් එකට එන ගමන්,

"පැංචි..."

"ම්ම්ම්"

"KSM එකේ රෙජිස්ටර් උනා ලූ නේද "

"ම්ම් ඔව්"

"අයියා විස්තරේ කිවමම මත් අපේ එකවත් එක්කත් ගීත් රෙජිස්ටර් කෙරෙව්වා"

මවාගත්තු හිනාවකින් හිටියත් ඉස්සරහට මොන මොනා වෙයිද්දෝ කියල බය හිතුනා.

## 5 කොටස

ආයෙත් සැරයක් අපි ගියේ බීච් එකට.

"බහිනා පැංචි"

"බෑ"

"ආහ් හා හුරතල් වෙන්න නේද"

කලින් වගේම අත් දෙකටම අරගෙන වෙරළට ඇවිදත් ගියේ මත් ඒ රුව හොදට රස විදිද්දි. දිගු ඝන රැවුල, තලෙලු හම, සාමාන්‍ය ගානට වවල තිබුනු කොන්ඩේ කෙල හැලෙනවා කොච්චර හරි බලන් ඉන්න පුළුවන්.

sinhalaebooks.com

"ඒයි මොනාද ඔච්චර බලන්නේ ආහ්"

"ආපො බලන්නම වැඩේ"

"ආයි ආයි මන් දැක්ක එනකම්ම මාව ඇස් වලින්
දූම්ෂණේ කරා"

"ඡ්චි"

"මේ දැන් ඔය ඒයි මේයි කියන් නැතුව මට වෙන
කියන්න නමක් නැද්ද "

"රිකී කියන්න ඈ"

"අඩුම ගානේ සම්පූර්ණ නමවත් ඇහුවද මගෙන් ආහ්"

"රකීත් සයාර විශ්වාන්"

"ආහ් දන්නව නේද.."

"මන් අද උදේ ඔයාගේ ලයිසන් එක දැක්කා හුම්"

"ආහ්"

"රකී කියන්නම්ද සයූ කියන්නම්ද විශ් කියන්නම් ද"

සති දෙකකට පසු,

"සුද්දි..."

"අයියා..."

"ඉක්මනට එනවා හලෝ මට ඔෆිස් යන්නත් ඕනා"

ඉක්මනට ඉක්මනට ඇවිත් කාර් එකට නැග්ගේ අද තමා පටන් ගන්නේ කැම්පස්.

"රිකී එනවා කිව්වද"

"ඔව් අයියා රවීනා එක්ක එනවා කිවා.."

"සුද්දී.."

"ම්ම්ම්"

"අයියා ඉන්නවා ඕනිම දේකට..මැනික බය නැතුව ඉන්න ම්ම්"

"ලව් යූ අයියා"

"ලව් යූ ටූ මැනික"

මිනිත්තු 30 කින් පමණ අපි ආවේ කැම්පස් එකේ ගේට් එක ලගට. කිවත් වගේ රවීනත් ඇවිත් හිටියා. එයා නම් තවත් ගෑනු ලමයෙක් එක්ක ඇවිත් තිබුනේ..

අපි තුන් දෙනාව දාලා අයියලා දෙන්නා ගියේ අර දෙන්නා පැත්තකින් යද්දි මන් වෙනම යද්දි.

"ඒයි හලෝ"

"ඔලුව උස්සලා බැලුවේ රවීනගේ හඬටයි."

"මි කියන්න"

"මේ ඉන්නේ මගේ හොඳම යාලුවා කේශාලි"

"ම්ම්"

"කවද හරි මගේ අයියව මැරි කරන්නේ මෙයා විතරයි. නිකම් ඒ දෙන්නා මැද්දට ඇවිල්ලා කරදර විදින්න ලෑස්ති වෙන්න එපා"

මොකුත්ම නොකියා ඒ ගර්ල් දිහා බැලුවේ එයත් නක්කලේට හිනා උනා. එයත් රවීනට නොදෙවෙනි ගතිගුණ තියෙන කෙනෙක් කියන්න නම් තේරුනා. පාඩුවේ ඇවිදන් ගියේ ලෙක්චර් හෝල් එකට.

sinhalaebooks.com

පලවෙනි දවස ඒ විදියට බෝරින් වෙද්දි, මගෙන් එහා පැත්තෙන්ම වාඩි වෙලා හිටියේ ඒ දෙන්නා. ඇත්තටම ලෙක්චර් එකට නම් හිත යොමු කරේම නෑ ඒ දෙන්නා.රවීනා

කා ගැනදෝ කතාවක අර ගර්ල් නම් රිකී ගැනම කතාව. අහන් හිටියා නෙමේ ඇහුනා. ලන්ච් ටයිම් එකේ කැන්ටින් එකට වත් නොගියේ ඒ තරමට බෝරින් හින්ද. ඉවර වෙනකම්ම ඉදලා ගේට් එක ලගට ආවේ අයියාව බලාගෙන.

"මගේ හා පැංචි. මොකෝ මැතික මේ මූණ.. මහන්සි ද මගේ පැටියට"

අමාරුවෙන් හිනාවක් හදන් ඔලුව වැනුවෙ ඔව් කියන්න.

"කෝ අපේ දෙන්නා"

ඒ කියන්නේ මෙයත් කේශාලි ගැන දන්නවා.. නොදැන වගෙ ඇහුවේ

"කවුද දෙන්නා"

"ඇයි අර උදේ අපේ නංගිගේ යාලුවෙක් ආවා නේද. ස්කූල් යන කාලේ ඉදන්ම ඒ දෙන්න එකටනේ. අපෙ ගෙදර මයි

මැනික. කතා කරේ නැද්ද මිම් "

"ආහ් කතා කරා. එක පාරට ගානක් නැතු උනා. අදමනේ දැක්කේ හී හී"

"දෙන්නා තාම ඇතුලෙද වස්තු"

"මිම් ඔව් ඉක්මනට එයි.."

"මැනික එක්ක වැඩිය එකතු නෑ නේද අපේ එකී"

මොකුත්ම නොකියා හිනා උනේ

"එයා ඒම තමා රත්තරන් , අඩුම ගානේ මත් එක්කවත් නෑ නේ එහෙම එකතුවක්, ටික දවසකින් හරි යයි. මැනික හිතන්නෙපා හොඳද" කියල ඔලුව අත ගාද්දිම අර දෙන්නා ආවේ අයියටට නොපෙනෙන්න මට රවාගෙන.

"පැංචි අයියා කෝ තාම නෑ නේ. ඔයාව දාල යන්නත් බෑ මෙතන, අපි එක්ක යමුද"

"අයියා ඒවි"

"ඒනම් ටිකක් ඉමු අපි" කියල අර දෙන්නා දිහත් බැලුවේ, ඒ දෙන්නා ඒක ගනන් නොගෙන ගිහින් එයාලගේ කාර් එකට නගිද්දි.

"කේශාලිත් යන්නේ එන්නේ ඔයාලා එක්කද"

"ඔව් පැංචි අපේ ගෙදර යන්නේ දැන් ඔය දෙන්නම. ඒ නංගිගේ අම්මා හරි අප්පච්චි හරි එක්කන් යන්න එනව රෑ වෙල ගෙදර ට"

"ම්ම්ම් එහෙමද"

"මොකෝ පිස්සි"

"නිකම් අප්පා"

"මෙතන බෑ මොකුත් කරන්න, ඔය කෝලම් දකිද්දි ඉන්න බෑ බම් කන්න හිතෙනවා "

"අම්මු.. අන්න අයියා එනෝ"

අයියා පාරේ අනිත් පැත්තෙන් නැවැත්තුවේ. එයා එන්නේ ඒ පැත්තෙන් නේ. මගේ අතින් අල්ලගෙනම පරිස්සමට පාර පන්නලා කාර් එක ලගට එක්කන් ආවේ.

"ආහ් මස්සිනා"

"මොකද බම්ලෝ කෑ ගහන්නේ මේ පාරේ"

"යකෝ්ව් මගේ පැංචිව අරන් යන්න ඉක්මනට වරෙම්කෝ ඔෆිස් නෙමේ අපායේ හරි ඉදන්. නිකම් වේලෙනව තෝ එනකම් මෙතන ඉදන්. උස්සන් වත් ගියොත් එහෙම කවුරු හරි"

"අපේ සුද්දිව උස්සන්න්න උස්සලා බලන්න කියහන්කෝ "

"ඇයි"

"යකෝ දෙඩම් ගෙඩිය සයිස් වගේ හිටියට මේක කරාතේ බ්ලැක් බෙල්ට් 15 කට 20 කට හරි තනියම ගහයි මේ ලගදි කොල්ලෙක්ට ගහල තිබ්බා, දැන් උගේ අනාගතේම අඳුරුයි"

කිව්ව ගමන් සෝ කන්ෆියුස් මූණ කින් මන් දිහා බැලුවේ මට හිනා යද්දි.එහෙම්ම ටිකක් වෙලා ඉදලා අපි ගෙදර එන්න ආවේ අද උන දේවල් ටිකත් අයියට කිය කිය. අයියා කිවේ ඉස්සරහට වෙන දෙයක් බලමුකෝ පරිස්සමින් කියල

සති මාස කීපයක් ඒ විදියට ඇදුනේ සාමාන්‍ය ලෙසමයි.එක දවසක් රවීනා විතරක් ආවේ කැම්පස් ආවේ කේශාලි නැතුව තනියමමයි. ඒ ආවෙත් එයාලගේ අප්පච්චි එක්ක අයියා

ආවේ නෑ.. ලෙක්චර් එකට දුවන්න ඕනි හින්ද අරයාට

උදේ කතා කරන්නත් මට බැරි උනා. ඒ නැතත් මොකක් හරි වැඩක් වැටිලා ඇති හිතුනා.. මූණ අඳුරු වෙලා මොකක් හරි ලොකු ප්‍රශ්නෙක ඉන්නවා වගේ. අසනීපයිත් වගේ අනේමන්ද. ඕවා අහන්නත් බැ නේ ඉතිම්. නයි වෛරයිනේ මාත් එක්ක. මාත් සද්දේ නැතුව හිටියා. ලන්ච් ටයිම් එකේදි කැන්ටින් එකට යන්න නැගිටිද්දි, මගේ අතින් ඇල්ලුවේ රවීනා

"අනේ තයිශු"

"ම්ම් කියන්න"

"මන් පොඩි ප්‍රශ්නෙක ඉන්නේ තයිශු"

"ම්ම්"

"මගේ එෆෙයාර් එක අයියට මාට්ටු උනා තයිශු. එයා ටිකක් කැමති නැ මගේ බෝයි ෆ්‍රෙන්ඩ් ට. අනෙ තයිශු අයියට කියල ප්ලිස් ශේප් එකක් දල දෙන්නකෝ. ප්ලිස්... අනේ තයිශු බෑ කියන්න එපා... අයියා ගහන්නත් ගියා එයාට... එයා දැන් මේක නවත්තන්න ත් හදනවා.. අනේ තයිශු ප්ලිස් මට මේවා කියන්න කෙනෙක් නැ. මේක විසඳන්න පුළුවන් ඔයාට විතරයි ප්ලිස් මට උදව් කරන්නකෝ"

"ම්ම් ඇයි අයියා එයාට අකමැති ඉතින්"

"අනේ මන්දත් නෑ තයිශූ.. මට එයා නැතුව ඉන්න බෑ තයිශූ.. මට මැරෙන්න හිතිලා තියෙන්නේ. "

"ආහ් පිස්සුද රවීනා, එහෙම කතා කියන්න එපා විහිලුවටවත්.. අපි අයියට කියල විසඳගමු"

"අනේ පිං තයිශූ ඔයාට. මට සමාවෙන්න ඔයාට මෙච්චර කල් නරක විදියට සැලකුවට.. මේ ඉන්නේ මගේ බෝයිෆ්‍රෙන්ඩ් "

එයාගේ ෆෝන් එක අරන් ෆොටෝ එකක් පෙන්නුවේ, අම්මෝ හෙන රස්තියාදුකාර පෙනුමක් ඒක. ඇත්තටම අයියා අකමැති උන එක ගැන අහන්න දෙයක් නෙමේ.. ඒත් පෙනුන රස්තියාදු කාර උනාට ගතිගුණ හොද ද දන් නෑ නේ මෙයා මෙච්චර එයාට කැමති වෙන්න.. මේ උනු කිසිම දෙයක් හිතා ගන්න බැරිව අන්දුන් කුන්දුන් වෙලා හිටියේ, ඉවර වෙන වෙලාව එනකම්.ඉවර වෙලා එලියට එන්න හදද්දි..

"මන් ඉක්මනට වොශ් රූම් ගිහින් එන්නම් තයිශූ අරයට කෝල් එකක් ගන්නත් ඕනා.. ගෙදරදි ෆෝන් එක අයියා ගන්නව තයිශූ..ඔයා ගේට් එක ලගට යන්න මන් එන්නම්"

මොකුත් නොකියම ඔලුව වනලා මම ආවේ හිමිට ඇවිදගෙන ගේට් එක ලගට. අයියලා දෙන්නගෙන්

කවුරුවත්ම ඇවිත් තිබ්බේ නෑ. ටිකක් අයිනට වෙලා ඉද්දි එක පාරට ආවේ අර රවීනා පෙන්නුව බෝයි.

"අනේ ඔයා නේද තයිශු කියන්නේ රවීනාගේ නෑනා"

"ඔ.. ඔව්..ඔයා...රවී.."

"අනෙ ඔව් මන් රවීනාගේ බෝයිෆ්‍රෙන්ඩ්.. අනේ මන් එයාව බලන්න ආවේ... දැක්කේ නෑ මේ ටිකේම එයා ඉන්නවද. දැන් එයාලෑ අයියා එයිද.."

වචනෙන් වචනේ කිය කිය එන්න එන්න ලන් වෙනවා වගේ

තේරුනත් ගනන් නොගෙන හිටියේ රවීනාගේ බෝයිෆ්‍රෙන්ඩ් නේ කියල හිතලා.

"ආහ්.. එයා තාම ඇතුලේ.. ඉක්මනට එයි" කියල චුට්ටක් ඈත් උනේ.. ඒ ක්ශනයෙන් ඔහු මගේ අතින් අල්ල ගත්තේ මාව ගැස්සිලා යද්දි

"අනේ ප්ලිස් නංගි. රවීනා කියන්නේ මගේ පණ. අනේ මට එයාව ඕනා. ප්ලිස් ඔයා රකීත්ගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් නේද.. අනේ ඔයාට පුළුවන් නේ රකීත්ව ශේප් කරන්න.. " ඕම ඕම ගගා කියවන් කියවන් ගියේ මිනිත්තු දෙකක් විතරම.

"එක්ස්කියුස් මී අත ගන්නවද"

එතකොටම වගේ එතනට ආවේ රිකී එක්ක රවීනා.

"අයියා මන් තමුසෙට කිව්වා නේද මේ හොරේ අහුවුනේ. තමුසේ බොරුවට මට ගැහුවා රස්තියාදු කාරයෙක් එක්ක යාලු උනා කියල. බලනවා මන් කිව එක ඇත්ත නෙමේද. මන් කිව්වනේ මේ කොල්ලා එක්ක හැමදම කතා කරන්නේ මේකි කියල. හැමදම තමුසෙට මන් බොරු කාරි උනා මේකි පත්තිනි උනා. අද අතටම අහු උනා නේද"

ගත් කටටම චටාස් ගාලා කම්මුල් පාරක් වැදුනේ මට රිකීගෙන්. දෙයියනේ උනේ මොකක්ද කියල තේරුනේ එවෙලේ. ඇයි දෙයියනේ රවීනා මට මෙහෙම කරන්නේ. කදුලු හෝ ගාලා ගලද්දි. මන් එයා දිහාම බලන් හිටියේ මාව මෙච්චර අවිශ්වාසද කියන්න යි.

මට ගහනවත් එක්කම අර කොල්ලා රිකීගේ කොලර් එකෙන් අල්ල ගත්තේ,

"උඹ කවුද යකෝ මගේ කෙල්ලට ගහන්න "කියාගෙන ආයෙම ඌට ගහන්න අත උස්සලත් දත් මිටි කාගෙන පුදුම තරම් කේන්තියෙන් මන් දිහා බලලා

"මේකි ගෙත්ම අහගනින් මන් කවුද කියල "

sinhalaebooks.com

ආයෙත් සැරයක් සියල්ල දවා අලු කරන බැල්මක් දල රවීනවත් ඇදගෙන යන්න ගියේ එතන හිටිය ගොඩක් දෙනෙක්ගේ ඇස් අපේ පැත්තට යොමු වෙලා තියෙද්දි. ඔක්කොම ප්ලෑන් එකක් රවීනලගේ.. කේන්තියයි ඉවසීමයි උපරිම මට්ටමට යද්දි, තවත් බලන් ඉන්න බැරි තැන අත් මිටමොලවගෙන අර පාහරය දිහා බලද්දිම ඌ දිව්වේ පිටිපස්ස නොබලමයි. ආපු කේන්තියට මිට මොලවපු අතින්ම තාප්පෙට ගැහුවේ පිපිරිලා වගේ ලේ විසික් වෙද්දි. හදවත කීතු කීතු වෙලා ගියාක් මෙන් හැඟීමක් දැනෙද්දි තාප්පෙට වාරු දීලා ඉද ගත්තේ කදුලින්මයි.

"අනේ සුද්දි.. මගේ රත්තරන්. මොකද දෙයියෝ උනේ. අනේ අයියට මීටින් එකක් වැටුන මගේ රත්තරන්. ඉක්මනට ඉවර කරන් ආවේ.මන් එනකම් රිකී ඉන්නවා කියල දන්න හින්දයි මැනිකට කෝල් එකක් වත් නොදුන්නේ"

පරක්කු වෙලා උනත් අයියා ආව ගමන් මාව වාරු කරගෙන වාහනේට එක්කන් ගියේ මන් එක දූ වචනයක් වත් කතා නොකරද්දි.

sinhalaebooks.com

## 6 කොටස

"සුද්දි..."

"සුද්දි කතා කරන්නකෝ මැතික මොකද උනේ කෝ රිකී..."

"එක පාරක් කිවමම කතා කරපන් නංගි මගේ මාරයා අවුස්ස

ගන් නැතුව"

"අයියා.."

"කියනව මොකද උනේ"

සියල්ලම අයියට කිවේ රවීනා ගැන කේන්තියෙන් වගේම දුකින්..ඔක්කොම විස්තරේ ඇහුවට පස්සේ අයියා වචනයක් වත් නොකියාම ඩ්‍රයිව් කරන්න පටන් ගත්තා. විනාඩි පහක් 10 ක් විතරම කතාවක් නැති කොට.

"අයියා ඇයි අනේ මොකුත් කියන් නැත්තේ"

"ම්ම්ම්"

"ඇයි මොකුත් කියන් නැත්තේ"

"ඉස්සල්ලාම ඕකට බෙහෙත් දන් ඉමු. ඊට පස්සේ කතා කරමු"

"හ්ම්ම්"

ඩිස්පැන්සරියක් ලගින් නතර කරල බෙහෙත් දන්න එක්කන් ගියේ නෝර්මල් විදියට. අත පුපුරලා නෙමේ අත ගලවලා ගියත් කෑ ගහල අඩල කරල බය වෙන ජාතියේ කෙල්ලෙක් නෙමේ මම කියන්න අයියා දන්නවා.. බෙහෙත් දගෙන ටික දුරක් එද්දි පාරේ අයිනකට කරලා කාර් එක නතර කරේ ලොකු කතාවකට මුල පුරන්න කියල නම් තේරුනා.

"මන් මේ කියන දේ හොඳට අහ ගන්න මගේ චූටි මැනික"

"ම්ම්ම්"

"මගේ රත්තරන් , හිතන්න මෙහෙම. මන් මේ කියන්නේ මගේ රත්තරන් මෙහෙමයි කියල නෙමෙයි හොඳද. ජස්ට් තින්ක්. තිකමට හිතන්න. මට ගර්ල්ෆ්‍රෙන්ඩ් කෙනෙක් හිටියා කියල.. මගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් එක්ක ඔයා බහින් බස් වීමක් වෙලා රණ්ඩු වෙලා අන්තිමට මට ඇවිත් කියනවා අයියා මේමයි මේමයි උනා මේම උනා එයා මේමයි අයියා මට

මෙහෙම කරා මිම් අරෙහෙම කරා කියල අඩාගෙන මාව තුරුල් කරගෙන දුකින් ගොඩක් දුකින් මට ඔය වගේ දෙයක් කිවම මන් ගන්නේ කාගේ පැත්තද. එහෙම නැත්නම් මන් කාව විශ්වාස කරයිද මිම්.. කියන්න මගේ මැනිකම.මන් කාව විශ්වාස කරයිද.."

"මාව"

"අන්න දැක්කා නේද මගේ රත්තරන් ඒකට කියන්නේ ලේ බැදීම. ඇත්තටම මගේ මැනික වැරදි උනත් මට මුලින්ම විශ්වාස අනිත් ඔක්කොටමත් වඩා මගේ මැනිකව. ඒ වගේ වෙලාවක අනික විශේෂයෙන්ම තමන්ගේ ඔළුවත් හරියට වැඩ නැති වෙලාවක මිනිස්සු ගොඩක් බර පැත්තට නැවෙනවා රත්තරන්. ඒක මනුස්ස ස්වභාවය. "

"මිම්ම්"

"රිකීට උනෙත් ඒක මගේ රත්තරන්, රිකීගේ නංගි හැමදෙයක්ම හොදට ප්ලෑන් කරලා අයියා ඉස්සරහම ඒ විදියට අයියට පේන්න සලස්වලා, අන්තිමට කියන්න ඕනිඒවා ටික කියල ගියා. හීනෙකින්වත් ඔහොම දේකට මූණ දෙන්න හිතලා තිබුන් නැති රිකී එවෙලේ එයාගේ නංගිව විශ්වාස කරා. "

"මිම්ම්"

"රත්තරන් මට ඔයා වගේම තමා රිකීට එයාගේ නංගිව මිම්. එකම වෙනස තියෙන්නේ මගේ මැනික ලග තියෙන හොඳ ගතිගුණ එකක් වත් ඒ නංගි ලග නැති වීමයි. සමහර විට. එයා ආස්‍රේ කරපු කරන යාලුවෝ නෑයෝ ඔය කවුරු හරි වේවා හින්ද එයා නරක් වෙලා. අන්න ඒ දේනුයි මගේ මැනිකයි ඒ නංගියි අහසට පොලව වගේ වෙනස් වෙන්නේ."

"මිම්මි"

"මගේ රත්තරන් ට රිදුනද රිකී ගහපු පාර"

ඇස් දෙක ලොකු කරන් බලන් උන්නේ කලින් වෙච්ච සිද්දිය ඔක්කොම කියද්දි මන් රිකී ගැහුව පාර ගැන අයියට නොකියා ඉන්න පරිස්සම් උනා.

"අයියා.."

"ඔයා මගේ නංගි මැනික. රිකී මගේ හොඳම යාලුවා.හොඳම කියන්නේ ඒකත් ලේ බැදීම අඩු කම විතරයි. මට මොනා හරි උනොත් පණ හරි දෙයි. උගට මොනා හරි උනොත් මාත් එහෙමයි. පොඩි කාලේ ඉදන් මේ වෙනකම්ම අපේ සෙට් එකේ නොම්මර එකේ වලි කාරයා. නිකම් ඔහේ ඉන්න උන්ව අවුස්සගෙන ගහලා එන්නේ.. හරි ඉක්මනට කේන්ති යනවා. ගිය වෙලාවට ඔක්කොටම ගහනවා. පස්සේ ඒකාටම දුක හිතෙනව.

පස්සේ තරහ කාරයෙක්ට හරි කමක් නෑ ගිහින් සොරි කියනවා. ඇත්තටම ඔහොම හිටියට හිනා වෙවී විහිලුවෙන් යකෙක් ඔය කේන්ති ගිය වෙලාවට. අයියාට කේන්ති ගියාම දැකල තියේනේ. ඒ වගේම තමා.

මන් මේවා කියන්නේ මගේ රත්තරන් ට හැමදම ඕකාගෙන් ගුටි කකා ඉන්න කියල නෙමේ. මගේ රත්තරන් දැන් මගෙන් හැංගුවේ ඒ දේ මට කේන්ති යයි කියල නේද මිම්. ඒම කරේ රිකීට ආදරේ හින්ද. ඉතින් මගේ හිතකියනව මැනිකගේ ආදරේට පුළුවන් වෙයි කියල අරූගේ ඔය ගතිය අරින්න. තව දෙයක්, එහෙම බෑ කියල හිතෙනවා නම් මැනික ට පුළුවන් අදම මේ හැමදෙයක්ම නතර කරන්න. "

"අනේ බෑ"

"පිස්සි මන් දන්නව බෑ කියන්න. ඔයාට වගේම අරූටත් බෑ. අපි ඌට ටික කාලයක් දෙමු. වැරැද්ද තේරුම් ගන්න. එහෙම නැත්නම් වැරැද්ද එළි කර ගන්න. ඕම හැසිරුනාට මාර විදියට ආදරේ කරනවා මගේ මැනික ඔයාට රිකී. සමහර වෙලාවට ආදරේ වැඩි කමට ඔයවගේ දේවල් වෙනවා මගේ රත්තරන්. ඒ වෙලාවට හිතෙන්න පුළුවන් බලන් ඉන්න කෙනෙක්ට. මේකද ආදරේ. ආදරේ නම් ගහනවද කියල. ඒත් ඒකෙන් මනින්න බෑ රත්තරන් තියෙන ආදරේ . යක්කු වගේ උන්ගේ පපු ඇතුලේ මාර විදියට ආදරේ තියෙනවා. එහෙම නැතුව උපාසක වගේ

ඉඳලා ඔක්කොම කරන් යන තිරිසන්නු ත් ඉන්නවා. ඔය විදියට පාරක් ගැහුවට මගේ මැනිකටත් වඩා ඕකාට රිදෙන්න ඇති මන් දන් නැද්ද හැටි. මගේ රත්තරන් මා එක්ක තරහ වෙනවද අයියා වෙලන් නංගිට ගහපු එකා ගැන මෙහෙම හොඳ කියනවා කියල. "

"අනේ නෑ අයියා"

"නංගිට ගැහුව හින්ද මේ ඔක්කොම මෙතනින් ඉවරයි. උඹට මගේ නංගිව දෙන් නෑ කියල ඕකට මට ගහල එන්න පුළුවන්. හැබැයි එතකොට එතනින් මේ හැම දෙයක්ම ඉවර වෙනවා මැනික. කෙනා ගැන හොඳටම දැන දැනත් චුට්ටක්

ඉවසන් නැතුව හදිසි වෙලා අන්තිමට මගේ මැනිකගේ ජීවිතේට ගැලපෙනම කෙනාව ඈත් කරලා, මන් කර ගන්නේ පවක් වෙනවා. ඔතන රිකී නොයිද වෙන කෙනෙක් හිටියා නම් මෙලහට මන් පොලිසියේ මිම්. "

"අයි ලව් යූ අයියා"

"ලව් යූ ටූ මගේ රත්තරන්. කෝ බලන්න මූණ"

යන්තම් ඇඟිලි වලින් අල්ලලා කම්මුල බැලුවේ සියුම් හිනාවකින්. ඒ හිනාව ඇතුලේ නොකීවට ඒ දේ ගැන දුකක් තිබ්බා කියන එක රහසක් නම් නෙමේ.

"අඩු වෙයි මගේ චූටි මැනික. ගෙදර යමු මි පරක්කු වෙලා"

ආයෙමත් ඩ්‍රයිව් කරන්න ගත්තේ මොනාදෝ ගැන කල්පනා කර කර. මිනිත්තු 10 කින් වගේ ගේට් එකෙන් ඇතුලට දැම්මේ

"අයියා"

"ම්ම්"

"අතට මොකද උනේ ඇහුවොත් අම්මි"

කියල කට ගන්න හම්බුන් නෑ.

"මගේ දෙයියනේ චූටි.. මොනාද ළමයෝ මේ උනේ. මොනාද දෙයියනේ මේ..ඒ පාර මොකක්ද අල්ලපු අඩව්ව."

කලින් බොරුවක් හිතුවේ නැති හින්ද මට කෙලත් ගිලෙද්දි,

"අම්මිගේ චූටි ද්‍රෝණි අදත් කොල්ලෙක්ට ගහල අම්මි.."

මන් අයියා දිහා කන්න වගේ බැලුවේ, වෙන බොරුවක් තිබ්බෙම නැද්ද කියන්න අහන්නයි. දැන් ඉතින් ඉදලා ඉවරයි අම්මිගේ බණ ටික. රේඩියෝ සුවිච් ඔන්.

වන් ටූ ත්‍රී.

"අනේ බලන්නකෝ ආනන්ද, මේ ළමයා හැදෙන විදිය, ගෑණු ළමයෙක් කියල එක දශමයක් ගෑනු ළමයෙක් වගේ හැසිරෙනවද. අර කොල්ලෝ හොඳයි තව. විලි ලැජ්ජාවේ බෑ ස්කූල් ගිහින් ඉවර වෙනකම්ම. අප්පච්චි ප්‍රින්සිපල් හින්ද හොදයි. කොයි වෙලෙත් කාට හරි ගහල ඔෆිස් එකේ. වෙලාවට කවුරුත් දන් නෑ මේ ප්‍රින්සිපල් ගේ දේණි ඈන්ද කියල. නැත්තම් විලි ලැජ්ජාවේ බෑ. දැන් පොලිස් පොතක විතරයි නම ලියවිලා නැත්තේ. ඒකත් බලන්නකෝ ආනන්ද මේ යන විදියට ඉක්මනට ලියවෙයි..ඔයාගේ තමා වැරැද්ද. මේ කෙල්ලව හුරතල් කරනවා එන්න එන්න. දැනුත් බලන්නකෝ ඔයා සද්දේ නැතුව ඉන්න හැටි. "

අම්මිගේ බණ දරා ගන්න බැරි තැන බලන් උන්නු පත්තරේට තවත් මූණ ඔබා ගත්තේ අප්පච්චි මටත් ඇහැක් ගහගෙන..

"ඔය පේනවනේ. සම්පූර්ණයෙන්ම වැරැද්ද ඔයාගේ ආනන්ද. හුරතල් කරනවා වැඩී. ඒ අතින් මගේ කොල්ලා දහෙන් සම්පතක්. ඔහොම කිසි වදයක් දුන් නෑ මට" කියන ගමන් අයියගේ ඔලුව අත ගෑවේ අයියා කොලර් එක උස්සද්දි

"අනේ අම්මි අයියා ඔක්කොටම හපන්. ඔක්කොම කරේ ගෙදර ට හොරෙන්"

sinhalaebooks.com

"මගෙන් තවත්බැනුම් නාහා යනවා කාමරේට "

"පුහ්..පුතණ්ඩියාවම ලොකු කරන් ඉන්නකෝ එහෙනම්. මන් ඉන්නේ මගේ සුදු අප්පච්චි එක්ක. අම්මි නරකයි." කියන ගමන් අප්පච්චි ගේ ඔඩොක්කුවෙන් ඉද ගත්තේ .

"වොශ් එකක් දන් එනා මගේ චූටි" කියන ගමන් අප්පච්චි ඔලුව අත ගෑවේ, අයියටත් ඔලුවට එකක් ඇනගෙනම මන් කාමරේට දුවන් එද්දි.

දවසේ ඉතුරු ටික ඒ විදියට ගෙවුනේ. හිනා වෙවී උනත් උනු සිද්දිය ගැන පුදුම තරම් දුකක් හිතේ තිබ්බා. කවදම හරි රිකී ඇත්ත දැන ගත්තු දවසක ගොඩාක් දුක් වෙයි. ඒත් ඒකට කොච්චර කල් යයිද එතකම්ම මාව ඈත් කරල තියාවි ඒ දේ ගැන නම් හිත මාර විදියට දුක් උනා.. ඒත් අයියා කිවත් වගේ එයාට ටික දවසක් දීලා බලනවා කියල හිතලා මොබයිල් එක ඕෆ් කරේ

හෙට විතරයි යන්න ඕනි මේ සතියට ලෙක්චර්. ඊලගට එන්නේ වීකෙන්ඩ්. ආයෙම ලෙක්චර් යන්න ඕනි සඳුදා. ෆෝන් එක ගෙදර දලා වෙනදා වගේම අයියට කියල ගිහින් ද ගත්තේ ටිකක් වේලාසන, ඕනි උනේ නෑ දකින්න ඒ රුව. එදා නම් කේශාලි ඇවිත් හිටියා. දෙන්නා හොඳට හිනා වෙනවා මට. ගනන් ගන් නැතුව මගේ වැඩේ කරන් ලෙක්චර්ස් වලට හිත යොමු කරන් හිටියේ අනිත්

සියල්ලටම වඩා ඒක වටින හින්ද යි. මේ දවස් ටිකේම ඉවර වෙන වෙලාවට අයියව වේලාසන ගෙන්න ගන්නත් ප්‍රොමිස් කර ගත්තා. හැමදාමත් වගේම ඉවර වෙන වෙලාවට ගේට් එක් ලගට ආවම අයියා එන්න කලින් මන් දැක්කේ ඒ රුව. වැඩිය බලන්න ගියේ නෑ බය හිතුනා. බැන්ඩේජ් කරපි අත දැකල ශොක් උනා වගේ

කියල ත් පෙනුන. ඒත් එක්කම අයියා ආවයින් ඉක්මනට වාහනේට නැගල ගෙදර ආවේ කිසිත් නොකියා....

සති තුනකට පසු ......

කැම්පස් එකේ වැකේශන් සති දෙකේ අන්තිම දවස තමයි අද..අම්මෝහ් ඉතින් අපේ අම්මි මාව මරෝ මරෝ මල් හිටෝ ගන්න එක තමා කරන්නේ... අදත් උදෙන්ම මන් හිටියේ මල් වලට වතුර දදා... තවමත් මගේ ෆෝන් එක නම් ඔන් කරේ නැහැ මන්. එක පාරට... කාර් එකක් ගේට් එකෙන් ඇතුලට දැම්මේ මට හික් ගෑවෙද්දි. ඔව් රිකීගේ කාර් එක. කාර් එකෙන් බහිද්දි මාව දැක්කා. දැක්කා උනත් අම්මි එක්ක හිටිය හින්ද ද කේන්ති යටද දන් නෑ ආයෙම අහක බලා ගත්තා. අම්මි එක්ක නම් හරි ලස්සනට හිනාඋනා.. මොකක්දෝ හදිසියකින් වගේ.. කෙලින්ම ගියේ නම් අයියගේ කාමරේට.. අයියගේ යාලුවෝ සාමාන්‍යයෙන් එනවා යනවා හින්ද අම්මිට නම් ඒක සාමාන්‍ය දෙයක්.. මිනිත්තු 15 කින් විතර ආයෙම ගියා.. එතකොට නම් අඩුම ගානෙ බැලුවේ වත් නෑ මන් දිහා..

"අම්මී..."

"ම්ම්"

"ටී එකක් හදන් බීලා එන්නම්ද මහන්සි අනේ"

කටට ආපු බොරුවක් කියල අම්මි හා කියන්න ත් කලින් පැන්නේ මන් ගේ ඇතුලට. ආවේ මන්ම කියල දැනගෙන

"සුද්දි ඉක්මනට එනවකෝ"

කියන පරක්කුවට අයියගේ කාමරේට දිව්වේ මොකද

බලන්න.

"මැනික, අර නංගි අරූ එක්ක පැනල ගීන් කියන්නේ "

"කවුද අයියා"

"රිකීගේ නංගි ඕයි. අර එදා කොල්ලා එක්ක "

"දෙයියනේ...අනේ පව් අයියා රිකී දෙයියනේ එයාට ගොඩක් දුක ඇති අයියා අනේ හැමදේටමත් වැඩිය පණ වගේ විශ්වාස කරලා අන්තිමට මෙහෙම දෙයක් උනාම.. "

sinhalaebooks.com

"අනේ මන්ද සුද්දි, දැන් මේ ආවේඇයි කියන්න දන්නවද"

"නෑ"

"විස්තරේ කියල මට අරූව මරලා අපේ එකීට ගහලා එන්න ඕනා බන් යමන්ද අහනවා"

"දෙයියනේ"

"මන් කෝමද සුදු යන්නෙ. දැන් මන් ගියා නම් අනිවාර්යයෙන් කොයි ලෝකෙන් හරූ හොයාගෙන ගහල හරි මරලා හරි තමයි එන්නේ දැන් තියෙන දූකටයි කේන්ති යටයි දෙකටම.. අනේ මන්ද සුද්දි මේ වෙන දේවල් "

"අනේ අයියා එයාව තනියම තියන්න එපා මේ වෙලාවේ කවුද දන්නේ තනියම යයිද කියල එයාලව හොයන්"

"නෑ සුද්දි තනියම යැවෙන් නෑ. කොහොමත් මන් තව ටිකකින් එන්නම් යන් කියල යැවෙව්වේ. ඔයත් යමුද සුද්දි.

මටත් වැඩිය මේ වෙලාවේ ඔයා කියන දේ අහාවි. මටත් වැඩිය මේ වෙලාවේ ඔයාවයි ඕනා ඒකාට"

"ඒත්"

sinhalaebooks.com

"ඒත් මේත් නෙමේ ගිහින් ලෑස්ති වෙනවා"

"අම්මිට මොකද කියන්නේ"

"අම්මිට මන් මොනා හරි කියන්නම් ඉක්මනට ලෑස්ති වෙනවා ගිහින්."

අඩියට දෙකට කාමරේට ගිහින් ලෑස්ති උනේ..එද්දි අම්මිට බොරුවකුත් කියල අයියා ටවුන් යනවා කියල. දෙන්නම පුළුවන් ඉක්මනට ආවේ. මගට ඇවිත් රිකීට කෝල් එකක් ගත්තේ අයියා. ෆෝන් එක ආන්ස්වර් කරන් නෑ. ආයේ ආයෙම ගත්තත් ආන්ස්වර් කරන් නෑ.

"සුද්දි ඔයාගේ එකෙන් අරන් බලන්න.."

එද්දි ෆෝන් එක දන් ආව හින්ද ඉක්මනට ඔන් කරලා කෝල් එකක් ගත්තත් ඒ වගේමයි ආන්ස්වර් කරන් නෑ..මොනවද්දේ මැසේජ් නම් ලක්ශයක් විතර ආවාත්. බලන්න වෙලාවක් නැති හින්ද නිකම් හිටියා.

"අපි ගෙදර ගිහින් බලමු සුද්දි"

"මිනිත්තු 30 කින් විතර අපි ආවේ ලස්සන දෙමහල් නිවසකට. අපේ ගෙදර වගේමයි. ලස්සනයි එහෙත්. රිකීගේ කාර් එක පේන්න තුබ්බේ නෑ. කොකටත් ගිහින් බලමුයි

කියල වාහනේ ගේට් එකෙන් ඇතුලට දලා අයියත් එක්කම

හිමිට අඩි තිබ්බේ මන් සාලෙට. අයියා නම් පොඩි කාලේ ඉදන්ම එහෙමයි නේ. ඒත් මන් මේ ආවාමයි. අනේ සාලේ ඒ අම්මා අඩනවා.. පපුව කඩන් යන්න තරම් වේදනාවක් ආවේ ඒ ඇඬුම් ඇහිලයි. දෙයියනේ ඇයි රවීනා මෙච්චර දුකක් දුන්නේ මේ අම්මට තාත්තා ට අයියට.. එක පාරට මාව දැකල "අනේ මගේ දුවේ " කියන් නැගිට්ටත් ඉතුරු අඩි ටික මන් දිහාට හෙමින් පය තිබ්බේ එක පාරට මාව රවීනා විදියට දැකලද්දෝ කියල හිතුනා

"අනේ පුතේ මගේ දුවව එක්කන් ආවා කියල හිතුවේ පුතේ මට සමාවෙන්න " කියමින් මාව වැළඳ ගත්තේ මගේ ඇස් වලටත් කඳුලු උනද්දි.. මොනවා කියන්න ද කියන්න මට තේරෙන් නෑ. කොහොම හදන්නද ඒ හිත්. අයියගේ මූණ දිහා බැලුවේ මොකද කරන්නේ කියල අහන්නයි. එහෙම්ම අයියත් එක්ක ඒ අම්මව වත්තම් කරගෙන ගිහින් සෙටියෙන් ඉන්දෙව්වේ

"ආන්ටි රිකී ගෙදර ආවද"

"අනේ නෑ පුතා ගොඩක් කේන්තියෙන් ගියේ.. ඒ ගිය පාර ආවේ නෑ.."

"එතකොට අන්කල් කෝ"

"එයා පොලිසියට ගියා පුතා.."

"ආන්ටි පරිස්සමට ඉන්න අපි ඉක්මනට එන්නම්" කියල අයියා එලියට යද්දි..

"අම්මා අම්මා පරිස්සමට ඉන්න. අයියා ඉක්මනට ඒවි.. " කියල ඔලුව අත ගෑවේ එයත් අපේ අම්මි වගේම අම්මි කෙනෙක් නේද කියල දුක හිතිලයි. ඉක්මනට මමත් එලියට

ආවෙ රිකී කොහේ යන්න ඇද්ද කියල කල්පනා කර කරයි. සාමාන්‍යයෙන් එයාලා යන එන කැෆේ ශොප් වල කට්ටිය එක්ක පාටි දන තැන් වල පවා බැලුවා ඒත් නෑ පේන්න. ෆෝන් ආන්ස්වර් කරන්නෙත් නෑ. එන පාරේ තිබ්බ සුරුවම දැක්කේ එතකොටයි.

"අයියා අයියා අයියා.."

"මොකද සුද්දි.."

" අයියා අර සුරුවම ලගින් වමට බීච් එකට දන්න.."

"බීච් එකට"

"ඔව් අයියා එද අපි ගියා ඔය බීච් එකට.හරි නිදහස්. වැඩිය සෙනග නෑ"

"එතන ඇති කියල හිතනවද.."

"දන් නෑ අයියා නිකමට හිතෙනවා"

මිනිත්තු පහකින් අපිආවේ එදා ආපු බීච් එකට. හිතුවා වගේම එයාගෙ කාර් එක තියෙනවා. ඈතින් රැල්ල දිහා බලාගෙන එයත් ඉන්නවා.

"සුද්දි ගිහින් බලන්නකෝ රත්තරන් කතා කරලා"

"අයියා එන් නැද්ද..."

"නෑ මැනික. මේ තියෙන තත්වෙ උඩ අර කෙල්ල ගියේ කොහෙද කොහෙද ඉන්නේ කියනඑකවත් අඩුම ගානේ

හොයා ගන්න ඕනානේ. මන් යනවා අපේ සෙට් එකට එක්කන් එන්න. අපි ටිකක් හොයල බලන්නම්. ඕකට පරිස්සමට එක්කන් යන්න ගෙදර හරිද සුද්දි.."

"අයියා ඒත් මට බයයිනේ තාම මාත් එක්ක කේන්තියෙන් ද දන් නෑ නේ."

"පිස්සුද රත්තරන්.. ඔක්කොම එලි වෙලා තියෙද්දී, තාමත් කේන්තියෙන් ඉන්න. යන්න ගිහින් කතා කරන්න ටිකක්.. මන් ඉක්මනට එන්නම් "

"හා අයියා " කියල පරිස්සමට අඩි තිබ්බේ ඔහු කිට්ටුවට. දැක්කේ නැ තාම මන් ආවා කියන්න.

## 7 කොටස

මුහුද දිහා බලාගෙන බර කල්පනාවක. හරි දුකින් ඒ මූණ. අනේ පව් දෙයියනේ.. එක පාර ඉස්සරහට ගිහින් හිටගන්නත් බයයි. කියන්නේ මොනවද කියල තේරෙනෙත් නැ. ඕනි දෙයක් වෙච්චාවේ කියල ලගටම ගිහින් හිට ගත්තේ බිම බලාගෙනමයි. තත්පර ගානක් යනකම්ම නැ කිසි ප්‍රතිචාරයක්. ඒ හින්දම ඔලුව උස්සලා බැලුවේ බයෙන් බයෙන්.දෙයියනේ ඒ ඇස් වල කඳුලු. ඒ ක්ෂනයෙන්ම මට පුළුවන් උපරිම තදින් වැළඳ ගත්තේ මගෙත් ඇස් වලට කදුලු උනද්දි.

"මගේ රත්තරන් මට සමාව දෙන්න පුළුවන් ද මගේ රත්තරන් මගේ මැනිකට ගැහුවට මෙච්චර දවසක් ඇත් කරල තිබ්බට "

පපුවේ මූණ හොවාගෙනම ඔව් කියන්න ඔලුව වැනුවේ එයත් හරි ආදරෙන් ඔලුව අත ගාද්දි.

"මගේ දෙයියෝ.. මන් එදා අසරණ උනා මගේ රත්තරන්.

එදාට කලින් දවසේ මන් ඔය හල්ලව දැක්කේ අපේ ගෙවල් ලග ඊට කලිනුත් දවස් දෙක තුනක් දැක්කා. ඊට පස්සේ නංගිගෙන් ඇහුවමම මට කිවෙම මැනිකගේ පස්සෙන් එන්නේ ඌ, මැනිකගේ යාලුවෝ හින්දා එයාලට වද දිදී සෙට් කරලා දෙන්න කියනවලු ගගා. මන් ගනන් ගත්තේ නෑ රත්තරන් ඒ කිව දේවල්, ඒත් එදා රෑ මේ මහ රෑ අපේ ගෙදර ඉස්සරහ හිටියා ඒකත් නංගි එක්ක කතා කර කර. ගැහුවා මන් හොඳටම අපේ එකීට. ඒකත් අඩ අඩම කිවේ ඒ ආවෙත් ඔයා ගැනම අහන්න කියල මයි.

පහුවදා මන් ආවේ නෑ අප්පච්චි ආවේ නංගිව එක්කන්. මන් උදේ ඉදන් අපේ නංගිව ෆලෝ කරා ඌව ෆලෝ කරා. ඒත් හම්බුන් නෑ මට. හවස එද්දි අච්චර කියලත් පිලිනොගත්තු දේ ඇස් පනා පිට දකිද්දි මාව පිච්චුනා රත්තරන්..එහෙම දේකට ලෑස්ති වෙලා හිටියේ නෑ මගේ රත්තරන් මන්.. අඩුම ගානේ හීනෙකින් වත් හිතල තිබුන් නෑ එහෙම දෙයක්.. කලින් දවස් වල කියපු ඔක්කොමත් මතක් වෙලා මට ඉවසගන්න බැරි උනා මගේ රත්තරන් ..දරා ගන්න බැරි උනා මට සමාවෙන මගේ දෙයියෝ.. මන් කොහොමද මගේ රත්තරන් බලන් ඉන්නේ ඔයා වෙන කෙනෙක් එක්ක ඉන්නවා. එක විනාඩියකට හරි ලං වෙලා..

එදා ඒම වෙලා ගෙදර ගියාම නංගි මට ෆොටෝස් ටිකක්

පෙන්නුවා රත්තරන්.. කවුරු හරි එතන ඉදන් මැනිකගේ අතින් අර හල්ලා අල්ලන් ඉන්න එක ෆොටෝස් ගහල තියෙනවා.. ඕව දිහා සති දෙකක් පුරා බලන් හිටියේ මන් පිච්චි පිච්චි මගේ රත්තරන්.. සති දෙකක් පුරාම ඒ හල්ල නංගිත් එක්ක කතා කරේ වත් හම්බෙන්න ආවේ වත් දැක්කේ වත් නෑ රත්තරන්..

මේ වෙනකම් හිත කිවෙම මැනිකට එහෙම දෙයක් කරන්න බෑ.. ඒ ඔක්කොම බොරු කියල.. ඒක හරියටම ඔප්පු උනේ

ඊයේ රෑ මගේ රත්තරන් .. ඊයේ රෑ අපේ එකී අර හල්ලා එක්ක පැනල ගිහින්.. මන් පොඩි කාලේ ඉදන් ඇහැක් වගේ පරිස්සම් කරපු මගේ නංගි.. ඇත්තටම ඇහැක් වගේ පරිස්සම් කරා නම් එයා එහෙම නොයන්න තිබුනා.. ඔයයි අයියයි වගේ කිට්ටු උන් නෑ අපි. ඇත්තටම එහෙම උනා නම් එයා ඔහොම කරන එකකුත් නෑ.. වැරැද්ද මගෙද රත්තරන් "

ඔලුව අත ගගහා උගුරෙන් වගේ හැම දෙයක්ම කිවේ මන් ඒ තුරුලේ ඉදගෙන ඒ පපුවේ මූණ හොවා ගෙන ඒ සියල්ල අහන් ඉද්දි. තේරෙන් නෑ මට කියන්න ඕනි මොනවද හිත හදන්න ඕනි කොහොමද කියන්න. මොකුත් නොකියා ඉන්න බැරි කමට යන්තම් ඔලුව උස්සලා

"අයියා වැරදි නෑ"

"ම්ම්ම්... ඔයා මට සමාව දෙනවද මැනික.."

මොකුත් නොකියා ඔලුව වැනුවත් ඇස් දෙකෙන් කඳුලු වැක්කෙරෙනවා..

"නාඩ ඉන්න මගේ රත්තරන් ... ආයෙම කවමදාවත් මගේ මැනිකව එක තත්ත්පරේකට වත් තනි කරන් නැ මන්.."

"ප්‍රොමිස්"

"ප්‍රොමිස් මගේ රත්තරන් "

"ඕම ප්‍රොමිස් කියල බැ නේ..තයිශු ප්‍රොමිස් කියන්න"

ලා හිනාවක් ඇදුනේ මටත් යන්තම් හිනාවක් එද්දි. ලන්

කරගෙන තළලට හාදුවක් දෙන ගමන් ඇහෙන නෑහෙන ගානට "තයිශු ප්‍රොමිස්" කිවේ මගේ ඇස් වල කඳුලු පිහිදන ගමන්

"ඇයි පැංචි නංගි එහෙම තීරණයක් ගත්තේ"

බර සුසුම් හෙලමින් එහෙම අහද්දි පපුව කඩන් යන්න තරම් දුකක් ඇති උනේ ඔහු ගැනයි. අරෙහෙන් අම්මා අප්පච්චි හූල්ලනවා. මෙහෙන් අයියා හූල්ලනවා. ඇත්තටම

ඇයි හැඟීම් වලට වහල වෙලා මේ වගේ තීරණ ගන්නේ.. ඊට වඩා හොඳ විසඳුම් ඇත්තෙම නැද්ද.. එයාට තුරුල් වෙලා කියන දෙයක් අහන් ඉන්නව ඇරෙන්න මට කරන්න දෙයක් කියන්න දෙයක් ඉතුරු වෙලා තිබ්බෙ නෑ.

"අම්මි අරෙහේ හූල්ලනවා පැංචි"

"ම්ම් අපි එහේ ගිහින් ආවේ අයියා"

"මාව හොයන්න ගියාද මිමි"

"ම්ම්ම් ඔව්"

"අම්මි අඩනවා නේද පැංචි.."

"හ්ම්ම් මාව එක පාරට දැකල තියෙන්නේ රවීනා වගේ මාව තුරුල් කරගෙන ගොඩාක් ඇඩුවා අයියා"

"ම්ම්ම් පව් පැංචි අම්මි"

"අපිට බැරිද එයාව එක්කන් එන්න"

ඉදල ඉදල කටින් පැත්තෙම ඒ වගේ දෙයක්. කේන්ති යයිද කියල බය හිතුවේ වචනේ පිට උනාට පස්සෙයි. ඒ ටික ඇහුන ක්ශනයෙන් මාව මදක් ඈත් කලේ බයට කෙලත් ගිලෙද්දි

sinhalaebooks.com

"මන් මොකෙක් කියලද හිතන් ඉන්නේ. මෙහෙම දුක් උනා කියෙව්වා කියල පො****ක් කියල හිතුවද. ගෙදරින් ගිය උන්ව ආයෙම ගෙදර ට වද්ද ගන්න. ඒකි ගිය එක ගැන දුකක් විතරයි ද තියෙනව කියල හිතුවේ. නැ යකෝ නැ. මුලින්ම මට දුක හිතුනේ තමුසේ ගැන. අපේ එකීගේ වචනේ අහල මන් තමුසෙට දුක් දුන්න එක ගැන. ඒක දැන් හරිනේ. දැන් මට දුක තියෙන්නේ අම්මි අප්පච්චි ගැන. මේ තියෙන තරහට නංගිවයි අරුවයි දෙන්නවම මරලා දන්න පුළුවන් මට. අර හල්ලා ඕකා ඉතුරු වෙලා ඉන්නේ ශේලා මන් එක්ක ආපු නැති හින්ද විතරයි. කොයි වෙලේක හරි ඉන්න තැනක් හම්බෙයි නේ. එදාට ඕකාව මරනව මන්"

හොදටම සද්දෙට කෑ ගහන් ගියේ ඒ හිතේ දුක විතරක්ම නෙමේ ඊටත් වඩා කේන්තියක් තියෙන්නේ කියල මට තේරෙද්දි. බයයි ඒ කේන්තියට මන්. බලන් ඉන්න බැරිම තැන ඇස් වලට කදුලු උනන්න ගත්තේ ආයෙමත් බයටමයි. ගැහුවත් කමක් නැ කියල හිතලා තවත් බලන් ඉන්න බැරි තැන ඒ පපුවට ගුලි උනේ අච්චර හයියෙන් කෑ ගහපු ඒ වචන ඉබේම නතර වෙද්දි. චුට්ටක් වෙලා ඉදලා තුරුලේ ඉදගෙනම ආයෙම ඔලුව උස්සලා බැලුවේ. හරි ආදරෙන් බලන් ඉන්නවා මන් දිහා

"ඇයි ඕම බලන්නේ"

sinhalaebooks.com

"තිවෙනවා මගේ රත්තරන්"

"ඇයි තිවෙන්න එපාද.."

"අනේ නෑ තිවෙන්න තිවෙන්න හුම්"

යන්තම් හිනාවක්. හොදටම හිනා වෙන්නේ කොහොමද මෙච්චර ප්‍රශ්න තියාගෙන.

"මගේ රත්තරන් "

"ම්ම්ම්"

"කොච්චර රිදුනත් කොච්චර ඕනි උනත්, කොච්චර වැළපුනත්, එයාටම ඕනි වෙලා ආවත්, කොච්චර සමාව ගත්තත් ආයෙම එයාට අපේ ගෙදර ඉඩක් නෑ..කොටින්ම මගේ හිතෙත් ඉඩක් නෑ.. ඒයේ මගේ නංගි මැරුනා"

"ආහ්"

"ම්ම් ඔව්. ඒ හින්දා ආයෙම මත් එක්ක ඔය දේ ගැන කියන්න ඇවිත් මාව කේන්ති ගස්සන්නෙපා හොදද"

"හුම්"

"අපි දැන් යමු"

sinhalaebooks.com

"කොහෙද"

"ඔයාව ගෙදරින් දුල මට යන්න ඕනා අර හල්ලා අරකි එක්ක ගියේ කොහෙද කියල හොයන්න. හොයන් ගිහින් මරනවා මන් ඕකාව"

"අනේ තිවෙන්නකෝ"

ලා හිනාවක් ආයෙමත්

"ඇයි ම්ම්.. හිනා යනවා මෝඩ් බයෙන් බයෙන් කතා කරන විදියට "

"බයයි තමයි මන් ඔයා කේන්ති ගන්නකොට"

"අයියා.."

"ම්ම්ම්"

"පිලිගන්න කොච්චර අකමැති උනත් දැන් ඊයේ රෑ ඉදන් ඒ දෙන්නා හස්බන්ඩ් ඇන්ඩ් වයිෆ් නේද අයියා ඔයාගේ තරහට ඔයා ඒ බෝයිට මොනා හරි කරොත් රවීනටමයි නේද ඒක බලපාන්නේ එතනින් රවීනාගේ අනාගතේම අඳුරු වෙනවා නේද ඔයාට පුළුවන් වේවිද ඊට පස්සේ එයාට හොඳ හොඳ හස්බන්ඩ්

කෙනෙක්ව හොයල දෙන්න"

"හොඳ හස්බන්ඩ් කෙනෙක්.. ඌ හොද හස්බන්ඩ් කෙනෙක්ද යකෝ. රස්තියාදුකාර හල්ලා. ඔයාගේ අතින් අල්ලන් පැනිය දුපු හැටි දැක්කනේ සුදු. ඕකා නංගි එක්ක ඉදීද කියල තමයි මට සැක. ඔය වගේ උන් එක ගෑනියෙක් ගෙන් සෑහෙයි කියල කොහොමද කියන්න පුළුවන්.. ඔයා මාව කේන්ති ගස්සනවා සුදු ඔය ගැන කතා කරලා. ඊට පස්සේ අඩන්න ගන්න එපා"

"ශ්.... තිවෙන්නකෝ මැතික"

ඒ පාර හිනාවක්

"ඇයි හිනා වෙන්නේ"

"අයියා.. අයියා.. අයියා.. ගගා ඉන්නව ඇරෙන්න ඔය කටින් ඕම වචනයක් පිට උනාමද කොහෙද"

"ආහ් හා ඒනම් හැමදම කියන්නම්කෝ මන්"

"පිස්සි මගේ... මෙතනට ආවේ පුදුම විදියට ඇවිලි ඇවිලි මන්.. දැන් නිවිලා මාර විදියට.. හිතුනා අයියත් එක්ක අනිවාර්යයෙන් ඔයත් ඒව් කියල දැන ගත්තම.. "

"ම්ම්ම්ම්"

"ඒක නෙමේ කෝ ශේලා.. කොහෙද ගියේ ඔයාව දලා"

"ආහ් අයියා ගියා"

"ඕ කොහෙද ගියේ.."

"එයා මේ ඔයාලෑ යාලුවෝ සෙට් එකත් එක්ක රවීනා කොහෙද කියල බලල එන්නම් කියල ගියා"

"මිම් එහෙමද මාත් යන්න ඕනා"

"අනේ ඔයා ඉමුකෝ.."

"බෑ බෑ චූටි මත් යන්න ඕනා.."

"අනේ ගිහින් රණ්ඩු වෙනවනේ ඔයා"

"සුදූ... මත් කිව්වා එක පාරක්"

"අනේ හරි මගේ පණ.. ඔයාගේ කේන්තිය සාදරණයි අනේ ඒත් චූට්ටක් ඉවසමුකෝ අපි කේන්ති ගත්තා කියල තවත් ප්‍රශ්න වැඩි වෙනව මිසක් අඩු වෙන්නේ වත් ප්‍රශ්නේ ඉවර වෙන්නෙවත් නෑ නේද"

ආයෙමත් චූටි හිනාවක්

sinhalaebooks.com

"ඇයි ඒ පාර හිනා වෙන්නේ"

"කොහෙන්ද ඔය ලොකු කතා කිය කිය උපදෙස් දෙන්න පුරුදු උනේ මිමි මගේ චුටි කෙල්ල"

"එදා ඔයා මාව දාල ගියාම අයියා කියල දුන්නේ අයියා තමයි ගොඩා..........ක් දේවල් කියල කියල හිත හැදුවේ"

"අයියට පිං මැනික.. මගේ මැනිකට හම්බෙලා තියෙන්නේ ලේසියෙන් කාටවත් හම්බෙන් නැති අයියා කෙනෙක්.."

"ඔයත් එහෙමයි මට"

කියල කට ගන්න හම්බුන් නෑ.. "කෝ මෙන්න මෙහෙ එනවා සති දෙකකින් තුනකින් විතර බර බලන්නත් බැරි උනා " කියල හරහට අත් දෙකට අරන් හැරුනේ කාර් එකට යන්නයි.

"අනේ... චුට්ටක් අර පැත්තට යන්කෝ.. චුට්ටියක් රැල්ල පාගන්න"

"අපෝ මෝඩි කොච්චර පෑගුවත් ඕක ඇති වෙන් නැද්ද ඇත්තටම ආහ්.."

"තිවෙනවා ඒකට"

sinhalaebooks.com

"ආහ්.. මගේ වචන ජෝක් එකට ගත්තද ආහ්"

"නෑ නෑ මගේ මෝඩයෝ එන්නකෝ මන් කියනවටට..හෝ ගගා සද්දෙට එන රැල්ල.. කොච්චර අව්ව උනත් රැල්ලත් එක්කම මූදේ ඉදන් එන හුලන් පාර.. අවට තියෙන හුලඟ එක්ක සීතල රැල්ලක් කකුලට පෑගෙද්දි වැලිත් එක්ක දැනෙන සතීපේ.. විඳලා බලන්නකෝ ශෝයි හුස්මක් අරන් ඇග හොදට සැහැල්ලු කරලා.."

රහ කර කර කියෝ කියෝ අතින් ඇදන් එක්කන් ගියේ රැල්ල පාගන්නයි. චුට්ටක් වෙලා රැල්ල පාග පාග හිටියේ කෝලම් කර කරයි

" ඔයා හරි ශෝයි මගේ පැංචි"

"ඇයි"

"අවුරුදු 20 ක් උනත් අවුරුදු පහේ චූටි බබෙක් වගේ පරිසරය විදින්නේ.."

"පරිසරය විදින්න වයස බලපානවද මගේ වහු පැටියෝ"

"ආහ්.."

"රැවුල තිබ්බට මොලේ නෑ නේ අප්පා"

"ඇත්තමයි රත්තරන් .. මමත් අවුරුදු 25ක් තිස්සේ බීච් ආවට රැල්ල පැගුවට.. අදයි මමත් මේක වින්දේ.. ඇත්තෙන්ම තිවෙනවා.."

"ඒකනේ මන් කිවේ..."

"දැන් යමු මගේ හාවි.. මගේ පිංකාරි.. "

"යමු"

"සුළඟ වගේ..දඟකරන..
එති එතී.. ළඟ රැදෙන..
ඔයා වගේ..හිත තිවන...........
හා...වනා.....වක්... කොහෙද......"

පුදුම තරම් ලස්සනකට ඒ පද මිමිණුවේ මගේ අතින් අල්ලන් ආපහු කාර් එකට යන ගමන්..

"අනේ ඒක හරි ලස්සනයි අයියා.. ඔච්චර ලස්සනට සිංදු කියන්න පුලුවන්ද දෙයියනේ"

"ලේසියෙන් කියන් නෑ හිතුනම කියනවා මිම්"

"බෑ බෑ බෑ බෑ... මන් කියන වෙලාවට කියන්න ඕනි හාද ප්ලීස් "

sinhalaebooks.com

"මෝඩි මගේ යමු යමු.. ගෙදර යන්න ඕනි අම්මිව බලන්න.."

ඉක්මනට කාර් එකට ඇවිදින් අපි පිටත් උනේ ගෙදර එන්නයි. එන ගමන්

"මාව ගෙදරින් දන් යනවද"

"බැ ඔයා යන් මා එක්ක "

"ආහ්"

"ඇයි...ම්ම්"

"අම්මි බලයි මොකද කියල "

"අම්මිට මන් කියල තියෙන්නේ මෝඩි"

"දෙයියනේ බොරු නේද"

"බොරු නෙමේ දෙයියෝ..එද කෑම්ප් ගිහින් ආව දයි මන් අම්මිමිට කිවේ කවදහරි මන් මැරි කරනවා නම් කරන්නේ ශේල් ගේ නංගිව විතරයි කියල "

"පස්සේ"

"පස්සේ කියන්නේ ඉතින් ෆොටෝ පෙන්නුවා.. ඔයා ගැන කිව්වා.. ශේල් ගේ නංගි කිවම අම්මි අප්පච්චි උඩින්ම කැමති.."

"ඈහ් දෙයියනේ එතකොට අද මන් ගිහින් තියෙන්නේ අම්මි දැනගෙන ඉද්දිද"

"යෙප්"

"හුම් මරු හැබැයි"

"බය නැතුව ඉන්නව මෝඩි"

"හා හා ඉතින් බය වෙන්නෙපා කිවම තමා බය හිතෙන්නේ හුම්"

විනාඩි 45 කින් විතර අපි ආවේ ආයෙමත් රිකීගේ ගෙදර ට.

## 8 කොටස

අවුරුදු දෙකාමාරකට පසු. . . . . .

දින සති මාස අවුරුදු ගනන් ගෙවිලා ගියේ අපිටත් නොදැනිමයි. රිකීගේ අම්මි අප්පච්චි නෝර්මල් වෙන්න නම් සෑහෙන කාලයක් ගියා..හැබැයි අන්තිමට දූව කොහේ හරි සතුටින්නේ ඉන්නවා ඇත්තේ හිතලා ඒ අයත් නෝර්මල් උනා..රිකී නම් තාමත් තරහින්. රවීනා එයාගේ ජීවිතේ ආදරේ හොයන් ගිහින් අවුරුදු දෙකාමාරක්.. මමත් මගේ ඩිග්‍රියේ ෆයිනල් ඉයර් එකේ.. රිකී තමයි දැන් එයාලැ අප්පච්චි ගේ බිස්නස් වැඩ ඔක්කොම බලන්නේ අපේ අයියා වගේම

එයා මීටින් එකක් ඉවර වෙලා එනකම් මන් හිටියේ එයාගේ කැබින් එකට වෙලයි. ලොකු බිල්ඩින් එකට උඩම තට්ටුවේ ඈත ඉදන් පේන බීච් එක දිහා බලන් කල්පනා කරේ රවීනා ගැනයි.

"මගේ පැංචි..ගොඩක් වෙලාද ඇවිල්ලා.."

පිටිපස්සෙන් ඇවිත් තුරුල් උනේ මගේ බන්ඩිය වටේ අත් පටලගෙන උරහිසට එයාගේ ඔලුව තියාගෙන.

"චුට්ටක් වෙලා මිම්මි ඇවිත්"

"කෑම කෑවද මිමි"

"නෑ කන්නෝනි.."

"කමු කමු කෑම ගෙනෙයි දැන් මගේ චූටි කෙල්ල දැන් ලොකු වෙලා නේ ආහ්"

"ලොකුයි තමා හුම් දැන් 24 ක් වෙන්න එන්නේ ඔයා තමා නාකි "

"ආහ් ඇත්තද.. මන් නාකි වෙන්නේ ඔහේගේ ඔය ඩිග්‍රිය ඉවර වෙනකම් බලන් ඉදල තමා අනික මට නම් ඔහේ හරි ඉන්නවා. අර ශේලාට මොකද වෙලා තියෙන්නේ .. මැරි කරන අදහසක් නැද්ද ඕයි. "

"අනේ මන්ද අයියා.. අයියා දැන් මාස තුනක හතරක වෙලේ ඉදන් වැඩි හරියක් ගෙදර නෑ.. ඉන්න වෙලාවට නම් මා එක්කමයි. අනෙ මන්ද ඔෆිස් යනවා කියල යනවා.. රෑට රෑ වෙලා ගෙදර එනවා.."

"කෙල්ලෙක් වත් සෙට් වෙලාද දන් නෑ ඕකාට"

"හිනා නෙමේ අනේ ඇත්තටම කියන්නේ මන්"

"හරි පැංචි ඉතින් ඌටත් කියල පෞද්ගලික ජීවිතයක්

තියෙන්න එපැයි.. හැමදේම ඔයාට කියන්න ත් බෑ නේ මැනික මිමි"

"අනේ ඒම නෑ අයියා ඔයා දන්නවනේ අයියා මට හැමදෙයක්ම කියනවා. ඒත් දැන් මාස තුනක හතරක වෙලේ ඉදන් ගෙදර ත් නෑ.."

"හරි දැන් පැංචිට මොකක්ද කරන්න ඕනි මිමි.."

"මට එයාව ෆලෝ කරන්න ඕනි.. ඇත්තටම මොකද කරන්නේ බලන්න "

"ආහ් තමුසේ රහස් පරීක්ශණයක් කරන්නද අයියා ගැන"

"ඕ යෙස් ඉන්ඩීඩ් ඔයා තමා ඒකට මට උදව් කරන්න ඕනා ඕකේ.."

"යකෝ මගේ මේ තියෙන වැඩ රාජකාරි ඔක්කොම පැත්තකින් තියලා යමන්කෝ මේකාගේ හොර අල්ලන්න එහෙමද කියන්නේ "

තවත් මොනා හරි කියන්න කට ගද්දිම සේව් කරල නැති නම්බර් එකකින් කෝල් එකක් ආවේ මගේ ෆෝන් එකට..

"හෙලෝ"

"හෙලෝ මේ පාරු නංගි නේද"

හොදට අහල පුරුදු ගර්ල් කෙනෙක්ගේ කටහඬක් ඒත් ඒ කටහඬ වෙව්ලනවා. අඩනවා වගේ හරියට..

"ඔව්... කවුද මේ"

"චූටි මැනික මන් හිරුදි අක්කා.. හිරුන්ගේ අක්කා."

"දෙයියනේ අක්කි ඇයි මේ අඩන්නේ මොකද උනේ.. "

"මැනික.. අම්මා නැති උනා මැනික අපේ.. ඔයාට පුළුවන් ද

ඉක්මනට මෙහෙට එන්න.."

තවත් මොකුත් කියන්න කලින් කෝල් එක කට් උනේ. මන් රිකී දිහා බලද්දි..

"ඇයි පැංචි මොකද උනේ කවුද කතා කරේ.."

"අනේ අයියා හිරුන්ව මතකද අර අර කැම්පින් එකේ හිරුන්ව.. අනේ අයියා එයාගේ අම්මි නැති වෙලා. මට එයාගේ අක්කි කෝල් කරේ..එන්න බැරිද අහනවා "

"මට මතකයි රත්තරන්... අපි ගිහින් බලල එමු.. හොද

ද"

"හා"

"ඒත් මෙහෙම යන්න බෑ නේ සුද්දි.. අපි සුදු ඇදුමක් දන් යමු නේද.."

"හා"

ඉක්මනට එයත් එක්කම ගීත් ඉස්සල්ලාම එයාලෑ ගෙදර ගිහින් එයාට ඇදුමක් දගෙන. ඊලගට අපේ ගෙදර ගිහින් මට ඇදුමක් දන් පිටත් උනේ අපි හිරුලෑ ගෙදර. ගෙවල් දෙකෙන්ම මේ වෙද්දි දන්න හින්දු.. අපි දෙන්නගෙන් කාටවත් ඒ වගේ ප්‍රශ්න තිබ්බේ නෑ.. හැමෝගෙම ආශිර්වාදය අපිට තිබ්බා.

හිරුදි අක්කීගේ කෝල් එකෙන් පස්සේ ඉස්කෝලේ හිටපු සෙට් එකේ හැමෝටම පණිවිඩය දුන්නයින්. හැමෝම එනවා කියල කිවා. දුනී , මිහානා, මිනූ , ඈන් , දිනිඳු , අශස් , ගීශාන් , යසිරු ඔයහැමෝම ඉක්මනට එනවා කිවා. ගොඩක් අය නම් ගිහින් තිබ්බා අනිත් අයත් එයි ඉක්මනට . අපේ ගෙදර ඉදන්

මිනිත්තු 20ක විතර දුරක් හින්ද ඉක්මනට ඒගන්න පුළුවන් උනා. මාව ඈත තියාම අදුන ගත්තු හිරුදි අක්කා ගේට් එක ළගටම ඇවිත් මගේ අතින් අල්ල ගත්තේ

කදුලින්මයි.

"ආවා නේද රත්තරන් .. එන එකක් නෑ කියල හිතුනා.."

"ආවා අක්කි..අනිත් අයත් ඒවි ඉක්මනටම.. හිරූ කෝ අක්කි.."

"යාලුවෝ කීප දෙනෙක් ආවා මැනික. හිරූ ඉන්නවා රත්තරන් .. ඊයේ ඉදන් කිසිම කෑමක් කන් නෑ.. බලාගත්තු අත බලන් ඉන්නවා.. අඩුම ගානේ මත් එක්ක වත් කතා කරන් නෑ.. හැමෝම අඩලා හරු දූක පිට කරද්දි එය හිර කරගෙන ඉන්නවා මැනික බලන් ඉන්න දූකයි. බැරිම තැනයි මට ඔයාට ගන්න හිතුනේ රත්තරන් .. "

අක්කි විස්තරේ කිය කිය අඩනවා හොදටම. කොහොම නාඩා ඉන්නද අම්මෙක් තාත්තෙක් ගේ උණුහුම නැතිවෙනවා කියද්දි.. ඒ ගැන හිතද්දිත් බය හිතෙනවා දූක හිතෙනවා.. රිකිත් පසෙක ඉදන් සියල්ල අහන් හිටියේ ඇස් වලින් ඇතුලට යන්න කියල ලා හිනාවක් එක්ක මට ඉගි කරද්දි..

"ඔයත් එන්නකෝ"

"පැංච් ගිහින් එන්න.. මත් කාර් එකෙන් ඉන්නම්.."

"එන්න මල්ලි අපේ අම්මව බලල එමු.." අක්කි කිවේ එයා දිහා බලලයි.

දෙන්නම ඇතුලට ගියේ. අනේ නදී ඇන්ටි.. පපුව එකසිය

ගානට ගැහෙන්න පටන් ගද්දි, මට සිහි උනේම මගේ අම්මි වගේම අම්මි කෙනෙක් නේද දෙයියනේ මේ දරුවෝ දෙන්නව තනි කරල නිහඬව නිදියන් ඉන්නේ මේ කියල. හරිම තැන්පත් ඒ රුව. හරි ලස්සනයි ඒ රුව. කිසිඳු හැඟීමක් නැතුව සතුටත් නැති දුකකුත් නැති මුහුණක් එක්ක ඇය සුව නින්දක. ඇස් වලට කඳුලු ඉනුවේ.. ඇයද මට මවක් වූ අවස්ථා නැතුවාම නොවේ. කොයි වෙලෙත් ස්ටඩීස් වලට අරකට මේකට මේ ගෙදර දිවේ අපි පොඩි කාලේ ඉඳන්මයි. පොඩි කාලේ ඉඳන්ම අපි ගැන හොයල් බලල පාඩම් කරන වෙලාවල් වල කෑම බීම හදලා දීලා හොද තරක කියල දීලා.. ක්ලස් එකේ කපල් එක්ක දූනී ගී ට උපදෙස් පවා දෙන්නේ ඇයයි. ඇත්තටම මිතුරෙකු හා සමානයි. අනිත් හැමෝටමත් වඩා මට හරි සමීපයි ඇය. කඳුලින්ම රිකී දිහා බැලුවේ ඔහු ඔළුව අත ගාල ලගට ගද්දියි.

"ශ්.....නාඩ ඉන්න මගේ රත්තරන්.. ඒ අම්මා හොද තැනකට යන්න ඇති මගේ දෙයියෝ.."

"එයා දිව්‍යලෝකේ යන්න ඇති නේද අයියා.."

sinhalaebooks.com

"ඔව් මැනික එයා දිව්‍යලෝකෙට යන්න ඇති මිම්.."

"හ්ම්ම් දුකයි මට"

"මටත් දුකයි මගේ රත්තරන්..."

"හ්ම්ම්ම්"

ඒත් එක්කම වගේ දුනීලත් ආවේ රිකී ටිකක් පසෙකට වෙද්දි. ටික වෙලාවකින් ගෙදර එලියේ තිබුනු කාමරයේ ඉදන් හිරු එලියට ආවෙ අපේ ඇස් උඩ යද්දි, අපිලිවෙල කොන්ඩේ කාලෙකින් කපා නොතිබුන කොන්ඩේ. අම්මා අසනීප වුනු

දවසේ ඉදන්ම ඔහොමයි කියල අක්කා කිවේ.. අනේ මේ ඉන්නේ රජයේ පිලිගත් ආයතනයක භාශා පරිවර්ථකයෙක් කියල කිව්වැකිද දෙයියනේ.. හැමෝගෙම මූණුදිහා බලල අම්මා දිහ බලන්න යද්දිම ඇස් කොනෙන් ඔහු දැක්කේ මාවයි. හිතන්න තත්පරයක් වත් නොතියා අඩියට දෙකට ඇවිත් වැළඳ ගත්තේ දුකට වගේම රිකී ගැන තිබ්බ බයට මගේ ඇස් පිය වෙද්දියි. එකෙක් අතින් අල්ලල අච්චර නාඩගමක් නැටුව එකේ මේවා මෙහෙම දකිද්දි මොනා කරාවිද කියල බය හිතුනා.

"පාරු...මැනික.. ඔයා.. ආවද.. අපේ අම්මව..බලන්න.. පාරු.."

"ම...මින්.. ආවා හිරූ...."

ඔහුගෙන් මෑත් වෙන්න හැදුවත් නෑ ඉඩක්.. දෙයියනේ මාව ගැහෙනවා හොඳටම..බයට කඳුලුත් එනවා.. රිකී දිහා බලන්නත් බයයි..බැරුම තැන හිරුදි අක්කි දිහා බැලුවේ.. අක්කි තේරුම් අරගෙන හිරූව වත්තම් කර ගද්දි..

"පාරු.. අම්මා නිදි.. ඉක්මනට ඇහැරෙයි ඔයා ආවා කියල දැන ගත්තොත්.. නේද.. අනේ කතා කරන්නකෝ ඔයා මැනික.. මන් කියන දේ අහන් නෑ අම්මා.. අක්කා කියන දේ අහන්නෙත් නෑ.. අනේ ඔයා කියන දේ අහයි පාරු අනේ කතා කරන්නකෝ.."

අනේ වාවන් නෑ මේ වචන. අපි හැමෝගෙම ඇස් වලට කඳුලු ඉනුවේ මොකක්ද දෙයියනේ මේ උනේ කියල යි.. නොබලා ඉන්න බැරි තැන රිකි දිහා බැලුවේ ඔහු ඇස් වලින් කමක් නෑ කියද්දියි. හෙමිහිට අඩි තියලා ඔහු ලගට ගියේ..

"මගේ පැංචි... මන් තරහ නෑ මගේ රත්තරන්... මට තේරුම්

ගන්න පුළුවන් මගේ දෙයියෝ...පව් මැනික කොල්ලා..."

"ඇත්තමද"

"ඇත්තමයි මගේ දෙයියෝ...මත් ඔය හිතත් ඉන්න තරම්ම නපුරු නෑ හොඳද.."

ලා හිනාවකින් ඔහුට හේත්තු උනේ.. මෙතනදි තුරුල් වෙන එක සුදුසු නෑ කියල දැනුන හින්දයි..

"මගේ පැංචි.."

"අයියා"

"මත් හවසට ඔයාව ගන්න එන්නම් රත්තරන්.."

"ඇයි"

"ඒ අක්කා මැනිකට එන්න කියන්න ඇත්තේ මේ හින්දම වෙන්න ඇති මිමි.. තේරෙනවද මත් කියන එක.."

"නෑ"

"අනේ නෑ දෙයියෝ එහෙම දෙයක් නෙමේ.. නොකා නොබී ඔහොම ඉදල හරියන් නෑ නේ කොල්ලෙක් උනාම මිමි අම්මගේ මල ගෙදර වැඩ ඔක්කොම ඒ අක්කට බලන්න බෑ නේ දෙයියෝ.. මේ වෙලාවේ කොච්චර දුකින් උනත් ඇත්තට මූණ දීලා අක්කගෙත් හයිය වෙලා ඉන්න ඕනි නේද මිමි.."

"ඔව් ඉතින්"

"ඉතින් මගේ රත්තරන්.. කවුරු කියන දේ නැහුවත් ඒ

හැමෝම දන්නව හිරුන් මැනික කියන දේ අහනවා කියන්න.. මිම්"

"ඕ..."

"ඉතින් ටිකක් කතා බහ කරලා කන්න දීලා එයා එක්ක ටිකක් ඉදලා හිත හදන්න කොල්ලගේ.. ඒක පුළුවන් මැනිකටයි මැනිකගේ යාලුවන්ටයි.. ඒකටයි අක්කි මැනිකට එන්න කියන්න ඇත්තේ.. තේරෙනවද මගේ රත්තරන් ට.."

ඇස් වලට කඳුලු පිරුනේ මගේ අයියා වගේම මගේ පණ ටත් දෙයක් හරි කෙනෙක්ව හරි සිදුවීමක් හරි මේ තරමටම තේරුම් ගන්න පුළුවන් ද කියල දැනිලයි.

"ඒ පාර අඩනවා මේ කෙල්ල මොකෝ දෙයියෝ අඩන්නේ"

"ආදරේ හිතුනා"

"මත් ගොඩක් ආදරෙයි මගේ රත්තරන්.. අයි මිස් යූ මැනික.."

sinhalaebooks.com

"අයි මිස් යූ ටූ රත්.. අනේ ඉක්මනට එන්න මාව ගන්න හවස.."

"ඉක්මනට එන්නම් මගේ රත්තරන්... පරිස්සමින් ඉන්න හොදද.."

ඒත් එක්කම හිරුදි අක්කි ආවේ

"යන්නද හදන්නේ නංගි.." කියාගෙන

"නෑ අක්කා.. මැනික ඉදීවි යාලුවෝ එක්ක.. මන් හවස

එන්නම් ගන්න"

"අනේ පිං මල්ලි.. ගොඩාක් පිං තේරුම් ගත්තට..."

"ඒම කියන්නෙපා අක්කා. මෙයාලැ අයියත් එක්කම එන්නම්කෝ අපි හවස් වෙලා..අක්කේ ඕන දෙයක් තිබ්බොත් කියන්න අනිවාර්යයෙන් ඔිනි උදව්වක් කරන්නම්"

"අනේ පිං මල්ලි ගොඩක් ස්තුතියි"

ඒ කියනකොටයි මටත් අයියව මතක් උනේ කිවේ නෑ එයාට විස්තරේ. හිතේ චූටි දූකක් තිබ්බත් ඉවසගෙන අත වැනුවේ. ඔහුත් ආපහු යද්දි. නොකීවට ඒ හිතෙත් දූක ඇති මේ විදියට දල යන්න.

sinhalaebooks.com

හිරූ අම්මා දිහා බලාගෙන ඔහේ ඉන්නවා. අයියා යනකම් ඉදල වට උනේ මගේ පාප මිත්‍රයෝ ටිකයි. දන් නැද්ද ඉතින් කට්ටිය සෙට් උනාම ඕන එකයි එපා එකයි ඔක්කොමනේ. කට්ටිය එක එක වැඩ වලට විසිරී යද්දි. මත් හෙමිහිට අඩි තිබ්බේ හිරූ ලගටයි.

"හිරූ..."

"පාරු...."

"හිරූ අපි මොනා හරි කාල ඉමුද.."

"මට කන්න බෑ පාරු...අම්මත් කාලා නෑනේ තාම"

"අම්මා ගොඩක් කෑව කිව්ව හිරූ.. මට බනීවී එයාගේ චූටි පූතාව බඩගින්නේ තිබ්බ කියල. ඒ හින්ද අපි චූට්ටක් කාල

එමුද හිරූ..."

"මට කන්න බෑ පාරු..."

"මටත් ගොඩාක් බඩගිනි හිරූ අනේ චූට්ටම චූට්ටක් කාලා එමුද ප්ලිස්"

"හ්ම්ම්" කියලා නැගිට්ටේ මන් මවා ගත්තු ලා හිනාවක් පෙන්නද්දි

කෑම දෙන්න ලෑස්ති කරල තිබ්බෙ එයාලෑ ගෙදර ටම ඉස්සරහ ගෙදර යි. හැමෝගෙම ඇස් අපි දෙන්නා දිහාට වැටෙද්දි ඇහුනේ කසුකුසුව හිරුව මැරි කරන්න ඉන්නේ මන් කියල හිතනව කියලයි.. හරිම අපහසුවක් දැනෙද්දි බිම බලාගෙනම අඩි තිබ්බේ ඔහුත් එක්කම ඒ ගෙදර ටයි. එහෙයි මෙහෙයි හැමතැනම කසුකුසුව. කරන්න දෙයක් නැති කමට එකකටවත් කන් නොදී.. හිරුව වාඩි කරවල බත් එකක් බෙදන් ලගට ගියේ කොහොම හරි කටක් දෙකක් හරි කවනවා කියල හිතාගෙනයි.

"හිරූ.. කමු නේද චුට්ටක් "

"කන්න බෑ පාරු ඔයා කන්නකෝ ප්ලිස්"

"ප්ලිස්"

"හ්ම්ම්"

"හොද ළමයා.." කියල හෙමිහිට බත් කටක් අනලා ඒ මූවට ලන් කලේ චුටි එකෙක් වගේ කන්න ගද්දි. කටවල් තුන හතරක් කාලා

"මට ඇති පාරු කන්න බෑ.."

මෙහෙම හරි කෑව එක ඇතිනේ හිතලා කිසිත් නොකියා වතුර දීලා පිගාන සෝදලා ආයෙම අපිආවේ හිරුගේ ගෙදර ටයි. යද්දි අපේ සෙට් එකම හිරුගේ කාමරේ.. එයත් එක්කම ගිහින් ඇද මතින් වාඩි උනේ.. කිසිත් නොකියා.. පුටු උඩ මේස උඩ සෙට් එක උඩ බිම පවා අපේ උන් ඉදගෙන. හැමෝමත් එක්ක කියෝ කියෝ ඉද්දි ඇදෙන් ඇල වෙලා උන්නු හිරුට නින්ද ගිහින්..

"පව් බන් මූ"

කට්ටිය කතා උනේ ඇත්තටම වෙලා තියෙන දේ ගැනයි. මාසෙක වෙලේ ඉදන් අසනීපෙන් ඉදලා තියෙන්නේ අම්මා. ඉතින් ඒ අසනීපෙටම ඊයේ රෑ නැති වෙලා. වෙලාව ගෙවුනේ නොදැනීමයි. කරන්න ඕනි වැඩ පල සියල්ල අපි අතින් සිද්ද උනේ හිරු දවස් ගානකට පස්සේ නින්දක් ලබද්දි. බලන් ඉන්න හරි දුකයි මොනා කියලා කරන්නද අපි.. හවස 3 ට විතර දවල්ට කන්න ආයෙම කට්ටියම අර ගෙදර ට පිටත් වෙද්දි, මන් ගියේ හිරුව ඇහැරවන්නයි. ඇහැරවන්න දුකයි..

"ඔයා පව් හිරු..." කියවුනේ ඒ නිදන් ඉන්න ඒ රුව දිහා බලාගෙනයි.

"මන් පව් තමයි පාරු.."

"ඇ..හැ..රි..ලා..ද හිටියේ.."

"මිම් ටිකක් වෙලා.."

හිතුනේ යලිත් නෝර්මල් තත්වෙට ඇවිත් දෝ කියල යි.

"හ්මිම් කමුද අපි.."

"දැන් බැ පාරු.."

"එහෙනම් කොන්ඩෙයි රැවුලයි කපමුද අපි.. අම්මා
බනිව් කොන්ඩේවත් කපලා නෑ කියල "

"බනින්න අම්මිමා නෑ නේ පාරු.."

සම්පූර්ණයෙන්ම නෝර්මල් වෙලා කියල තේරුනේ ඒ වචන
වලින්. ඇදේ කොනකින් ඉද ගෙන

"අම්මි වෙනුවෙන් අක්කිට හයියක් වෙන්න හිරූ.. අක්කි
පව් නේ.. තනියම හැමදේම කරගන්නවා.. අපි අම්මිට
ගොඩාක් පිං දෙමු හිරූ.. අම්මි දිව්‍යලෝකේ ඉදන් අපි දිහා
බලන් ඉන්නේ.."

ටිකක් වෙලා.මූණ දිහා බලන් ඉදලා ලාවට හිනාවක්
පෑවේ.. මවාගෙනදෝ.. ඇත්තටමදෝ කියල හිතා ගන්න බෑ..

"ඇයි හිනාවෙන්නේ"

"කියුට්.."

"මිම් යමුද රැවුල කොන්ඩේ කපන්න.."

"කපන්නද අහන්නේ.."

"ඔව්"

"තැන්කිව් පාරු... මට පුළුවන් මිම්මි.. මන් එන්නම්.. ඔයා

ගිහින් කන්න.."

"හ්ම්ම්" කියල හිනා වෙලා අඩිතිබ්බෙ ආයෙමත් කෑම ලෑස්ති කරපු ගෙදරටයි..

## 9 කොටස

කාමරයෙන් එලියට අඩිය තියද්දිම කාගේ හරි ඇගක

වැදුනේ දෙන්නම දෙපැත්තට විසි වෙද්දි. වෙන කවුරුත් නෙමේ ඒ අපේ ආන්‍යා

sinhalaebooks.com

"ඈන්.."

"පාරු.."

"මොකද උනේ දෙයියනේ.. මොකද මේ අඩන්නේ"

"මොකුත් නෑ පාරු.."

"හුම් හුම් යන්කෝ කන්න ඒනම්"

"හුම් යන්.."

මොකක්දෝ අමුත්තක් තේරුනත් හාර හාර ඉන්න බැරි කමට අපි ආවේ කෑම කන ගෙදර ටයි.. වෙලාව නම් 4ටත් කිට්ටුයි. කාල ඉවර වෙද්දිම වාගේ කොන්ඩේ රැවුල පිලිවෙලකට කපාගෙන පිලිවෙලට සුදු ටී ශර්ට් එකක් දාගෙන ඈතින් එනවා දැක්කේ හිරූ .. නිකමට වගේ ඈන් දිහා බලද්දි ඇස් පිල්ලම් නොගහාම බලන් ඉන්නේ ඔහු දිහයි. ඈන් හිරුට ආදලෙයි වත්ද.. අනේ හොදයි අප්පා ඒම උනා නම්.. හිත ගොඩක් දේවල් කිය කිය ඉද්දි.. කෑවද පාරු කියල අහමින් මන් ලගින්ම වාඩි උනෙ.. කිසිත් නොකියා මන් ඔලුව වනද්දි.. ආයෙත් සැරයක් ඈන් දිහා බැලුවේ දෙයියනේ ඒ පාර ඇස් වල ආයෙත් කදුලු.. මන් බලන් ඉන්නවා දැකල අහක බලා ගත්තත්.. එවෙලෙම නැගිට්ටෙ මන් අනිත් කාටවත් අමුත්තක් නොදැනෙන්නයි..

"කොහෙද යන්නේ පාරු"

"ඈන් අසනීපෙන් වගේ හිරු.. මන් බලල එන්නම්කෝ.."

හිරුටත් බොරුවක් කියල මන් ගියේ ඈන් ලගටයි.

"ඈන් මෙහේ වරෙම් " කියල මන් ඇදන් ගියේ එලියේ කොරිඩෝ එකෙ කෙරවලකටයි.

"ඈන් ඔයා ලව් නේද හිරුට"

කිසිත් නෑ පිළිතුරක් කදුලු වක්කරනවා විතරයි.. දුක හිතිලා ඇයව වැළඳ ගත්තේ..

"අනේ මැනික අපි හොදම යාලුවෝනේ රත්තරන්.. ඇයි මෙච්චර කල් හංගන් හිටියෙ දෙයියනේ.. කියන්න තිබ්බනේ කාට හරි.."

"ම...න් කොහොම.. කියන්..නද... පා...රු... එ..යා.. ආ..ද..රෙ.. ඔයා..ට..නේ.."

ඉකි ගහ ගහ උත්තර බදින්නේ මගේ ඇස් වලටත් කදුලු උනද්දි.

"අනේ..මගේ පිස්සියේ.. එයා හැමෝටම ආදරෙයි... අනික

මන් මැරිකරන්න යන්නේ.. ඊට කලින් ඔයාලා දෙන්නව සෙට් කරනවා හාද.. බොරුවට අඩනවනේ මේ පොඩ් දෙයක් හින්ද.. මෝඩ්.."

කතා කර කර උන්නු තැනට ආවෙ හිරු..

"ඈන්...මොකෝ උනේ...උණද කෝ බලන්න..." කියල ඔලුවට අත තියලා උණද බැලුවේ ඈන් ඇස් බෝල ගෙඩි කරන් බලන් ඉද්දි.."

"ටිකක් උණ ගතිය වගේ හිරූ මෙයාට..."

"මිම්ම් ගෙදර ගිහින් ටිකක් රෙස්ට් කරන්න ඈන්.. මෙහෙත් එක දිගට වැඩනේ මිම්"

"ඒම ඕනි නෑ හිරූ.. අවුලක් නෑ මෙහෙම හොදයි..".

දෙන්නගේ කතාව එහෙම්ම කරන් යන්න දීලා මන් අඩ් තිබ්බේ හිරුදි අක්කා කෑවද බලන්නයි. යද්දි අම්මේ මගේ ඊරිසියාකාරයයි අපේ අයියයි දෙන්නම ඇවිත්.

"සුද්දි..."

"අයියා..."

"ගෙදර ගිහින් වොශ් එකක් දන් එන්න සුද්දි..."

"හා අයියා..."

හිනා වෙලා හිටියට අම්මේ ඊර්ෂියාවේ පැලෙනවා. හිරුදි අක්කටත් ආයෙම එන්නම් කියල මත් ගිහින් එල්ලුනේ රිකීගේ අතේ. අයියා ඉන්නම් කියල අපි දෙන්නට ගිහින් එන්න කීවා. හෙම්හිට ඇවිදන් ගිහින් වාඩි උනේ කාර් එකෙන්..නෑ කතාවක්..

"ඔච්චර ඊර්ෂියායි නම් මොකටද දූල ගියේ ආහ්..."

"සද්දේ වැඩී ආ.. දූනව වාහනෙන් එලියට.."

"අහ්.. දූන්නකෝ බලන්න.."

"දූන්නවත් වඩා ගන්න හිතෙන් නෑ.."

"ආහ්.. ඒ මොකද "

"ඇයි උදෙන්ම අර තමුන්ගේ පාසල් පෙම්වතාව බදාගෙන හිටියේ..."

"දෙයියනේ.. මහ ඊර්ෂියාකාරයෙක් අප්පා"

"එහෙම තමයි.. ඉවසන් හිටියා ඉතින් එහෙම දෙයක් නැති හින්දයි.. කොල්ලා පව් හින්දයි.. නැත්නම් දනී මන්.."

"අම්මෝ... මගේ ශුඩු ඊර්රිසියාකාරයා.." කියල මූණ මිරිකන්න යද්දිම

"මේ මේ මාව අල්ලන්න එපා.. ගිහින් ඔය ඇදුම් ගලෝලා හෝදලා දලා වොශ් එකක් දගෙනම එනවා අල්ලන්න.."

කිව්ව විදියට හිනා ගියේ.. අම්මේ මේ වෙනකම් පුපුර පුපුර ඉන්න ඇත්තේ නපුරා.. කතාවෙන් කතාව අපේ ගෙදර ට ආවේ එයා සාලේ අම්මි එක්ක කතාවක් දන්න ගද්දියි. මම වොශ් එකක් දන්න යද්දි..

නාලා ඇදුමක් දගෙන එහෙම ෆ්‍රිජ් එක ඇරලා කන්න දෙයක් හොයද්දි හම්බුනේ සසම සස ස්ට්‍රෝබෙරි අයිස්ක්‍රීම් එකක්. ඒකත් අරගෙන හැන්දකුත් දගෙන මත් ආවේ සාලේට අම්මි එක්ක හෙන කයිය ඉතිම්

"අම්මි.. එත් නැද්ද මල ගෙදර "

"එන්න ඕනි සුද්දි, අප්පච්චි එක්ක එන්නම්"

"හා හා ඔයාල දෙන්නා කපල් දන් එන්නකෝ එහෙනම්"

"සුද්දි... වැඩි ඇ.. දෙනවා ඔය අයිස්ක්‍රීම් ටිකක් අයියටත් දලා.. තනියම කන්නේ.." කියල කුටු කුට් ගගා ටොක්කකුත් ඇනගෙන බැන බැන කිචන් එකට ගියේ මන්

sinhalaebooks.com

හිනා වෙද්දි. හැන්දත් කටේ ඔබාගෙන ගිහින් අරයා ඉදන් ඉන්න පුටුවේ පත්තෙන්ම ඉද ගත්තේ.. ඕනිද අහලා.. හැන්දෙන් අයිස්ක්‍රීම් ටිකක් අරන් දෙන්න යද්දිම ඇසිල්ලකින් තොල් වලට බර උනේ මගේ ඇස් බෝල ගෙඩි වෙද්දි.. තත්පර කීපයක් ඒ පහස විදලා ඈත් උනේ හිනා වේගනමයි..

"ම්ම්ම් රසයි.."

"කොයි වෙලාවක හරි ගෙදරින් එලෝනවා මාව මේවා දැකපු දාක "

"එතකොට අපේ ගෙදර යන්"

"අනේ මේ.."

"අද රෑ එහෙද පැංචි"

"අනේ මන්ද අයියා කියන දෙයක් තමයි.."

"දැන් හිරුන් නෝර්මල් නේද"

"ම්ම් ඔව්.."

"එහෙනම් ඈතින් ඉන්නවා"

sinhalaebooks.com

"ආහ්"

"හිනා නෙමේ දත් ටික බඩට ඇරලා නවතින්නේ මන්.."

"බී කූල් බේබී හිරුට ආදරේ කරන කෙනා හම්බුනා.."

"මොකක් කිව්වා"

"අර මගේ යාලුවා ඇන් මතකද.. අර කොන්ඩේ ෆ්‍රෙන්ච් ගොතන් ඉන්නේ අනේ"

"මන් ඔය කෙල්ලොන්ගේ කොන්ඩ බලන්න යනවද ඕයි.."

"ආපෝ.. මන් දැන් ගියාම පෙන්නන්නම්කෝ.."

"ඉතින් එයා මොකද "

"එයා හෙන ලව් අනේ හිරුට. මාත් අදයි දැන ගත්තේ.."

"ම්ම්.. ඒක හොදයි හැබැයි. ඒත් එයා ලව් හිරුට උනාට.. හිරු ලව් ඔයාටනේ.."

"ඇයි පැංචි.."

"ම්හ්.. මොකුත් නෑ.. මේක තියල එන්නම්.. යමු නේද දැන්.."

"පැංචි...."

අඩියට දෙකට කිව්ව එකට දිව්වේ.. ඇස් වලට කඳුලු පිරෙද්දි.. ඇත්තටම ඒ වචන ටික කියන්න උන එයත් පව්.. ඒ

වචන අහන්න උනු මමත් පව්.. යන්තම් හිත රිදුනත්.. ගනන් නොගෙන කඳුලු පිහදාගෙන අම්මිටත් කියල ආයෙම එන්න පිටත් උනේ

"පැංචි...."

කාර් එකේ වීදුරුවෙන් ඉවත බලාගෙනම මන් උන්නේ ඒ මූණ බලන්න හිතුන් නැති තැනයි.

"පැංචී....කතා කරන්නකෝ රත්තරන් මන් එක්ක.. ඔයාව රිද්දන්න නෙමේ මැනික මන් ඒක කිවේ.... සොරි මගේ රත්තරන් හිත රිද්දුවට.... "

ඒකටත් මගෙන් ප්‍රතිචාරයක් නැතිතැන උපරිම ස්පීඩ් එකෙන් කාර් එක ඩ්‍රයිව් කරේ ඒක තමා මන් කතා නොකර හිටියම කතා කරවන්න මෙයා කරන පලවෙනි වැඩේ. ඒකටත් මොකුත්ම නොකියා හිටියත් හිරුළෑ ගෙවල් වලට යන පාර පාස් උන ගමන් මන් ඒ මූණ දිහා බැලුවේ කොහේද යන්නේ අහන්නයි. ඒ පාර එයා නෝ

sinhalaebooks.com

කතා. කමක් නෑ ඕන දිහාක ගිහින් ගෙදරින් බස්සයිනේ හිතල සද්දේ නැතුව හිටියේ.

හිතුවා වගේම ආවේ අපි යන බීච් එකට. ඔව් ඔව් මන් තරහා උනාම යාලු කර ගන්න දෙවෙනි ක්‍රමේ ඒක. හිත යටින් හිනාවක් ගියත් පෙන්නන් නැතුවම අහක බලන් හිටියේ වාහනේ නවත්තලා, එයා බැහැලා අනිත් පැත්තෙන් ඇවිත් මාවත් ද්‍රෝතටම අරගෙන කාර් එකේ බොනට් එකට හේත්තු වෙද්දි.

"තරහයිද මිම්මි"

කතා කරේ නෑ වචනයක් වත්

"කතා කරන් නැද්ද මිම්මි"

"සොරි කිව්වනේ පැංචි... ප්ලිස්... "

"හ්ම්ම්"

"බැනල හරි කතා කරන්නකෝ මගේ දෙයියෝ.. අයියට දුකයිනේ ඔය කතා පෙට්ටිය වැහුනම"

"කියන්න මගේ රත්තරන් ඔය හිතේ තියන දේවල්"

"ඔයා කියපු කතාව ඇත්ත තමයි.. ඒත් ඒකට මට වැරදි නෑ නේ "

"මගේ මැනිකගේ වැරැද්දක් කිවේ නෑ නේ දෙයියෝ මන්..."

"මිම් මගේ වැරැද්දක් නැතුව උනත් ඒම ඇහෙද්දි, මට හරි දුකයි. ඒ දේ අපේ ක්ලාස් එකේ කෙනෙක් හරු වෙන කෙනෙක් හරි කිවොත් මට දුක හිතෙන එකක් නෑ. ඒත් ඔයාගේ කටින්ම ඒ දේ ඇහුවමම දුකයි."

"අනේ සොරි මගේ රත්තරන්.. ප්‍රොමිස් මන් ආයේ ඒම කියන් නෑ"

තළලත කෙටි හාදුවක් තියමින්, ඇහෙන නෑහෙන ගානට "තයිශූ ප්‍රොමිස්" කිවේ මුවගට හිනාවක් එද්දි..

"අම්මෝහ් මගේ හිනාව.. ඔය හිනාව දැක්කත් ඇති බම් මට හැම දෙයක්ම අමතක වෙලා යන්න.."

"ආයේ හිනා වෙන් නෑ"

"අහ්.. ඒ පාර මොකද "

"හැමදේම අමතක වෙද්දි මාවත් අමතක උනොත් එහෙම" කියල ද්‍යේනිත් බිමට පැනල දිව්වේ දිවත් දිග් කරගෙන..

sinhalaebooks.com

"බබා... කේන්ති ගස්සන්නෙපා දුර දුවලා.. කලුවරයි දැන් ඇ.."

"චුට්ටයි චුට්ටයි අනේ.." ගගා මන් දිව්වේ වෙරළට.. ඇසිල්ලකින් හිතා මතාම මගේ දිහාට ආපු කොල්ලෙක් හිතා මතාම මගේ ඇගේ වදිද්දි.. අච්චර ඉඩ තියාගෙනත් මේ වලත්තයා හිතලම හැප්පුනා.. ඒ දේ දැක්ක ගමන් රිකිත් දුවන් එන ටිකට.. අර කොල්ලා මගේ ඇග දිහා මහ කැත බැල්මක් බලලා අතින් ඇදලා ගත්තේ මගේ ඉවසීම පනිද්දි... කාලෙකින් අත පයේ හිරි යවා ගන්නත් බැරි උන නිසා.. අත ගස්සලා අරගෙන මිටමොලවලා දුන්නේ ටෝන් ගාලා එකක් දීලා අනිත් පැත්තට කැරකිලා කකුලෙනුත් එකක් දුන්නේ කරාතේ මාස්ටර් ව මතක් කරගෙනම දන් උන්නු ශූ එක අරූගේ නහයටම වදිද්දි... නහය නම් කැඩුනද මන්ද නහය අල්ලගෙනම දිව්වේ ආයෙම බලන්නෙවත් නැතිව. රිකී බලන් ඉන්නේ ඇස් ලොකු කරගෙන..

"තමුසේ මාර ඩයල් එකක්නේ ඕයි"

"ඇයි"

"ඇයි අහන්නේ.. අයියා කොච්චර කියෙව්වත් මන් දැක්කේ අදනේ නංගිගේ වැඩ..ඔහොමත් ගහනවද බම්"

"එයා හිතාමතාමයි ආවෙ මගේ ඇගට"

"යකෝ මේ කොල්ලෝ වෙච්ච අපිවත් ඕම ඩිරෙක්ට් ගහන් නෑ නේ"

"ඒ පාරවල් වෙනයි ... කරාතේ පාරවල් වෙනයි අළේ.."

"තවුසේ එක්ක ඉන්නත් බයයි ඕයි"

"ඇස් පියා ගන්න.."

"ඒ මොකටද"

"පියා ගන්නකෝ කිවම"

ආයෙමත් චූටි කෝලමක් කරන්න හිතිලා.. ඒ රළු දෙතොල් වලට මගේ දෙතොල් තද කරල චූටි හාදුවක් තවරලා දුවන්න ගියත් වැඩක් නෑ මේ පාර නම් දුවන්න කලින්ම අල්ල ගත්තා..ඉනෙන් උස්සලා අරගත්තේ.. අනිච්ඡානුගවම ඔහුගේ බඳ වටා මගේ කකුල් එතෙද්දි...

"ඔය එක එක ඒවා කරන් මාව අවුස්සගෙන ඊට පස්සේ එනවකෝ"

කොච්චර කෝලම් කරත් ඒ වගේ දේවල් ඇහෙද්දි නම් ලැජ්ජයි හොඳටම. ලැජ්ජාවටම ඒ පපුවේ මූණ හොවා

ගත්තේ.. ඒ විදියටම වඩාගෙන ආයෙමත් කාර් එකට යද්දි..

"කට වැහෙනවා ඒවට නම්.. මගේ හා පැටියා.. "

සීට් එකෙන් තියන ගමන් එක කොපුලක්. සිප ගනිමින් හිනා වේගතම කිවේ. මිනිත්තු 40 කින් විතර ආයෙමත් අපි ආවේ හිරුලැ ගෙදර යි.. අයියත් ඉදගෙන කැරම් ගහනවා අපේ ක්ලාස් එකේ කොම්ලෝ එක්ක. රිකිත් එතනින් වාඩි උනේ මන් දුනීලව හොයන් ගෙතුළට යද්දි. දින දෙකක් ඒ විදියට 3 ක් ඒ විදියට ගත උනේ නදී ඇන්ටිගේ අවසන් කටයුතු සියල්ල එසේ අවසන් වෙද්දි...

අද 6 වෙනි දවස. බණ දවස. උදේ ඉදන් වැඩ කරල හවස රිකී එක්ක ගෙදර යනගමන් හිටියේ වොශ් එකක් දන් ලෑස්ති වෙලා එන්න.

"පැංචි.."

"ම්ම්ම්"

"අම්මිට බේත් වගයක් ගේන්න තියේ.. අරගෙනම යමු නේද"

"හලියෝ..."

ෆාමසියෙන් බෙහෙත් අරන් හැරෙද්දිම අපි දැක්කේ අයියගේ කාර් එක ඉස්සරහ තිබ්බ සිටිකෙයා හොස්පිටිල් එක ලග නවත්තලා.. අපි දෙන්නම මූණට මූණ බලා ගත්තේ හදිසියේ අයියට අසනීප වෙලාද ඒම නැත්නම් ගෙදර කාට හරි අසනීප වෙලාද්දෝ කියල .. අයියගේ ෆෝන් එකට කෝල් එකක් ගත්තත් ආන්ස්වර් කරේ නෑ. මිනිත්තු 15 ක් විතර ගියාට පස්සේ අයියා ආවේ කවුද්දෝ ලේඩි කෙනෙක් එක්ක.. අයියගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් කියල හිතුවත්... දෙයියනේ..එයා ප්‍රෙග්නට් නේද.. දුරට අදුන ගන්න බැරි උනත් ලන් වෙද්දි... දෙයියනේ .... ඒ..

## 10 කොටස

රවීනා නේද..ඒ රවීනා නේද.. දෙයියනේ කොහොමද එහෙම දෙයක් වෙන්නේ.. කිසිත් හිතා ගත නොහැකිව රිකී දිහා බැලුවේ ඔහු මටත් වඩා කලබලෙන් කාර් එකේ දෙරත් ඇරන් එලියට බහිද්දි.. මොනා වේවිද කියල බයෙන්

ඉක්මනට ඔහු පස්සෙන්ම දිව්වේ අයියා වගේම රවීනත් බය වෙලා වගේ බලන් ඉද්දි.

"ශේ..ල්.. උඹ..උඹ ඇයි මෙතන"

"උඹ කොහෙන්ද මෙයාව හොයා ගත්තේ"

කේන්තියට වගේම කලබලේට ඒ නහර ඉලිප්පිලා.. වේගයෙන් හුස්ම ගන්නවා.. අයියා වචනයක් වත් කිවේ නෑ... අයියගෙන් උත්තර නැති තැන රිකී ගිහින් කාර් එකට නැග්ගේ හරි කේන්තියෙන්.. රවීනාත් රිකී දිහා බලන් ඉන්නේ සියල්ල නැතිවුනු මුහුණකින්...

"කාර් එකට නගින්න.." තිවුනු කටහඬකින් අයියා එහෙම කිවේ රවීනට. ඇයත් එයට කීකරු වෙලා අපි දෙන්නා දිහත් එක පාරක් බලලා ගිහින් වාහනේට නැග්ගා..

"සුද්දි...මන් ඔක්කොම කියන්නම් ඒත් මේ ඒකට වෙලාව නෙමේ.. අරූව කන්ට්‍රෝල් කර ගන්න.. ප්‍රොමිස් අයියා වැරැද්දක් කරේ නෑ.. කරන්නෙත් නෑ.. යන්න දැන් මන් ඉක්මනට එන්නම්"

"අයියට තිබ්බා මට මේ දේවල් කියන්න " තවත් කිසිත් නොකියා මාත් රිකීගේ වාහනේට නැග්ගේ අයියා තවමත් එතන හිටගෙන බලන් ඉද්දි. රිකීලෑ ගෙදර ටඑනකම්ම කතාවක් නෑ කිසි. මාව සාලේ රිකීගේ අම්මි එක්ක කතා කර කර ඉන්න තියලා එයා උඩට ගියේ වොශ් එකක් දන් එන්නයි.

"ද්‍රේණි.."

sinhalaebooks.com

"ඕ අම්මි.."

"බණ ගෙදර වැඩ ඉවරද දෝණී"

"ඔව් අම්මි ඔක්කොම වගෙ ඉවරයි.."

"මිම් දැන් මැතිකත් වොශ් එකක් දන් නේද යන්න ඕනි"

"ඔව් අම්මි වොශ් එකක් දන් ඉක්මනට යන්න ඕනි"

"මිනිත්තු 20 කින් විතර රිකී ආවේ..අම්මිටත් යන්නම් කියල අපිඅපේ ගෙදර එන්න පිටත් වෙද්දි.. තවත් මිනිත්තු කීපයකින් ගෙදර ආවේ ගේට් එකෙන් ඇතුලට දැම්මත් දෙරවල් ලොක්.

"අම්මි යි අප්පච්චි කොහේ ගිහින්ද අප්පා ඒ පාර"

"අම්මිට කෝල් එකක් අරන් බලන්න පැංචි"

"හ්ම්ම් ඉන්නකෝ"

"සූදූ.."

"අම්මි.. කොහෙද අප්පා ඔය ජෝඩුව ගියේ..මේ ගෙවල් දෙරවල් ලොක් කරගෙන"

"ඇ ලමයෝ..මොන සිහියෙන්ද ඉන්නේ. උදේ මන් කිවා නේද අපි ලොකු අම්මලාගේ යනව කියල.. "

"අයියෝ අම්මි.. අමතක උනා අප්පා.. මන් මේ දැනුයි ආවේ

වොශ් එකක් දන් යන්න.. කී එක කෝ ."

"ඇත්තමයි සුදූ ඔයාට නම් දෙනව මන් පාරක්. ගෑනු ලමයෙක් උනාම ඔහොමද ලමයෝ.. සිහියෙන් ඉන්න දැන ගන්න ඕනා.."

"අනේ අම්මි..........ඇති අප්පා.. පස්සේ බනින්න. කෝ කී එක"

"කී එකඇති අයියගේ රූම් එක ලග තියෙන ශූ කබඩ් එකේ පොලිශ් ටින් එකක් ඇති ඒක ඇතුලේ.."

"ඊයා අම්මි.. පොලිශ් ටින් ඇතුලෙද අනේ කී එක දන්නේ"

"මගෙන් බැනුම් අහ ගන් නැතුව ෆෝන් එක තියනවා.."

කී එකත් හොයාගෙන දෙරත් ඇරන් ඇතුලට ගියේ.. කතා නෑ එක වචනයක් වත්..

"අයියා..."

"ම්ම්"

"කතා නොකර ඉන්නෙපා"

"ම්ම්"

"මන් ඉක්මනට වොශ් එකක් දන් එන්නම්.."

"හා මැනික.."

අඩියට දෙකට උඩට දිව්වේ වොශ් එකක් ද ගන්නයි. ඉක්මනට නාගෙන ටවල් එකත් ඇදගෙන ඇදුමක් හෙව්වේ ඇදන් යන්නයි. එතකොටම වගේ සාලේ ලෑන්ඩ්ෆෝන් එක රින්ග් උනේ ආයේ ගම දෙදරලා යන්න. අරයත් ආන්ස්වර් කරන පාටක් නැති හින්ද.. ටවල් එක පිටින්ම පල්ලහැට දිව්වේ අරයා ඇස් ඩිම් කරන් බලන් ඉද්දි වලත්තයා

"හෙලෝ.."

"සුද්දි.. ඔයා ගෙදර ද.."

"ඔව් අයියා.. ඔයා කොහෙද ඉන්නේ.. "

"අම්මිට ගත්තේ මැනික. මත් හිතුවේ ඔයාලා දෙන්නා අරෙහේ යන්න ඇති කියල.. "

"නැ අයියා අපි දෙන්නා එහෙ ඉදන් එන ගමන්.."

"අම්මි කෝ.."

"අම්මිලා ලොකු අම්මලැ ගිහින් අයියා. මොකක්ද කියන්න ඕනි "

"රවීනට ටිකක් අමාරුයි සුද්දි. මත් අද මෙහේ ඉන්න කියල.. අම්මිට බොරුවක් කියන්න ගත්තේ.."

"ඔයා මොකක්ද අයියා ඔය කරන්නේ.."

"මත් ඔක්කොම කියන්නම් මැනික..අම්මිව ශේප් කරන්න අදට ප්ලිස්.."

කියල කට් කරේ මට කිසිත් නොකියන්න ඉඩ තියලා. කට් කරලා අනිත් පැත්ත හැරෙනවත් එක්කම පාවෙනවා කියල තේරුනේ.. අර යක්සයා දේතටම අරගෙන මාව සෙට් යෙන් ඉද ගනිද්දි. සැක් ලැප්ජාවේ බැ.

"මොකෝ දැන් හරි ගියාද කේන්තිය"

"අනේ ඕම බලන්නෙපා අනේ"

හිනා වෙනවා ඒ පාර හරි ලස්සනට..ඒකට නම් ලැජ්ජා හිතිලා මූණ ගහ ගත්තේ ඒ පපුවේ

"කොයි වෙලේක හරි මාව අවුස්සගෙන අන්තිමට බලනවකෝ..පස්සේ ඉන්නවා හා පැටියා වගේ ගැහි ගැහි.. කෝ බලන්න මූණ"

රතු වෙලා සර්වාංගෙම ආයේ මොනා බලම්නද. හෙමිහිට ඔලුව උස්සලා බලලා ආයෙමත් පපුවේ මූණ හංග ගත්තේ.ආදරෙන් නළල සිප ගෙන තුරුල් කර ගනිද්දි..

"තාමත් මට.. තලන්න ලෝබයි බම්.. මගේ චූටි කෙල්ල.. යනා යනා දූලා ගිහින් ඇඳුමක් දන් එනවා.."

චූටි කෝලම්ක් කරන්න හිතිලා රැවුල හපලා.. චූටි කිස්

එකක් දීලා දූවන්න ගියත් මගේ ගැට දන්න හින්දම නවත්තන්න හිතල් ඇද්ද ඇඳිල්ලට ටවල් එක එයාගේ අතේ. හරිනේ ඔය කර ගත්තේ.. දූවන්නත් බෑ. කරන්න දේකුත් නෑ ලැජ්ජ්වේ බෑ. බැරිම තැන උපරිම තද.......ට ඇස් පියා ගත්තේ බොකු බඩවැල් ඔක්කොම සීතල වීගෙන යද්දි..... තත්පර කීපයක් ගිය තැන ආයෙමත් සැරයක් ටවල් එක ගත දැවටෙද්දි ඇස් නොඇරම ඒ පපුවට තුරුල්

උනේ කඳුලක් දෙකක් ඇස් කොනින් පිට වෙද්දි..

"යකඩෝ මේක අඩන්නේ මන් හරියට අතවරයක් කරන්න ගියා වගේනේ ඒයි මෝඩියේ.. ඇස් අරිනා.. මගේ චුටී හුරතලී"

හිම්ට ඇස් ඇරලා බැලුවේ..එයා හිනා වෙනවා හරි ලස්සනට..

"කඳුලු ඇයි මිම්.. බය හිතුනද මගේ රත්තරන් ට.."

නෑ කියන්න ඔලුව වැනුවේ එයා හිනා වෙද්දි

"ඒනම් ලැජ්ජා හිතුනද මිම්"

ඔව් කියල ඔලුව වැනුවේ ආයෙමත් උණුසුම් තළලත හාදුවක් ලැබෙද්දි..

"දැන් කෝලම් කරලා කර ගත්තු හරිය ඇතිනේ.. ගිහින් ලෑස්ති වෙලා එනවා මගේ හා පැටියා"

අඩියට දෙකට දිව්වේ ලැජ්ජාවටමයි. බණ දවස හින්ද පිලිවෙලට යන්න එපැයි ගොඩක් අය එනවනේ හිතිලා.. අප්පච්චි අරන් දුන්නු.. යටි පතුලටම දිගම දිග සුදු සාය ඇඳලා සුදු ලේස් රෙද්දෙන් මහල තියෙන ක්‍රොප් ටොප් එකක් ඇඳලා කොන්ඩේ පෝනි ටේල් එකක් ද ගත්තේ.

මේ ටිකේම නම් ඩෙනිම් තමා ඇන්දේ අද ඒම යන එක හරි නෑයි හිතුනා.. ලෑස්ති වෙලා පල්ලහැ ට එද්දි බලන් ඉන්නව හිනා වේගනම කන්න වගේ

"ලස්සනයිද "

"පිං පාටයි මගේ දෙයියෝ කෝ ඉන්නවා මට ෆොටෝ එකක් ගන්න" කියල ෆොටෝස් දෙක තුනකුයි.. අපි දෙන්නගේ සෙල්ෆියි ගත්තා. ඉක්මනට ඉක්මනට දොරත් ආයෙම වහල කී එක අපේ අම්මිගේ ශූ පොලිශ් ටින් එකටම දාලා ඉක්මනට අපි ආවේ බණ ගෙදර ටයි. මේ වෙද්දි අපේ අයියා නැතත් මේ ටිකේ ඉදල ඉදලා අපේ ක්ලාස් එකේ කොම්ලො එක්ක රිකී මාර විදියට ෆිට් වෙලා. මේ උන දේවල් වලින් රවීනා ගැනත් අමතක වෙලා මේ මනුස්සයා ට.. කමක් නෑ ඒකත් ලොකු දෙයක් හිතලා එයාට අර කට්ටිය එක්ක ඉන්න කියල මන් ආවේ ඇතුලට.

එද්දිම මූණට මූණ හම්බුනේ දොර ලගදිම හිරුව. ලස්සනට හිනා උනා..

"හිරූ..."

"පාරු..."

"ම්ම්ම්..."

"ලස්සනයි මැනික.."

"හී හී හැබැයි මට වැඩිය ඔයාගේ වෙන්ඩ වයිෆ් ලස්සනයි අද නම්" කියල ඇහැක් ඉගිමැරුවේ ඈන් දිහා බලලයි. හිරුදි අක්කා එක්ක හෙන කයියක කොනක ඉදන් එයා. ඇස්

ලොකුකරගෙන හිරූ මන් දිහා බැලුවේ හරියට හොරයක් අහු වෙලා වගෙයි.

ඇත්තටම මේ දවස් පහ හය ඈන් ටයි හිරූ ටයි තනියම ඉන්න දුක බෙදා ගන්න අපි ඉඩ හැරපු අවස්ථා එමටයි.. ඒ නිසාම දෙන්නම හිත් වලින් හිටියට වඩා ගොඩක් ලන් උනා කියන එක ප්‍රසිද්ධ රහසක්

"ඈන් ගොඩාක් ආදරෙයි හිරූ ඔයාට.."

"ම්ම්ම්.." කියමින් හිරුත් ඈන් දිහා බැලුවේ.. ලා හිනාවක් පාමින්

"ලැජ්ජාව දැන් මෙතන.." කියල හිනා වෙලා හිරුට එලියට යන්න ඉඩ දීලා මන් ආවේ හිරුදි අක්කයි අපේ කෙල්ලෝ ටිකයි ඉන්න තැනට. බණ දනේ වැඩ කටයුතු සියල්ල ඒ විදියට දවස් දෙකක් ඇතුලත සිදු උනේ අපි හැමෝගෙම සහයෝගයෙන්. දැන් මේ දනෙටත් ඉදලා වැඩ පල

ඔක්කොම කරල දීලා මෙයාගේ ඔෆිස් එකට යන ගමන්.. මේ ටිකේම ඔෆිස් ගියේ නෑ නේ..

"බබා..."

"ම්ම්ම්..."

"අයියා විස්තරයක් කිව්වද පැංචි.. මොකද ඌට වෙලා තියෙන්නේ.. කොහෙන්ද අපේ නංගිව හම්බෙලා තියෙන්නේ.. කෝ අරූ එතකොට "

"මට තාම අයියා කිසි දෙයක් කිවේ නෑ නේ බබූ"

"හ්ම්ම් අනේ මන්ද මැනික මට තේරෙන්නේ නෑ මොනා

වෙනවද කියන්න..අනික අර බඩේ ඉන්න කිසිම දෙයක් නොදන්න කිරි සප්පයා"

"ම්ම්ම්..."

# 11 කොටස

තවත් දින කීපයක් ඔය විදියට ඇදුනේ සාමාන්‍ය විදියට කාලය ගත වෙමින්.. ෆයිනල් එග්සෑම් ලග නිසා වැඩ කෝටියයි..එදත් හවස ලෙක්චර්ස්.. අප්පච්චත් කොහෙදෝ ගිහින්.. රිකිත් මීටින් එකක වෙන්න ඕනි. කරදර කරන්න බෑනේ හිතිලා බස් එකේම එන්නත් ගිහින් නිකමට වගේ අයියට කෝල් එකක් ගත්තේ බස් එකේ යන්න කම්මැලිකමටයි.

"සුදූ..."

"අයියා...කොහෙද ඉන්නේ... මාව ගන්න එන්නකෝ ළග පාතක ඉන්නව නම්.. අප්පච්චි නුවර ගියානේ උදෙන්ම"

"මන් එන්නම් සුද්දි 10 මිනිට්ස් දෙන්න.."

මිනිත්තු 10 කින් කිවත් වගේම අයියා කාර් එකේ ආවා.. තනියම නෙමේ රවීනත් එක්කම.. කරගන්න දෙයක් නැති කමට පිටිපස්සෙන් වාඩි උනේ කිසිත් නොකියම..

"සුද්දි.."

"අයියා.."

"පොඩි ගමනක් තියේ ගිහින්ම යමු නේද.."

"හා අයියා.."

ටික වෙලාවකින් අපි ආවේ..සාමාන්‍ය චුටි ගෙදරකට..චුටි උනාට ලස්සනයි..

"බහින්න සුද්දි..යමු ඇතුලට.."

ඇතුලට ගියාම ඒ ගෙදර කවුද ඉන්නේ කියලා අමුතුවෙන් කියන්න ඕනි උනේ නෑ... මෙහේ තමයි රවීනා ඉන්නේ.. හත් මසක අට මසක කුසක් දරාගෙන තරමක අපහසුවෙන් රවීනා හිනා වෙලා ඇතුලට ගියේ අයියා එක්ක මම සාලේ සෙටි එකෙන් වාඩි වෙද්දි.

"සුද්දි.."

"අයියා.."

"මොනා හරි බොමුද.."

"එපා අයියා දැන් ගෙදර ගිහින්ම බොමු.."

"හ්ම්ම් කෝ රිකී"

"එයා ඔෆිස් එකේ අයියා.. මීටින් එකක් කිවා දවල් කතා

කරාම. ඉතින් මන් කෝල් කරන්න ගියේ නෑ.."

"ම්ම් හරි මැනික"

"ම්ම්"

"මාස තුනකට විතර කලින් මන් රෑ ගෙදර එද්දි ඇක්සිඩන්ට් එකක් වෙන්න ගියා මැනික ප්‍රෙග්නට් ලේඩි කෙනෙක්. කිසිම

දෙයක් උනේ නෑ ශොක් එකක් ඇරෙන්න. දුවල ගිහින් එයාට මොකද බැලුවම ඒ වෙන කවුරුත් නෙමේ අපි අවුරුදු දෙකහමාරකට කලින් හැමතැනම හොයපු රිකීගේ නංගි. යන එනමක් නැතුව මහ රෑ පාර පනිද්දි.. ශොක් එක වගේ හින්ද එයා ඉන්න තත්ත්වේ අනුව බයත් හින්ද මන් ඇඩ්මිට් කරා හොස්පිටල්..දවස් දෙකකින් විතර රිකවර් උනත් කතා කරේ නෑ එක වචනයක් වත්.. ඒ තත්ත්වෙන් එයාව දාල එන්න බැරි හින්ද මන් මෙහෙන් ගෙයක් රෙන්ට් එකට අරන් මෙහෙට එක්කන් ආවා.. සතියක් දෙකක් ඔට්ටු වෙලා වචනයක් දෙකක් කතා කරත් හරියට කතා කරන් නෑ තාමත්.. පස්සේ මන් හෙව්වා විස්තර...ඉදල තියෙන්නෙත් මේ ලගමයි. අවුරුදු දෙකක් විතර ඉදලා.. ඒත් එයා ප්‍රෙග්නට් කියල දැන ගත්තම එයාව එලවලා.. ඌ දාල ගිහින්.. අදටත් මන් හොයනවා කොහෙද කියල ඒත් හොයා ගන්න නෑ. රෙජිස්ට්‍රේශන් එක කරලත් නැති හින්ද.. හොයා ගත්තා කියල වැඩකුත් නෑ..

sinhalaebooks.com

අද එයා ඔහොම හරි හීනා වෙලා ඉන්නේ කවුන්සිලින් වලිනුයි බෙහෙත් වලිනුයි.. "

"දෙයියනේ.."

"කොහොම කියන්නද මන් ඔය විස්තර මැතිකටයි රිකීටයි.. කියන්න කියල හිටියත්.. මෙයා ටිකක් හරි වැඩියෙන් කතා කරන කාලයක් වෙනුවෙන් බලන් හිටියා.."

"දැන් දින ලගත් ඇති අයියා.."

"ම්ම් ඔව්.. මේ මාසේ 27"

"ආහ්.."

"මන් මොකද සුද්දි කරන්නේ.. රිකී මාත් එක්ක තරහින්ද"

"නැ අයියා.. එයා තරහින් නැ.. "

"මන් මොකද කරන්නේ සුද්දි"

"අපි ඒ බෝයිව හොයමු අයියා.. කොහොම හරි හොයලා එයත් එක්ක කතා කරමු.. එයාලගේ ගෙවල් එක්ක කතා කරමු...කතා කරලා මේ ප්‍රශ්නෙ විසඳමු"

"බැ.."

"ආහ්..."

"බෑ සුද්දි.."

"ඇයි අයියා මොකක්ද ප්‍රශ්නේ"

"දැන් එයාව දෙන්න හිතෙන් නෑ සුද්දි මට.."

"ආහ්.."

"ම්ම් ඔව්.. ආයෙත් සැරයක් එතනට යවලා එයාට දුක් විදින්න දෙන්න බෑ සුද්දි මට"

"කවද ඉදන්ද අයියා"

"මන් ලගට ආපු ද ඉදන්.."

"ආහ්"

"බඩත් උස්සන් අමාරුවෙන් තනියම වැඩ ටික කර ගනිද්දි.. චුට්ටක් හරි රිදුනම ඇස් වලකඳුලු පුරෝගෙන අමාරුවෙන්

ඉද්දි.. වචනයක් වත් කතා නොකර හැමදේම දරාගෙන ඉද්දි.. ඇහැරන් ඉද්දි චුට්ටක් වත් ලගට එන් නැති කෙනා..

තිත්දෙන් පිරිමියෙක්ගේ උණුහුම ආරක්ශාව හොයද්දි.. මන් කොහොමද මැතික බලන් ඉන්නේ.."

කිසිත් නොකියා බලන් උන්නේ වෙලා තියෙන දේවල් හිතා ගන්න බැරුවයි.. රිකී මේ දේවල් වලට කොහොම රිඇක්ට් කරයිද.. තේරෙන් නැ දෙයියනේ.. අනික අම්මි අප්පච්චි කොහොම රිඇක්ට් කරයිද.. අහක බලාගෙන කල්පනා කර කර ඉද්දි ඉන් මිදුනේ.. අපහසුවෙන් ඇවිදගෙන ට්‍රේ එකකට බීම දෙකක් අරන් ආපු රවීනව දැකලා.. ලා හිනාවක් ඒ මූණේ..

අපහසුවෙන් හිනාවක් දවටන් වීදුරුව අතට ගත්තත් ඇසිල්ලකින් අත ලිස්සලා සලාන් ගාල බිමට වැටුනා.. ඒත් එක්කම යටි ගිරියෙන් කෑ ගහගෙන ෆේන්ට් උනේ රවීනා.. වැටෙන්න කලින් අයියා අල්ල ගත්තා.. පරිස්සමට සෙටියෙන් ඉන්දවලා ටිකක් වෙලා යද්දි ආයෙමත් සිහිය ආවා .. අයියගේ තුරුලෙම ඉදන්.. අයියා බේත් මොනාදත් දුන්නා... අයියම වත්තම් කරගෙන කාමරයට එක්කන් ගියේ මන් හොල්මන් වෙලා බලන් ඉද්දි. ටිකකින් එලියට ඇවිත්

"පරණ වෙච්ච් දේවල් මතක් වෙලා ශොක් එක වගේ සුද්දි එයාට. වීදුරු බිඳෙන සද්ද වලට වාහන හැප්පෙන සද්ද වලට හයි සෙන්සිටිව්"

"අනේ සොරි අයියා.. අත ලිස්සුවා.."

"ඒකට කමක් නෑ සුද්දි.. යමු මන් ගිහින් දන්නම්.."

"නෑ අයියා මන් යන්නම්.. අයියා ඉන්න රවීනා එක්ක.."

"නෑ නෑ මැනික මන් එන්නම් ඉන්නකෝ.."

"එපා අයියා.. නැගිටලා හොයයි ඔයාව ඔයා ඉන්න.. මට පුළුවන් "

"සොරි මගේ රත්තරන්..මිස් යූ සෝ.... මච් මැනික"

"මිස් යූ ටූ අයියා..."

චුට් වැළඳ ගැනීමකින් අනතුරුව පාරට ආවේ.. මේන් රෝඩ් එකේ හිත්දූ මෙතනින්ම නැග්ගැනි බස් එකකට.. මොනාද මේ වෙලා තියෙන්නේ..ඉස්සරහට මොන මොනා වෙයිද.. රිකී කෝම හැසිරෙයිද.. රිකීමත් නෙමේ මෙතන ලොකුම ප්‍රශ්නේ අපේ අම්මි අප්පච්චි කොහොම හැසිරෙයිද.. දෙයියනේ අනේ මන්ද මොනා වෙයිද කියල ... හෙමින් හෙමින් ඇවිදගෙන බස් හෝල්ට් එකට ඇවිත් පැත්තකට වෙලා ඉඳන් කල්පනා කරේ රිකී ඇහුවොත් මොනා කියන්න ද.. කොහොම කියන්න ද කියලයි. බොරු කියන්න බෑ එයාට.. වෙලාවක් තේරුනේ නෑ.. එක පාර කන ලගින් වගේ ඇහුන වාහනේක හෝන් සද්දෙට පියවි සිහියට ආවේ කල්පනා ලොවින් මිදිලා... දෙයියනේ රිකී.. එතකොට

මෙච්චර වෙලා ඇස් කොනින් දැක්ක කාර් එක එයාගෙද.. හෝල්ට් එකට ආවට ටික වෙලාවකට පස්සේ ටිකක් ඈතට වෙන්න කාර් එකක් නැවැත්තුවත් වැඩි සැලකිල්ලෙන් බැලුවේ නෑ ඒ දිහා... හනිකට අතේ බැදන් උන්නු වොච් එකෙන් වෙලාව බැලුවේ දෙයියනේ 6 ටත් ලගයි.. ලෙක්චර්ස් ඉවර වෙන්නේ 4 ට.. ගෙදර යන්න විනාඩි 20 යි යන්නේ.. මේ වෙනකම්ම..බොරුවක් කියන්න තුන් හිතක වත් සිතුවිල්ලක් තිබ්බෙ නැති තැන.. මාව ගැහෙන්න ගත්තේ කාර් එකෙන් බැහැලා මන් ලගට එන ටිකටයි..

"එනවා යන්න"

පරඬැලක් වගේ ඇදිලා ගියේ බයටත් එක්ක. දෙරත් ඇරලා ඇතුලෙන් ඉන්දෙව්වේ වචනයක් වත් කතා නොකරයි. කතාවක් නැතුවම පුළුවන් තරම් වේගෙන් කාර් එක ඩ්‍රයිව් කරේ බීච් එකටනම් නෙමේ.. බයයි ඒ මූණ දිහා බලන්නත්. ඇස් කොනෙන් වත් මන් දිහා නොබලාම ඩ්‍රයිව් කරේ එයාගේ අපාර්ට්මන්ට් එකට. ගේට් එකෙනුත් ඇතුලට දාලා. ඇතුලටත් ඇදෙගෙනම වගේ ගියේ ගොඩක් කේන්තියෙන්.. වියරුවෙන් වගේ කෑ ගහන්න ගත්තේ බයටම මට කඳුලු එද්දි

"තමුන් මොකද එතන කරන්නේ"

"කතා කරපන් උඹ මොකක්ද එතන කරන්නේ"

"බලපත් මන් කෝල් කීයක් ගත්තද කියල.. බය වෙන් නැද්ද මන්.. අඩුම ගානේ එක මැසේජ් එකක් දන්න බැරි උනාද කොහෙද ඉන්නේ මොකද කරන්නේ කියල.. "

"ඇයි එහෙම කියන්න බැරි දිහාක ගියාද"

ඒ කිව කතාවට මෙච්චර වෙලා පාත් කරන් හිටපු ඇස් උස්සලා එයා දිහා බැලුවේ කඳුලු වැක්කෙරෙන්න ගද්දි.. කියපු දේ බලපතලකමත්.. මන් අඩන දූකත් බලන් ඉන්න බැරිතැන ඇසිල්ලකින් මා වැළඳ ගත්තේ

"මං ගොඩක් බය උනා මගෙ රත්තරන්.. කවදාවත් ෆෝන් ආන්ස්වර් නොකර ඉන් නැ තේ මැනික ඔයා.. අනික පැය දෙකක් තිස්සේ.. මන් ගෙදරටත් ගත්තා මැනික ඔයාලැ.. ඔයාට තේරෙන් නැ මැනික ඒ බය"

"ම..න්.. වැරැද්...දක්.. කරේ නෑ අයි..යා..."

"අනේ මන් දන්නවා මගේ දෙයියෝ.. ගොඩක් සොරි මගේ රත්තරන් උපරිම කේන්ති ගිහින් හිටියේ... ශ්... නාඩා ඉන්න මගේ මැනික.. ශ්..."

වැටෙන හැම කඳුලක්ම සිප සිප ඇඩිල්ල නතර කරන්න මහත් උත්සහයක යෙදෙන තැන, දූක හිතිලම මන් ඇඩුම් නතර කර ගත්තේ ලා හිනාවක් මවාගෙනයි..

sinhalaebooks.com

"ශ්... නාඩා ඉන්න රත්තරන් මගේ.."

"හ්ම්ම්"

"මට කියන්න මැනික.. මොකද උනේ කියල.. මැනික කෝමත අතන බස් හෝල්ට් එකේ.. අයියා ආවේ නැද්ද කතා කරාට.. මගෙ රත්තරන් ට කරදරයක් උනෙ නැ නෙද ම්ම්ම්"

"මන් ලෙක්චර්ස් ඉවර වෙලා අයියට ගත්තා ලගක ඉන්නව නන් මාව එක්කන් එන්න කියන්න"

"ම්ම්ම්"

"අයියා ආවා"

"ම්ම්ම්"

"ප්‍රොමිස් වෙන්න මේවා අහල කලබලවෙන් නැ කියල"

"ම්ම් ප්‍රොමිස් "

"අයියා එක්ක රවීනත් ආවා"

"ම්ම්ම්"

"එයාලා දැන් ඉන්න ගෙදර ට එක්කන් ගියේ.."

"එයාලා..?"

"කලබල නොවී අහගන්නකෝ ප්ලීස්"

"මිම් කියන්න පැංචි..මන් අහන් ඉන්නේ.."

උනු දේවල් මන් දැන ගත්තු දේවල් අයියා කියපු දේවල් හැමදෙයක්ම කිවේ මන් වගේම කිසි දෙයක් හිතා ගන්න බැරුව සෙටියෙන් නැගිට්ද්දී...

"අයියා..."

"පැංචි..."

"මගෙ නංගී... ට ඇයි මැනික මෙහෙම දෙයක් උනේ.. අරූ... ඌ කෝ.. මට ඌව මරාගෙන මැරෙන්න හිතෙනව"

දුක කේන්තියකට හැරවිලා නේද..ආයෙත් පාරක් මාව ගැහෙන්න ගද්දි.. ඒ පපුවට තුරුල් උනේ.. එයත් ඊට අවනත වෙද්දි..

"ශේල්ට පිං මැනික.."

"ශ්...." අනේ ඒ ඇස් වල කඳුලු..

"මට බලන්න ඕනි රත්තරන් නංගිව..මට කතා කරන්න ඕනි.. ඇයි රත්තරන් එයා මේ වගේ දෙයක් කර ගත්තේ.. ඇයි මෙච්චර හදිසි උනේ.. ඉස්සරහට මොනවාවෙයිද රත්තරන්.. ඔයාලැ ගෙදරින් කීයටවත් මේ කිසිම දේකට කැමති වෙන එකක් නෑ රත්තරන් "

"ශ්.... අපි කලබල නොවී ඉමු අයියා.. රවීනා ඉන්නේ එච්චර හොඳ තත්ත්වෙක නෙමේ.. අපි ගිහින් ආයෙම ඕවා ඇවිස්සුවොත් එයා කෝම රිඇක්ට් කරයිද අයියා..අනික මේ 27 ඇඩ්මිට් වෙන්න තියේලු හොස්පිට්ල් එකේ.. අනේ කලබල නොවී මේ ප්‍රශ්න විසඳගමු අයියා.."

"මේ ප්‍රශ්න විසඳෙයිද මැනික.."

"විසඳෙනවා මගේ දෙයියෝ.. විසඳෙනවා අනිවාර්යයෙන්..."

වෙලාව රාත්‍රී 7යි..සෙට්යෙම මගේ ඔඩොක්කුවෙන් ඔලුව තියන් උන්නු එයාට හොඳටම නින්ද ගිහින්.. බෑග් එකෙන් ෆෝන් එක අරන් බැලුවම ඒක සයිලන්ට් .. ලෙක්චර් එකේදි සයිලන්ට් ද ගත්තු පාර. කිව්වත් වගේ කෝල්ස් 50 ක් විතර අරන් .. කේන්ති ගිය එක සාදරණයි.. අතේ තියන් ඉද්දිම අම්මිගෙන් කෝල් එකක් ආවේ ඇයි පරක්කු අහන්නයි.. අයියත් එක්ක එලියට ආවා.. ඉක්මනට එන්නම් කියල කට් කරේ ඒ මූණ දිහා බලලා. ගෙදර යන්නත් ඕනි.. ඇහැරවන්නත් ලෝබයි..

# 12 කොටස

ටිකක් වෙලා ඒ මූණ දිහා බලන් හිටියේ.. කොච්චර දේවල්නම් තියේද ඒ පපුවේ දරාගෙන. පිරිමි එහෙමයි නේද.. ගැහැනු වගේ අඩ අඩ හරි දුක පිට කරන්න තහංචි ඒ අයට.

පුළුවන් තරම් පුළුවන් තරම් දරන් ඉන්නයි බලන්නේ.. තලෙලු හම, තරමක් දිගු කොන්ඩේ , පිරිපුන් දිගු රැවුල වාත්තු කරල වගේ. හරි ලස්සනයි බලන් ඉන්න. දැනෙන නොදැනෙන ගානට ඇඟිලි තුඩු වලින් ඒ මූණේ රටා ඇඳලා.. හෙමිහිට තොල් තද කරේ එක කොපුලක් මතයි..

ඇසිල්ලකින් ඇස් ඇරියේ හිනාවක් රඳවගෙනමයි..

"මොනාද බලන්නෙ ආහ්"

"වැඩේමයි නේ.."

"ආහ් එහෙමද කෝ මෙහේ එනවා බලන්න" කියල සෙටියෙන් නැගිට්ටේ මාවත් නැගිට්ටවමින්. ඉනෙන් උස්සලා අර ගත්තේ වෙනදා වගේම මගේ කකුල් ඒ බඳ වටා එනෙද්දි. ඒ ඉරියව්වෙන්ම දෙතොල් වලට බර වුනේ මගේ ඇස් පිය වෙද්දි.. මිනිත්තුවක් දෙකක් නැ 10 ක් විතරම ඒ පහස විඳිද්දි.. දෑස් දිහා බලාගෙනම රැගෙන ගියේ නිදන

කාමරය වෙතයි. පරිස්සමට හෙමිහිට ඇඳ මතින් තබා නැවතත් සැරයක් ඒ දෙතොල් උණුහුමට බර උනේ ලා හිනාවකින්.. මොහොතකට ඉන් මිදිලා.. ඇහෙන නෑහෙන ගානට කනට කෙඳිරුවේ..

"තවත්..බෑ මැතිකහ්.."

ඉතින් ඔහු නිවෙන තැන මෙයයි. ජීවත් වෙන තැන මෙයයි. හුස්ම ගන්න තැන මෙයයි. තවත් කුමට වාරම් දනුද.. ඇස් වලින් හිනා වෙලා ඊට අවසර දුන්නේද ඇස් වලින්මයි. උණුසුම් තලලත හාදුවකින් ඒ අවසරය අරගෙනම ලස්සන හිනාවකින් මුවඟ පුරෝගෙන සූදනම් උනේ දෙදෙනාගෙම නැවුම් කුළුඳුල් අනුරාගික කාල පරිච්ජේදයකට ආරම්භයක්

ලබා දීමටයි. ජීවිතයේ එක් හැරවුම් ලක්ශයක්.

යළිත් නැඹුරු වූවේ දෙතොල් වලටයි. හෙමිහිට පරිස්සමට මුලු මූණම ඒ හාදු වලින් තෙත් වෙද්දි, ඒ සුසුම් වලින් තෙත් වෙද්දි, ගෙල දෙසට නැඹුරු වුනේ ලස්සන හිනාවකින්. ඇනෙන රැවුල් ගස් වලින් දැනෙන කිතියත් එක්ක, දැනෙන සුසුම් වලින් දැනෙන කිතියත් එක්ක, මත් එහෙට මෙහෙට දඟලද්දි, ඔහුට නම් හිනා. ගෙල පුරා ඒ කෝලම් ඉවර වෙද්දි හෙමිහිට ඔහු අතින්ම ලිහිල් උනේ ඇඳත් උන්නු බ්ලවුසයයි. අඩ නිරුවතින් සිටීමෙන් දැනුනු ලැජ්ජාවට..

sinhalaebooks.com

ඔහුගේ ගෙල බදාගෙනම ඒ පපුවට ගුලි උනේ මා ගැන හොදින් හඳුනන ඔහුද හිනාවකින් උනුහුමට ගද්දි.ඔහු ඇදන් උන්නු ඔෆිස් ශර්ට් එකද ඔහු අතින්ම ඉවත් කලේ ඒ උණුහුම හොදින් ලැබීමට වියයුතුයි. පිටුපසින් දුවන ඇගිලි වලින් හෙම්හිට තිසර පටයද ලිහිල් උනේ.. තව තවත් ඒ උනුහුමට ගුලි වෙද්දි....

"ඕම ඉද්දි බලන්නේ කෝමද බම්"

ඇහෙන නෑහෙන ගානට කනට කොඳුරද්දි, සියල්ල පැත්තක තියලා හිනාවක් ඇදුනේ ඒක කියපු විදියටයි. යලිත් හාන්සි වූයේ..දෑස් පියාගෙනයි.

"පුදුම ලැජ්ජාවක් දෙයියනේ මේක.."

"මගේ හාවි.. ලස්සනයි මැනිකෙ"

සුදුම සුදු බෝල ගෙඩි වන් පිරුණු ළැම මත දෙතොල් තැබුවේ, විනාඩි ගණනාවක් ඒ පහස විදිමින්. එක එක කෝලම් ඒවා මත. කුළුදුල් තුරුණු හැගුම් එකිනෙක එකිනෙක අවදි වෙද්දි, ඊලගට ඇදන් උන්නු ට්‍රවුසර් එක

ලිහිල් උනේ ඔහු අතින්මයි. මිනිත්තු කීපයකින් මුලුමනින්ම දෙදෙනාම නිරුවත් වෙද්දි යලිත් දෑස් පියාගත්තේ දැනුනු ලැජ්ජාවටයි.. එක හිස්තැනක් නැර හාදු වලින් සුසුම් වලින්

sinhalaebooks.com

ගතේ හැම තැනක්ම තෙත් වෙද්දි..

දැනෙන හැගුම් දැනෙන කිතියත් එක්ක ඒ අලුත් හැගුම් වලට නිදහසේ ගලන් එන්න ඉඩ දුන්නේ දෙදෙනානෙම ඉවසීම එතනින් නතර වෙද්දි.. ගෙවුනු හෝරාව ඉතාමත් ආදරණීය අනුරාගීක හෝරවක් වෙද්දි, සියුම් සිපගැනීම් රළු සිපගැනීම් එක්ක සියුම් කෙදිරුම් රළු කෙදිරුම් එක්ක රාගයේ අවසන් අන්තයේ පහසත් ලබමින් ඒ ආදරණීය හෝරාව නිමා උනේ.. උනුසුම් නළලත හාදුවක් අවසානයේ ලබමින් ඒ උනුහුමට ගුලි වෙමින්. සිරුර පුරා රැඳි දා බිදු එක්ක යලිත් ඔහු සෙල්ලමේ..

"මන් ගොඩක් ආදරෙයි මගේ රත්තරන්.. මගේ පණ ටික.."

"හී හි"

"ඔය හිනාව මාව නිවනවා මැනික"

"හී හී"

"මහන්සිද මිමි"

"හී හී"

"හී හී තමයි ඔක්කොටම මගේ හාවි.."

"හී හී"

"අයියා සිද්දුවද මැනිකට.."

"සොලි මයෙ රත්තරන්.. තලන්න ලෝබකමට හිටියට..තවත් ඉවසන්න බැරි උනාට.."

"ලැජ්ජයි අප්පා"

"අම්මේ හා..පුදුම ලැජ්ජාවක් මේක.."

ආයෙත් සැරයක් ඒ උනුහුම් පපුවට ගුලි උනේ කිසිත් නොකියායි.. කවුරු කෙසේ කෝම කිවත් මෙයද එක් මානසික සහනයකි.

"අද මා එක්කම ඉන්නද කල්පනාව මිම්"

වෙලාව මතක් උනේ එවෙලෙයි

"දෙයියනේ" කියමින් ඉද්ද ගහල වගේ කෙලින් උනේ ඉක්මනට ගෙදර යන්නෝනි කියල මතක් වෙලයි. ඒත් එක්කම ඇගේ නූල් පොටක් වත් නෑ කියල මතක් වෙලා ආයෙත් සැරයක් ඒ පපුවට ගුලි උනේ දෑස් තදින් පියාගෙනමයි.

"අම්මේෂ්.. කෝලමක් බම් මහ.. කෝ එනා මෙහේ ඇදුම් ඇද ගමු... "

"ඇස් අරිනවා ලමයෝ.."

බෑ කියන්න දෙපැත්තට ඔලුව වැනුවේ එයා හිනා වෙවීම

ඉද්දි.. මිනිත්තු කීපයකින්..

"හරි හරි ඔන්න මන් ඇද ගත්තා.. දැන් වත් ඇස් අරින්න මගේ හාවී.. යකඩෝ.. මෙච්චර දෙයක් වෙලත් හීටියා. දැන්නේ මේවා බලන්න බැරි ආහ්.."

"මගේ බෝල ගෙඩිය.. ඉක්මනට ඇද ගමු .. මෙහේ එනා.. ගෙදර යමු ඉක්මනට.."

ඇදෙන් නැගිට්නකොට දැක්කේ හරි ලස්සන දෙයක්.. හරි ලස්සනට අර සලකුණ එයාගේ බෙඩ්ශීට් එකේ..

"අර"

"මගේ හාවී.. මන් දැක්කා.. මගේ රත්තරනේ.. ඕක තිබ්බත් නැතත් ඔයා මගේ පිංවන්ති. මගේ හුස්ම ටික. මගේ පණ ටික. මගේ හැමදේම.

sinhalaebooks.com

මගේ වන් ඇන්ඩ් ඔන්ලි සුවීට් වයිෆ් තෝරගෙන ඉවරයි රත්තරන්.. ආයේ හැරීමක් නෑ ඉස්සරහට යන්න විතරයි තියෙන්නේ.. කිසිම හේතුවක් හින්ද අල්ල ගත්තු මේ අත, පණ වගේ රකින මේ හිත අතාරින් නෑ.."

ඒ වචන වලට ඇස් අග කඳුලු පිරෙද්දි තුරුල් උනේ ඒ පපුවට..

"මෙන්සස් ගිය සතියේ නේද.."

"ම්ම්ම්"

"ඒනම් බය වෙන්න දෙයක් නෑ.. පැටියෙක් එන එකක් නෑ මේ සූටි බණ්ඩියට.. ආවොත් හදා ගමු අනේ ඕවා ප්‍රශ්නද.."

"දෙයියනේ"

"ලැස්ති වෙනා.. වෙඩින් එකට.. නෙක්ස්ට් මන්ත්.."

"ආහ්..ඒත්"

"මොකෝ.."

"අයියලගේ ප්‍රශ්නේ විසඳලා අපි මැරි කරමු.."

"ම්ම්ම් ඉන්නවා නේද ඒ හැමතැනකදිම මත් එක්ක.."

"ඉන්නවා රත්තරන් "

"ඒ ප්‍රශ්නේ ඉක්මනට විසඳන්න ඕනි මැනික.. මටතේරෙන් නෑ මොනා වෙයිද කියල.. ඒත් නංගි ඩිලිවර් එක කරනකම්.. මැනික කිවත් වගේ ඉවසන් ඉන්න වෙනවා..."

"ඔව් අයියා.. අපි ඉවසමු"

"මත් හරි ආදරෙයි මගේ රත්තරන් උඹට.. උඹ ලගදි තිවෙනවා මත්.. ප්‍රශ්න අමතක වෙනවා.. ස්ට්‍රෙස් නෑ.. හරි සැනසීමයි මට..ඉන්නවා නේද මාත් එක්ක. මගේ හුස්ම කවදා හරි නවතින දවසක් වෙනකම්ම.. "

"මොනාද දෙයියනේ කියන කතා.."

පුළුවන් තරම් හයියෙන් ඒ කන මිරිකුවේ ආපු කේන්තියටමයි

"ආව් ආව් ආව්.. සුද්දි.. ආව් රිදෙනව රිදෙනවා.. අතාරින්න.. නියපොතු.. "

"රිදෙන්න තමයි කරන්නේ.. ආයේ කියනවද ඔහොම මූසල කතා ආහ්.."

sinhalaebooks.com

යන්තම් ලිහිල් කරේ පෞ හිතිලයි.ඇසිල්ලකින් තුරුල් කර ගත්තේ ඔහුමයි..

"ආදරෙයිද එච්චර ටම මිම්"

"ඔව්"

"මගේ පණ ටික.. කෝ මන් ආයේ කියන් නෑ.. තයිශූ ප්‍රොමිස්.. කෝ හිනා වෙන්න මගේ හා පැංචි"

උනුසුම් නළලත හාදුවක් දෙමින් එසේ පැවසුවේ..මටත් ලා හිනාවක් ඇදෙද්දි

"එනවා එනවා ගැලෙව්වේ මමනේ මමම අන්දන්න

කිසිත් නොකියා අන්දවනකම්ම ඉදලා

"කුකුළා"

"ආහ් ඇද ගත්තට පස්සේ නේද කට එන්නේ.. "

"ඒම තමා"

කියමින් සාලෙට දිව්වේ. ඔහුත් පස්සෙන් දුව එද්දි..

"හාව්යෙක්ම තමයි.. දුවනකොට.. යමු යමු පරක්කු වෙනව

මැනික ට"

දෙන්නත් එක්ක ඉක්මනටම කාර් එකට ආවේ ඉක්මනටම ගෙදර එන්නයි.. එද්දි එක තැනකින් වාහනේ නවත්තලා..

"ඕම ඉන්න විනාඩි 5ක්.."

කියමින් වාහනේ තුළම මාව තියලා එයා ගියේ ඉස්සරහ තිබ්බ සයිවර් කඩේකටයි.. විනාඩි කීපයකින්.. ලොකු බෑග්ස් දෙකකට.. උනු උනු උළුඳු වඩේ.. පරිප්පු වඩේ.. අල බෝල.. ගොඩායි... සුවඳට නම් කෙලත් ඉනුවා.. කොච්චි ලුනු මිරිසුයි, නිකම් ලුනු මිරිසුයි වෙන වෙනම ප්ලාස්ටික් කප් දෙකක දලා..

"මගේ පැංචි.. නවත්තලා කන්න වෙලාවක් නෑ නේ සත්තලන්.. ඒකයි ගෙනාවේ.. යන ගමන් කාලා..ඉතුරුවා ගෙදර ගිහින් කන්න හොඳද.."

"හා"

"ඔය ඇඟට අද ගොඩක් මහන්සී.. හොදට කනා මගේ හා පැංචි..."

"හා"

sinhalaebooks.com

එන ටිකට උණු උණු උලුදු වඩ දෙකකට තුනකට විතර වග කිවේ අරයටත් කෑල්ල කෑල්ල කවමින්.. ඉතුරුවා ගෙදර ගීන් කන්න තිබ්බා.. තව මිනිත්තු 10 ක විතර දුරකුත් තිබ්බා ගෙදර ට යන්න... දවස ගානේ දැක්කත් හම්බ උනත්.. ගෙදරින් දුල යන ටිකට නොදැක ඉන්න ටිකට හරි ලෝබයි..

"මොකෝ මිම් මොනාද බලන්නේ කන්න වගේ.."

" සිංදුවක් කියන්නකෝ "

"දැන්...."

"මිම් ඔව්"

"පිස්සි....මොකක්ද කියන්න ඕනි මිම්"

"මිම් ඔයා කිවේ හිතුනම සිංදු කියවෙනෝ කියල ඒ වගේ මේ වෙලාවේ හිතෙන සිංදුව කියන්න"

"ආහ්.. මේ වෙලාවේ මට හිතෙන දේවල් දැනගන්න නේද කපටියා.."

"මිම් ඔව්"

sinhalaebooks.com

දඟ කරනා සිත
සොයනා රස
මුව මී මල් ගොමුවේ

විඳ ගන්නට ඉඩ
දෙනවද මට
දැවටී මා සුරතේ

සුදු මීදුම් මැද
දුල තරු කැට
දකිනා ලෙස අඳුරේ

මුව වදනින් නොව
නෙති නෙත බැඳ
දකිමුද පෙම් සිහිනේ

ඔබේ ජී.......වි....තේ මගේ........කියා
මා හදවතේ......... ලියා........තියා......

ආදරේ......හේ................
ආදරේ......................මා නමින්......

ආදරේ......හේ................
ආදරේ......................මා නමින්......

sinhalaebooks.com

ලංවෙලා ආදරෙන්
මට උණුහුම දෙන්න සැමදා
ඔබ නමින් මා නිවෙමි
සෙනෙහෙන් සිප ගනිමි සැමදා

ඔබේ ජී.......වි....තේ මගේ........කියා
මා හදවතේ......... ලියා........තියා......

ආදරේ......හේ...............
ආදරේ.....................මා නමින්......

ආදරේ......හේ...............
ආදරේ.....................මා නමින්......

♬♬♬♬♬♬♬♬♬♬♬♬♬♬♬♬♬♬

වශී වෙලා වගේ අහන් හිටියේ.. හරි ලස්සනයි ඒ කටහඬ.. ඩ්‍රයිව් කරන ගමන්.. ඇස් වලින් කතා කර කර හරි අපූරුවට

පද මුමුණනවා..

හෙමිහිට හෙමිහිට අපි ආවේ අපේ ගෙදර ටයි.. ගේට් එකෙන් ඇතුලට දලා.. එයත් එක්කම ඇතුලට ගියේ. එයා සාලෙන් නවතිද්දි, මන් උඩ මගේ රූම් එකට යද්දි. ඉතින් පුදුමයි අද දවස නම්.. ජීවිතේ එක හැරවුම් ලක්ශයක් ඒ

විදියට පටන් ගත්තා.. හරි ලස්සනයි අද දවස. ඇදුම් උනා දමා වොශ් රූම් එකට වැදුනේ.. දහයයගේ දඟ වැඩ කැඩපතින් දකිද්දි.. පිරිපුන් ලැම මත , ගෙල දෙපස රතු වෙලා.. සැපුම් පාරවල් පිස්සගේ.. අම්මි ඒම දැක්කොත් අදම එලෝනවා ගෙදරින් පුදුම විසයක් නේ දෙයියනේ

මිනිත්තු 15 කින් විතර පොඩි වොශ් එකක් දගෙන අර රතු පැල්ලම් වහන්න ෆවුන්ඩේශන් ස්ටික් එකෙන් චුට්ටක් එක්ක පවුඩර් ටිකක් ගාගෙන ඇදුමක් දන් පල්ලහැට බහින්න හදද්දිම අම්මි යටි ගිරියෙන් කෑ ගහනවා ඇහුනේ. මගේ මුලි ගතම පණ නැති වෙද්දි.. අඩියට දෙකට සාලෙට දිව්වේ කිසිත් හිතා ගත නොහැකිව....

## 13 කොටස

යද්දි රිකී අම්මිව වත්තම් කරගෙන සෙටි එකෙන් ඉන්දවලා.. දුවල ගිහින් ලග දණ ගහගෙන.

"අම්මි... මොකෝ උනේ අම්මී...."

"මගේ පුතා... මගේ පුතා..."

"අයියට ඇයි අම්මී අයියට ඇයි.."

"මගේ පුතා....."

ඇය කිසිත් නොකියයි. එක දිගට අඩනව පමණයි. රිකී ඉක්මනට ගෙදර ලෑන්ඩ් ලයින් එක ලගට දිව්වේ කිසිත්

නොකියායි.

"අනේ අම්මිට මොකද උනේ අයියා.. ඇයි මේ අයියා ගැන කිය කිය අඩන්නේ.."

"ශිට් මේකේ කෝල් ලොග්ස් පෙන්නන් නැ නේද... "

"නැ අයියා ඕකේ නම්බර්ස් පෙන්නන් නැ.. දෙයියනේ මොකද උනේ කියන්නකෝ..."

ඇස් වලින් කදුලු වැක්කෙරෙනවා..

"ශ්... නාඩ ඉන්න පැංචි... කෝල් එකක් ආවා පැංචි.. ඒකෙන් පස්සේ කෑ ගහලා අඩන්න පටන් ගත්තා.."

"දෙයියනේ..."

"ඉන්නකෝ මන් ශේල්ට අරන් බලන්න.."

එයා අයියට ගන්නකම් මන් ආයෙම අම්මි ලගට ගියේ

"අම්...මි කතා.. කරන්...නකෝ අම්...මී.. අයි..යට මොකද කියන්න...කො අම්මි"

"මගේ පුතා... ඇක්සි...ඩන්ට්..."

"අනේ.. දෙයියනේ.. මගේ අයියා.."

ඒක ඇහිලා රිකී ඉක්මනට අම්මි ලඟට දුවන් ඇවිත්..

"අම්මා.. කවුද අම්මට කෝල් කරේ..කවුද විස්තරේ කිවේ..."

"මෙයාල...ගේ අප්ප...ච්චි කෝ...ල් කරේ... පුතේ... අනේ මගේ... දරු..ව..."

එසැනින් රිකී ආයෙමත් ෆෝන් එක අරගෙන අප්පච්චි ට කෝල් කරේ.. ටිකක් එලියට ගිහිනුයි.. මිනිත්තු කීපයකින් ආයෙමත් ඇතුලට ආවේ නළල රැලි කරගෙන බර කල්පනාවක... මුලූ ඇගටම දඩිය දලා...

"අයියා.. අනේ.. අප්පච්චි මොකද කිවේ කොහොමද මගේ අයියට..."

කතාවක් නෑ කිසිත්. අතින් අල්ලලා ටිකක් සද්දෙට..

sinhalaebooks.com

"අනේ දෙයියනේ කතා කරන්නකෝ අයියා..ප්ලිස්..."

"ම...න් ම...න් හොස්පිටිල් එකට යන්න ඕනා පැංචි.."

"අනේ අයියට කොහොමද කියන්නකෝ දෙයියනේ.."

"අයියට අවුලක් නෑ ලූ පැංචි.. මන් ඉක්මනට යන්න ඕනි..."

ඒ කතාවහරි අමුතුයි. මොකක්දෝ දෙයක් හංගනව වගෙයි.. හිතට ලොකූ....බයක් දැනෙද්දි.. හයියෙන් කෑ ගැහුවේ

"මොනාද දෙයියනෙ හංගන්නේ.. මොකද වෙලා තියෙන්නේ කියන්නකෝ.."

උත්තර නෑ..හතිකට එලියට දිව්වේ කාර් එක වෙතයි. අම්මිව දල එන්නත් බැරි තැන. මන් එහෙම්ම නැවතුනේ තවත් කිසිත් නොකියායි.. ඉක්මනට බුදු සාදු ලගට දුවන් ගිහින් අඩ අඩම ප්‍රාර්ථනා කරේ ඉල්ලුවේ අයියට කිසිම

කරදරයක් වෙන්නෙපා කියල යි.. හිත ඒ විදියට හයිය කරගෙන ලෑන්ඩ් ලයින් එක ලගට ගිහින් අප්පච්චි ට කෝල් එකක් ගත්තේ අම්මගේ හැඩුම් අතරමයි.

"අප්...ප..චි..චි.."

sinhalaebooks.com

"මගේ සුදු මැනික.."

"අප්..පච්චි.. අයියා.."

"අයියට මොකුත් වෙලා නෑ මගේ මැනික.. චුට්ට් ඇක්සිඩන්ට් එකක්.. අයියා හොදින් ඉන්නව මගේ රත්තරන්.. කෝ මැනික අම්මි.."

"අම්මි.. අඩනවා.. අප්පච්චි"

"අම්මි එක්ක ඉන්න රත්තරන්.. මන් අයියවත් එක්කන් ඉක්මනට එන්නම්..."

"අනේ බෑ..අප්පච්චි ප්ලිස්.. අපි දෙන්නවත් ඔතනට එක්කන් යන්න එන්නකෝ...අනේ ප්ලිස් අප්පච්චි.. මට අයියව බලන්න ඕනි අප්පච්චි...අනේ ප්ලිස් අප්පච්චි ගෙදර ඉන්න බෑ..ප්ලිස් අපි දෙන්නාවත් ගන්නකෝ අප්පච්චි ඔතනට.."

"හරි හරි හරි ශ්.... මගේ රත්තරන්.. අප්පච්චි ට මෙතන අයියව දාල එන්න බෑ නේ මගේ මැනික.. අප්පච්චි ඉක්මනට කැබ් එකක් එවන්නම්.. ඒකේ එනවද මයේ රත්තරන් පරිස්සමට .."

"අනේ හා අප්පච්චි.. මට අම්මි එක්ක තනියම ඉන්න ගොඩක් බයයි.. මට ඔහෙට එන්න ඕනි.. අනේ ඉක්මනට

එවන්න අප්පච්චි"

"හරි මැනික... පරිස්සමට ලෑස්ති වෙන්න ඉක්මනට මන් එවන්නම් කැබ් එකක්..."

ඉක්මනට ගිහින් අසිහියෙන්ම ඇඳුමක් ද ගත්තේ. අම්මිවත් ලෑස්ති කරගෙනයි.. මිනිත්තු 20 කින් විතර කැබ් එක ආවත් ඒ මිනිත්තු 30 පැය 20 ක් වගෙයි.. හනිකට අපි ආවේ සිටි කෙයා හොස්පිට්ල් එකටයි.. දෙපා ගැහෙන්න ගද්දි අම්මි එක්කම ඇතුලට ගියේ.. අප්පච්චි අපි එනකම් බලන් ඉද්දි.. දුවල ගිහින් ඒ උනුහුමට ගුලි උනේ, කඳුලින්මයි..

"අප්ප...ච්චි... අයි....යා.. කෝ අප්පච්චි"

"යමු මැනික අයියාව බලන්න.. අයියා හොදින්.."

හනිකට අඩි තියල අපි ගියේ අප්පච්චි පිටිපස්සෙනුයි. 547 යනුවෙන් අංක කර තිබුනු හොස්පිට්ල් රූම් එක ඇතුලට වැදුනත් මුලු ගතම පණ නැතුව ගියා වගේ දැනුනේ.. අයියා හිටපු විදියෙනුයි. බැන්ඩේජ් කරල මුලු ශරීරයම.ගොඩා තැන් වල තුවාල.ඔලුවත් බැන්ඩේජ් කරල.. නිසොල්මනේ වැතිරි ඉන්නවා.. අම්මි අඩන්න ගත්තේ අප්පච්චිගේ තුරුලේ ඉදගෙනමයි. කඳුලින්ම අයියා අසල වූ පුටුවකින් වාඩි උනේ ඔහු දිහා බලාගෙනමයි.

"මගේ අයියා.. ඉක්මනට සනීප වෙන්න මගේ අයියේ.. මගේ හයිය ඔයානේ..."

එක එක දේවල් මුමුණ මුමුණ ඉද්දි

"අයියට දීලා තියෙන බේත් වලට අයියා දැන්ම නැගිටින

එකක් නෑ මගේ සුද්දි. අයියා නැගිට්ටොත් අයියට රිදෙනවනේ මැනික.. ඒකයි අයියා නිදියන් ඉන්නේ.."

ඇසිල්ලකින් මතක් උනේ රිකීවයි. කලබලෙන්, හොස්පිට්ල් එකට ආවත්, මෙතන නෑ නේ කියල..

"අප්පච්චි..."

"මගේ රත්තරන් ..."

"අප්පච්චි රිකී අයියා.. ආවේ නැද්ද.."

"ආවා රත්තරන්...එද්දි අයියා තියෙටර් එකේ හිටියේ.. රූම් එකට චේන්ජ් කරනකම් ඉදල ගියෙ..."

හිතට අමුත්තක් දැනුනු හින්දු ම එලියට ඇවිත් කෝල් එකක් ගත්තේ එයාට. සෑහෙන වෙලාවක් රින්ග් උනාට පස්සේ කතා කරේ බිඳුනු කටහඬකින්

"පැ...ං...චී..."

"මගේ දෙයියෝ.. කොහෙද ඉන්නේ රන් ඔයා.. ඇයි හොස්පිටල් එකෙන් ආවේ..."

"ම..න්.. ආවේ නෑ පැංචි.."

කියන දෙයක් හිතා ගන්නබැරුව වට පිට බැලුවේ ඉන්නවද බලන්න උනත් පේන්න නෑ..

"කොහෙද ඉන්නේ රන්.. ඇයි මේ දුකින් කතා කරන්නේ දෙයියෝ"

"තියේටර් එක ලග ඉන්නේ මැනික"

"තියේටර් එක ලග ඉන්නේ ඇයි රන්.. "

කියද්දි මට මතක් උනේ රවීනාවයි.. දෙයියනේ අයියා එක්ක රවීනත් ඉන්න ඇතිනේ කියල මතක් උනේ එවෙලෙයි.. මුලු ගතම ඇවිලෙන්න ගද්දි අඩියට දෙකට නර්ස් කෙනෙක්ගෙන් අහගෙන තියේටර් එක ලගට ගියේ වෙව්ලන දෙපාවලිනුයි. අනේ අසල පුටුවකට කඩන් වැටිලා.. ද්‍රේතින්ම හිස බදගෙන ඔහු දැවෙනවා...

අඩියට දෙකට ගිහින් ඔහු වැළඳ ගත්තේ කිසිත් නොකියායි..

"මගේ රත්තරන්..."

"මැ..නි..ක..මගේ ... නංගී.."

"එයාට මොකුත් වෙන් නෑ මගේ රත්...එයාට මොකුත්ම වෙන් නෑ..."

"එ..යාට ගොඩ..ක් අමාරු...යි මැනික..."

"ශ්.... එයාට මොකුත්ම වෙන් නෑ රත්... ඉක්මනට සනීප වෙයි එයා බලන්නකෝ රත්.. ඉක්මනටම එයි ඔයා ලගට.."

කඳුලු සලනව ඔහු.. කෙසේ හංගන් ඉන්නද.. මොන ප්‍රශ්න තිබ්බත් කොච්චර තරහක් තිබ්බත් ඒ ඔහුගේම සහෝදරියයි.. එකම අම්මගෙ කුසින් ඉපදුන සහෝදරයෝ යි.. පැය දෙකක් විතරම අපි රැය පහන් කරේ එතැනයි.. අම්මි ලා ලගටත් කීප සැරයක්ම ගිහින් බැලුවාත්.. එයාල දෙන්නා ත් අයියාගේ රූම් එකේම තබා තිබූ සෙටිඑකකට

වෙලා නිදි.

පැය ගනනාවක සැත්කමකින් අනතුරුව ඩොක්ටර්ස්ලා එලියට බැස්සේ රිකී දිහා බලාගෙනමයි..

"ඩොක්ටර්... ඩොක්ටර් මගේ නංගිට.. කොහොමද ඩොක්ටර්.."

"අයි ඈම් වෙරි සොරි මිස්ටර් රකීත්.. අපි පුළුවන් තරම් ට්‍රයි කරා ඒත්"

## 14 කොටස

"දරුවව නම් බේර ගන්න බැරි උනා මිස්ටර් රකීත්. ගොඩක් ඩැමේජ් වෙලා තිබ්බා එයාට.. She is a girl, but she is gone. We are very sorry. "

"ඩොක්ටර් මගේ නංගි..."

"එයා හොදින් මිස්ටර් රකීත්.. ඒත් ඔලුව ගොඩක් ඩැමේජ්... ගොඩක් දුරට මෙමොරි ලොස් එකක් වෙන්න පුළුවන්.. ඒම නැත්නම් කෝම එකක්.. උදේට සී ටී ස්කෑන් එකකට ගන්නව. එතකොට රිපෝට් එක බලමු. කොහොමත් සිහිය එනකන් මොකුත් කියන්න බෑ.."

ගිනි කන්දක හිටිය ඔහු ටිකක් නිවුනේ රවීනා හොදින් කිවමයි.. ඒත් අර කිසිත් නොදන්න කිරි සප්පයා.. ටික වෙලාවකින් බ්ලැන්කට් එකක ඔතාගෙන නර්ස් කෙනෙක්

sinhalaebooks.com

අරන් ආවේ ඒ කිරි කැටි දේහයයි.. අනේ කොහොම වාවන්නද.. මේ ලෝකේ එළිය දකින්නත් කලින්ම එයා මේ ලෝකේ දාල ගිහින්.. ඒ රුව කාගෙද කියන්න නම් දන් නෑ.. විටෙක එය බබාගේ තාත්තා ගේ රුවට සමාන යැයි සිතේ. විටෙක එය රවීනගේ රුවට සමාන යැයි සිතේ තවත් විටෙක ඒ දෙදෙනාගෙම නොවන පෙනුමක් ඇතැයි සිතේ...

මුලු ගතම පණ නැතිව යනවාක් මෙන් දැනෙද්දි, ඇස් වලින් කඳුලු ද්‍රේරේ ගලන්න ගත්තේ..අවුරුදු 25 ක්ම කිරි කැටියන්ගේ හිනාවල් ඇඩුම් පමණක්ම දැන තිබුනත්.. මෙලෙස මෙලොව අතහැර ගිය කිරි කැටියෙකු දැක තිබුනේම නෑ.. වෙව්ලන දෑතින් නර්ස් ගෙන් පැටියව අතට ගනිමින් ලග තිබුනු යකඩ පුටු පෙලක කොනකින් වාඩි උනේ.. රිකීද ඇවිත් පසෙකින් වාඩි වෙද්දි... අනේ ඇත්තටම ඒ රුව හරි ලස්සනයි... වාවන්නේ කොහොමද තවත්... අනේ පැටියට අම්මගේ උනුහුම විදින්නවත් බැරි උනා..

"අනේ මැනික...ඔයා කාට වරදක් කරලද මගේ මැනික ඔයාට මේම උනේ...."

තවත් ඉවසගනු බැරි තැන, ඒ කිරිකැටි දේහය තුරුල් කරගෙන ඇති වෙනකම් ඇඩුවේ.. රිකිත් මට තුරුල් වෙලාම කඳුලු සලද්දි...

sinhalaebooks.com

කොච්චර දෑ ඉවසුවත් පිරිමි හිතකට මෙහෙම දෙයක් දරා ගන්න අපිට වගේම අමාරු ඇති..

"බබාව දෙන්න මිස්.. ඩෙඩ් සර්ටිෆිකේට් එක ට ඩීටේල්ස් දාන්න බබාව ඕනි.."

නර්ස් ඇවිත් ඉල්ලුවත්.. හිතක් නෑ දෙන්න නම්..
අපහසුවෙන් ඇඩුම් ඉවසගෙන ඒ හුරතල් හරි ලස්සන මූණ අතගාලා ඒ පුංචි හිස මත දෙතොල් තද කරේ..

"ආයෙත් සැරයක්.. මගෙම කුසේ ඉපදෙන්න මගේ රත්තරන්.. යන්නෙපා වෙන කා ලගටවත්.. මගෙම කුසේ ඉපදෙන්න.."

හරි පරිස්සමට ඒ දේහය නර්ස් අතට දුන්නේ.. ඒ පුංචි අතක් මගේ අතේ පැටලෙද්දි.. පරිස්සමට ඒ අත අල්ලලා හරියට හදන්න යද්දි දැක්කේ හරි ලස්සන උපන් ලපයක් ඒ අතක.

පුංචි බෝල දෙකක එකතුවක් විදියට චුටි හාට් එකක් හැඩේට හැදුන උපන්ලපයක්.. ඇඩුම් මැඩගෙන පසෙකට කිසිත් නොකියායි..

"ඔයාල බොඩි එක භාර ගන්නවද.."

sinhalaebooks.com

රිකී දිහා බැලුවේ.. මේ දේවල් කොහොම අම්මට අප්පච්චි ට කියන්න ද හිතිලයි..

"හොස්පිට්ල් එකේම අවසන් කටයුතු කරන්න නර්ස්.."

උගුරෙන් වගේ ඔහු එසේ පැවසුවත් හිතකින් නෙමේ.. හා කියල ඔලුව වනලා නර්ස් ඉවත්ව යද්දි, වැරෙන් ඔහුව වැළඳ ගත්තේ තවත් පැය කීපයක් ඒ විදියට ගත වෙද්දි, රැය පහන් උනේ එතනමයි..

අම්මා අප්පච්චි මේ දේවල් දැන ගත්තිත් ලොකු ප්‍රශ්නයක් වෙන හින්දම උදේ වෙන්න මොහොතක් තියල මන් අයියා ඉන්න රූම් එකට ගියේ අකමැත්තෙන් උවත් රිකීව එතන තනියම දලයි..

රූම් එකේම තිබ්බ බාත් රූම් එකෙන් මුහුණ අත පය සෝදගෙන ප්‍රයිවට් හොස්පිට්ල් එකක් වූ මෙහි උඩම තට්ටුවක පිහිටි රූම් එකක් බැවින් ඈතට මුහුද පේනවා..ඈත පේන මුහුද දිහා බලන් කල්පනා කරන් මැවේන්නේ අර කිරි කැටි රුවම පමණයි..

"සුද්දි.."

"අප්පච්චි.."

"රෑට කෑම කෑවේ නෑ නේද මැනික.."

බඩගිනි නෑ අප්පච්චි.. "

"අම්මිටයි මටයි මෙතනම හොඳට නින්ද ගියා මගේ රත්තරන්.."

"අනේ ඒකට කමක් නෑ අප්පච්චි.. අයියත් නැගිට්ටම අපි කමු"

ටිකකින් අප්පච්චි එලියට ගියේකෑම අරන් එන්නයි.. අම්මිත් වොශ් රූම් එකට වැදුනේ.. මූණ කට සෝද ගන්නයි. එක වර අඩියට දෙකට අයියා ලගට පා තැබුවේ.. ඔහු අපහසුවෙන් ඇස් අරින්න දරන උත්සහය දුටු බැවිනි.. හිතට මහත් සැනසිල්ලක් දැනුනේ ඔහු ඇස් ඇරිය විගසයි.. ඒත් ඒ ඇස් කලබලයි.. අපහසුවෙන් වචන කතා කරන්න යනවාක් දැනේ..

"මගේ අයියා.."

"සු....ද්...දි...ත්"

"අනේ අයියා ශ්.. කතා කරන්න එපා.."

"සු...ද්...දි...ත්.. මගේ.. ර..වී..නා.."

ඔහු කලබලයි.. හොඳටම කලබලයි..

"ශ්... අයියා එයා හොදින්න්...අනේ අයියා කාම් ඩවුන් ප්ලිස්.. එයා හොදින්න්.."

"ම...ට... බල..න්..න ඕ..නා මැ..නි..ක..හ්"

"ට්‍රස්ට් මී අයියා.. තයිශූ ප්‍රොමිස් එයා හොදින්.. අපි ඉක්මනට යන් එයාව බලන්න.. ට්‍රස්ට් මී.. එයා ගොඩක් හොදින්.. "

"ඇ...ත්..ත..ම..ද මැනි...ක"

"ඇත්තමයි අයියා..මන් බොරු කියන් නෑ.... ප්ලිස් ඉක්මනට සනීප වෙන්න අපි බලන්න යන් රවීනව.. එයා ලග රිකී ඉන්නවා.. හොදද... ප්ලිස්ස්... අප්පච්චි ලා මේ කිසි දෙයක් දන් නැ අයියා.. ප්ලිස්.. අනේ මොකුත්ම අගවන්න එපා..."

යම් දුරකට කන්ට්‍රෝල් උනා.. අම්මිට සද්දේ ඇහිලා අම්මි එලියට ආවේ කලබලේනුයි..

"අනෙ මගේ පුතේ..."

දුහක් දේවල් කියමින් අම්මා කදුලු සලන්න ගත්තෙ. මන් ඇස් වලින් කලබල වෙන්නෙපා කියල අගවද්දි..

වෙලාව උදෑසන 9 ටත් කිට්ටුයි.. රිකී ලගට යන්න ඕනා

උනත්.. යන්න විදියක් තුබුන් නෑ අම්මි අප්පච්චි දෙන්නම ඉන්නවා.. අයියට නම් සතියක් විතර ඉදලා ගෙදර යන්න පුළුවන් කිව්වා ඩොක්ටර් ස් ලා.. ඒත් රවීනට මොනවා කියල ඇතිද.. දෙයියනේ නරක කිසිම දෙයක් වෙන්නෙපා..

රිකීට කෝල් එකක් අරන් එන්නම් කියල එලියට බැහැල අඩියට දෙකට දිව්වේ ඔහු හොයාගෙනයි. තවමත් උන් තැනමයි ඔහු..

"මගේ රත්තරන් ආවද මැනික අයියට කෝමද.."

"අයිය හොදින් රන්.. රවීනට මොකද කිවේ කියන්නකෝ ඩොක්ටර්ස්ලා.. එයා හොදින් නේද..අර ස්කෑන් එක කරාද.. කියන්න කෝ නරක දෙයක් වෙලා නෑ නේද.. අනේ කියන්නකො.."

"එයා කෝම එකක මැනික.. ඒවගේම ඔලුව ගොඩක් ඩැමේජ් හින්දු එයා කවදහරි ඇහැරෙන දවසක එයාට මොකුත්ම මතක තියෙන එකක් නෑ... ඩොක්ටර්ස්ලා චෙක් කරා.. තව ටිකකින් රූම් එකකට චේන්ජ් කරනව කිව්වා.."

"දෙයියනේ.."

"ම්ම්ම් එක අතකට ඒක හොදයි මැනික.."

"ඈයි"

"එයාට මේ කිසි දෙයක් මතක නැති එක හොදයි මැනික.. මතක තියන් විදවනවට වැඩිය.. සිහිය එන දක් වෙද්දි තුවාලත් සනීප වෙලා තියෙයි.. හිතත් නිදහසේ තියෙයි.. මේ හැම දෙයක්ම මැනිකගෙයි මගෙයි ශේල්ගෙයි හිත් වල විතරක්ම තියෙයි.. ඉතින් ඒක එයාට පහසුයි නේද..."

"හ්ම්ම්ම්"

"මගේ මැනික කෑවද.."

"නැ බබූ මට කන්න බැ අප්පච්චි කෑම ගෙනාව ඒත් කන්න බැ ඔයා නැතුව"

"මගේ රත්තරන්" කියන ගමන් මාව ඒ තුරුලට ගත්තේ..

හෙම්හිට හිස් පිරිමදිමින්

"මගේ හයිය වෙලා මත් එක්කම ඉන්නවට පිං මැනික.."

"මත් ආදරෙයි අයියා"

"මාත් ආදරෙයි මගේ පැංචි.."

"ඔයාගේ අම්මි කතා කරෙ නැද්ද ඔයා මොනාද කිව්වේ අම්මිලට.."

"මන් අපාර්ට්මන්ට් එකේ ඉන්නේ කියල කිව්වා මැනික.. කොහොමත් වැඩි හරියක් ඉන්නේ එහෙනේ මිම්.. අවුලක් නැ ඒ හින්දා..."

"හ්ම්ම්"

මාස 3 පසු............

අදට හරියටම තෙමසක්.. ඒ රත්තරන් කිරි කැටියා මේ ලෝකේ අත ඇරලා ගිහින්.. ඒ චූටි මැනික වෙනුවෙන් මේ වෙද්දි පිංකම් ගොඩාක් කරේ මන් හැමෝටම හොරෙන්. එදා ඒම වෙලා සතියකට පස්සේ අයිය රවීනව බලන්න ගියේ රවීනට වෙන් වූ රෝහල් කාමරයටයි.. සම්පූර්ණ විස්තරේ දැන ගෙන සියල්ල දරාගෙන එදා පටන් අද වෙනකම්ම එක මොහොතකට වත් රවීනව තනි නොකර ඔහු කාලේ ගෙව්වේ මෙතනමයි.. ගෙදර ට බොරු පිට බොරුකියමින් නොසෑහෙන වෙරක් දරලා රිකීත් මමත් අයියත් මාරුවෙන් මාරුවට ඇගෙ තනි මැකුවේ දැන් නැගිටීවි දැන් නැගිටීවි යන බලාපොරොත්තු ඇතුවයි.. දැන් ඇය මුලුමනින්ම සුව වෙලා.. කලකට කලින් දිරපු දුර්වල උනු සිරුර ආයෙම ලියලලා ඇවිත්. මවක් වෙලා සිටියාද

යන්නත් සෙවිය නොහැකි

තරම්ම ඇය සුව වෙලා..

"සුද්දි..."

"අයියා.."

"මන් ආවනේ සුද්දි .. මැනික යන්න ලෙක්චර්ස් වලට.. එග්සැම් නේද නෙක්ස්ට් වීක්"

"ඔව් අයියා.."

ටික වෙලාවකින් අහම්බෙන් වගේ දැක්කේ ඇයගේ සුලැඟිල්ලක් සෙලවෙනවා සේයි. හිතේ මැවුන දෙයක් වෙන්න ඇති හිතලා යන්න සැරසෙද්දි.. ආයෙත් සැරයක් ඒ දේම දැක්කේ.. ලස්සන හිනාවක් මගේ මුවගට එද්දී...

"අයියා රවීනා.."

"ඇයි මැනික..."

"අයියා එයා නැගිට්ටින්න හදන්නේ.."

"මොකක්ද කියන්නේ සුද්දි.. ඔයා මොනාද දැක්කේ සුද්දි.."

"අයියා එයාගේ චූටි ඇඟිල්ල හෙලවෙනවා දැක්කා..එයාට අපිව ඇහෙනව ඇති අයියා.."

අයියා ටත් ලස්සන හිනාවක් එද්දි ඇයට ලන් වෙලා නලලට උනුසුම් හාදුවක් දීලා ඇයත් එක්ක කතා කරන්න ගත්තේ ඇය අහන් ඉන්නවා කියල දැනිලයි.. මේ විස්තරේ රිකීට කියන්න කෝල් එකක් ගන්න උඩ පැන පැන එළියට යන්න

හදද්දිම ඔහු දොර පාමුල..

"හා පැංචි.. කොහෙද මේ පැන පැන යන්නේ ආ.. තව ටිකෙන් විසි වෙනව ගිහින්

"අයියා රවීනා ඇඟිල්ලක් හෙලෙව්වා.."

"අනේ ඇත්තමද මගේ රත්තරන්..මට හරි සතුටුයි මැනික.."

"ම්ම් ඔව් ඇත්තමයි බලන්නකෝ ගිහින්"

ලස්සන හිනාවකින් සැරසිලා පරිස්සමට අඩිතියල ගිහින් රිකී ඇයගේ නළලත හාදු තැවරුවේ..

"ඉක්මනට නැගිටින්න මගේ රත්තරන් ... අයියට ගොඩක් පාලුයි.. ඔයාගේ ශේල්.. ඔයාගේ චූටි නෑනා.. ඔයා එනකම්

බලන් ඉන්නව මැනික.. ඉක්මනට නැගිට්ටින්න.."

සතුටුයි අපි තිදෙනාටම. ඉතින් දැන් බලන් සිටින්නේ ඇය අවධි වෙනකනුයි..

ඇගේ එක අතක් අයියා පිරිමදිමින් ඉද්දි.. රිකී ඇගේ හිස පිරිමදිමින්.. කොච්චර වාසනාවන්තද මෙහෙම ආදරයක් ලබන්න.. ඈත ඉදන් මන් බලන් උන්නේ ඒ දෙසයි.. දැන් මට වගේම ඇයටත් ඒ දෙන්නගෙම ආදරේ හම්බෙනවා. හිත පිරීලා ඒ සතුටට..

"ඉක්මනට නැගිට්ටින්න රවීනා මැනික... ඔයාගේ අයියයි, අයියා තරම්ම මේ ලෝකේ ඔයාට වැඩිපුරම ආදරේ කරන ඔයාගේ ශේල් ඔයා ඇහැරෙනකම් බලන් ඉන්නවා.."

හිතින් මුමුණමින් ඇයදෙස බලන් හිටියේ දහසක්

බලාපොරොත්තු එක්කයි. එක වරම අපි දූටු දෙයින් අඩියට දෙකට මන් ඇගේ ඇද වෙත ලන් උනේ.. මහත් වෙහෙසකින් ඇස් අරින්න හදනවා.. තත්පර කිපයකින් හෙම්හිට හෙම්හිට ඇය ඇස් ඇරියේ අපි තුන් දෙනාගෙම ඇස් වලට කදුලක්ක් උනද්දි..

"මගේ රත්තරන්" කියමින් රිකී ඇය වැළඳ ගත්තේ.. ඇය ලස්සන හිනාවකින් ඔහුගෙ තුරුලට වෙද්දි...

"මට.. මොක..ද.. උනේ.. අයියා.."

"චුට් ඇක්සිඩන්ට් එකක් උනා මැනික.. චූට් කිව්වට චූට්ම නෑ ඉතින්.. ඔලුවට චුට්ටක් ඩැමේජ් උනා.. කෝම එකක හිටියේ මගේ රත්තරන් මේ වෙනකම්. "

"ඔලුව රිදෙනව අයියා මට මොකුත් මතක නෑ නේ.."

"මතක තියෙන්නේ කෝමද බම්.. ඔච්චර ලොකු ඇක්සිඩන්ට් එකක් වෙලා.. ඔයින් බේරුනා මදැයි.."

රිකී හදන්නේ විහිලුවෙන් ඇයව කන්ට්‍රෝල් කර ගැනීමටයි..

"මේ කවුද "

"පුරුදු නැද්ද ම්ම්ම්"

කටහඬ අවධි කරේ අයියායි.. රිකී කිසිවක් නොකියා පසෙකට උනේ..මගේ ලගටයි.

"පුරුදුයි වගේ.."

"ඔයා මගේනේ මැනික" ලස්සන හිනාවකිම් අයියා රවීනව වැළඳ ගත්තත් ඇගේ මූහුනේ ප්‍රශ්නාර්ථ ලකුනු ගොඩයි.. එය සාදරණයි නොවේද.. ඇයද මවා ගත්තු හිනාවකින් රිකී දිහා බැලුවේ..ඔහු ඔව් යනුවෙන් පවසා ඔලුව වනද්දි..

"මට මතක නැත්තේ ඇයි ඔයාව"

"මාව හම්බුනේ ලගදිනේ මැනික මිම්.. හම්බෙලා ටික දවසකින් තමයි අපි දෙන්නවම ඇක්සිඩන්ට් උනේ.. ඔයාට විතරක් නෙමේ උනු ඩැමේජ් එකට මටත් ඔක්කොම අමතක උනා..ටික දවසක් ගියාමයි මතක් උනේ.."

"ඇත්තමද....."

පවක් නෙමෙයි මෙය.. හිතක් හදන්න බොරු කිව්වා කියල.. මට හිතෙන්නම ජීවිතයක් වෙනුවෙන් බොරු කිවත්.. ඒක බොරුවක් උනත්.. ඒක ඊට වඩා පිනක් කියල.. අපහසු උනේ නෑ ඇයට උනු දේ බොරුවකින් තේරුම් කරන්න..

ටික වෙලාවකින් ඔවුන් දෙදෙනා ආදරෙන් හිටියේ.. පෙර කිසිවක් නොවුවාක් සේයි.. ඇත්තටම ඒ උනු සියල්ල අපේ හිත් වලම වැළලිලා යාවි.. අපි තුන් දෙනා විතරක් නෙමේ..තව දෙන්නෙක් මේ රහස දැන ගෙන උන්නා. ඔව් ඒ වෙන කවුරුත් නෙමේ.. රිකීගෙයි රවීනගෙයි අම්මයි අප්පච්චි යි.. ඔවුන් දෙදෙනාට ගොඩක් සතුටුයි අද රවීනා එක්ක අපේ අයියා ඉන්න එක ගැන..ඉතින් දෙමව්පියෝ එහෙමයි..

sinhalaebooks.com

## අවසානයට පෙර කොටස

එක පාරක් වැරදි තීරණයක් හින්දා ජීවිතේ වරද්ද ගත්තු රවීනට, අද දෙවෙනි අවස්ථාවක් හම්බෙලා ජීවිතේ හරිගස්ස ගන්න. ඉතින් ජීවිතේ එහෙමයි.. ඒකත් හැමෝටම ලැබෙන් නෑ.. පින තියෙන්න ඕනි.. අද ඇයට හැම දේකින්ම

පරිපූර්ණ ලස්සන ආදරයක් හම්බෙලා. අද ඇයට පොඩි කාලේ ඉදන් හරියට විදින්න බැරි උනු සහෝදර බැදීමක් හම්බෙලා.. අද ඇයට නරක සමාජ ඇසුර මුලුමනින්ම නැති වෙලා.. අද ඇයට වාසියට විතරක් ඇගේ ජීවිතයට ආපු හැමෝම නැති වෙලා.. ආදරණීය අය පමණක්ම ඉතුරු වෙලා.. අද ඇගේ හොදම මිතුරිය වගේම එක කුසේ උපන් සහෝදරිය වෙලා ඉන්නෙත් මමයි.. ඉතින් ඇය පිං කාරියක් නොවේද..

"අර්.......................මොකද යක්සනියේ වෙලා තියෙන්නේ "

"අම්මි ඇහැරවන්න කිවා ඇහැරුන් නෑ නේ ඉතින් වතුර ගැහුවා.."

"හිටපම් අද මම.........."

කල්පනා ලෝකයකින් මම් මිදුනේ එක පාර වැදුන වතුර බකට් එකකින්. සර්වාංගෙම තෙත් වෙලා යද්දි මුලින්ම කරේ දෙර ලගට ගිහින් ලොක් එක දල යතුර ගත්තු එක. වෙලාව පාන්දර 1 යි. රෑයෙහි නින්දක් නොවුනා. ඒ මදිවට මෙ යස්සනී වතුර එකකුත් ගැහුවා මේ පාන්දර.. ඔව් ඔව් වෙන කවුරුත් නෙමේ ඒ රවීනා මෝඩි. කලින් කිව්වානේ දැන් අපි හරි එකතුයි..

කොනකට වෙලා බකට් එකෙන් මූණ වහගෙන ඉන්නේ ඒලගට මගේ ප්‍රහාරය කියල දැනගෙනයි. යතුර ගත්තු හින්ද යනව බොරු එලියට.. ඉක්මනට බාත් රූම් එකට දුවලා වොශින් මැශින් එක ලග රෙදි දල තිබ්බ බකට් එක ට වතුර එකක් පුරෝලා මාත් මගේ ප්‍රහාරය එල්ල කරේ උපරිම සැරට.. දෙන්නම ඇදන් උන්නු දුහුල් නිදන ඇදුම් වලින් වතුර ට තෙත් උනාම හොදට කැපිලා පේන අවයව සැක්

විලි ලැජ්ජාවේ බැ..

"අඩ්ඩෙ... අයියා දකින්න ඕනා ඒවා මට පෙන්නන්නේ ඇයි යකූ..." මේක බෙරිහන් දෙනව නේද හූ කිය කිය.

"මටත් අහන්න තියෙන්නේ ඒකම තමා බලහන් හැටි" මාත් ඒට දෙවෙනි නොවී කෑ ගැහුවේ රවීනගේ මූණ දෙක වෙද්දි..

" සුද්දි......... මොකද කරන්නේ ආ කෑ ගහ ගහ"

"හරිනේ දැන් බැනුම් අහපම් රවීනෝ... ඈ"

"අරිනව දෙන්නම මේ දෙර.. "

අම්මට එක සිය ගානට තරහ ගිහින්. ශේප් දෙර ඇරියේ.. අප්පට සිරි අපේ අම්මි විතරක් නෙමේ රිකීලෑ අම්මිත් එතන. නැන්දම්මලා දෙන්නම විලිය දැක්කනේ අඩේ සැක්. දෙන්නම ඇස් ලොකු කරන් බලන් උන්නේ. අපි දෙන්නා හොර පූසියෝ වගේ බිම බලා ගද්දි. දෙන්නගෙම අතේ වතුර බකට් දෙක ගම කනව අද නම්..

"මන් කිවා නේද නංගි. මන් කිවේ.. ඔන්න ඔය දේ හින්දමයි මන් අර ඉස්සරහ කාමරේ ඇඳුම් අන්දන්න ලෑස්ති කරල තියමු කිවේ.. බලන්නකෝ මේකේ කරන්න ලෑස්ති කරල තිබ්බ නම් මොනවයින් මොනවා වෙයිද.පේනවනේ දෙන්නගේ වැඩ. මුලු කාමරේම වතුරෙන් නෑවිලා. අර පේනවද ඇඳවල් ගන්න දෙයක් නෑ. ඌරු කොටුවක් වගේ මේක "

අපේ අම්මි බෙරිහන් දෙද්දි රිකීලෑ අම්මි නම් හිනා වෙනවා..එයා හරි ෆ්‍රෙන්ඩ්ලි අපේ අම්මිට වැඩිය.

"ඉක්මනට වොශ් එකක් දන් එනව දෙන්නම. බලන්නකෝ නංගි. අඩුම ගානේ අද මේ දවසේවත් ඉන්න බැ නේ

ටිකක් පිලිවෙලකට ඔය දංගලේ අඩු කරන්.. ඒම නෑ උදේ පාන්දර පටන් අරන්. අනේ මන්ද අපේ කොල්ලො දෙන්නාට මොනවයින් මොනා වෙයිද කියල මේ දෙක සහේට අරන්.."

අම්මි කියෝන විදියට හිතත් යනවා..

"නෑ නෑ අක්කේ.. ඕම තමා මේ වයසට.. අපි යමුකෝ අක්කේ.. මේ දෙන්නා එයි ඉක්මනට පල්ලහැට.. "

"අම්මෝ රිකීලෑ අම්මට පිං සිද්ද වෙන්න අපේ අම්මිගේ රේඩියෝ චැනල් එකෙන් බේරුනා"

ශේප් එකේ යනකම් ඉදලා ආයෙත් සැරයක් දෙන්නම දිව්වේ බාත් රූම් එකටයි. වොශ් දාන්න නෙමේ වතුර පූරවන්න. බකට් දෙක තුනක් ගහගෙන දැන් නම් මහන්සි.

"ඒ ඇති ඇති හලෝ.බලහම් අපේ හැටි. අයියා දැක්කොත් ඒම බදින එකක් නෑ බම් මාව"

රවීනා අඩෝවැඩියාව පටන් ගත්තා.

"කෝ මෙහේ එනව අපි සෙල්ෆියක් ගහල යවමු. "

සනික ෆෝන් එක අරන් බාත් රූම් එකේම සෙල්ෆියක් ගහලා අපි හතර දෙනා ඉන්න වට්සැප් ගෲප් එකට දැම්මේ ඒ මැසේජුත් එවෙලෙම සීන් වෙද්දි

අපේ අයියා මේම එවලා

රිකී මේම එවලා

අපි දෙන්නම මේම යවල නිකම් හිටියා. දෙන්නා ගෲප් එකේ බනිනව හොදට. එක මැසේජ් එකක් වත් සින් නොකර අපි වැදුනේ වොශ් එකක් ද ගන්නයි..

බලනව ඇති ඔයාල මොකක්ද මේ කලබලේ කියල අද තමයි අපි හතර දෙනාගෙම වෙඩින් එක හාද.. දැන් මේ පාන්දර එකේ ඉදන් පිස්සු නටන්නේ අපි ඩෙන්නගෙ වෙඩින් එක දවසේ. අපේ අම්මි බනින එක සාදරණයි නේද

කෝම හරි පාන්දර කියල බලන් නැතුව නාල කොන්ඩ වේලගෙන ටවල් පිටින්ම ඉස්සරහා කාමරේට දිව්වේ අන්දන අක්කලා දෙන්නා ඇවිත්. දෙන්නවම අන්දවන්න ඕනා හින්ද දෙන්නෙක්... අපේ අයියා යි රිකී අදින්නේ රිකීලෑ ගෙදර එතකොට යාලු මනමාලයෝ මනමාලියෝ න් ට අන්දන්නේ වෙනමම සැලුන් දෙකක. වෙන කවුරුත් නෙමේ යාලු මනමාලියෝ දුනී මීහු මිනූ සහ ඇන්.. ආ ඇන් කිවම මතක් උනේ.. දැන් ඇන් හිරූ ලව් එක නැගල යනව ඈ.. යාලු මනමාලියෝ තමයි අපේ හිරූ ගීශාන් එක්ක රිකීගෙයි අයියගෙයි යාලු අයියලා දෙන්නෙක් අපි අදින්න තෝර ගත්තේ කැන්ඩියන්.. ඒකනේ සම්ප්‍රදය

අපි තෝර ගත්තේ තනිකර අර දියමන්ති වගේ පබළු වලින් ලස්සනට හැඩ දැමූ ඔසරි.. අත් දිගට දාපු කර ටික වැඩියෙන් කපපු ජැකට් එකක් එක්ක ඒ සාරිය කදිමට ගැලපුනා.

උදෑ උනේ තැල්ල තියන නැකතයි. අම්මිලා දෙන්නම ඇස් වල කඳුලු පුරෝගෙන අන්දවන අක්කිල දෙන්නගෙත් උදව්වෙන් තැල්ල තිබ්බේ අදින් පටන් ගන්න මංගල ගමනට ආශිර්වාදක් එක් කරමින්..

උඩරට ඔසරි කට්ටලයට එන නළල් පටි, ඉරහඳ ආභරණ, කොන්ඩා කූරු, වළලු, මුදු, කරාබු, හවඩිය එක්ක මාල හත එක්ක කදිමට ගැලපිලා යද්දි.. චාම් සරල මේකප් එකක් එක්ක කොන්ඩේ ලස්සනට හදලා මල් ගහලා චුටී හීල් දෙකක් දාලා.. දෙන්නම එකම වගේ එකම ඇඳුම එකම ජුවෙලරීස් එකම ශූස් එකම මල් බොකී.. හැමදේම එක වගෙයි.. අපි දෙන්නම නැගිටල හැඩ බැලුවේ.. දෙන්නගෙන්ම දිස් උනේ හරි චාම් පුදුම තරමේ ලස්සනක්. කැඩපත ඉදිරියේ පේන ඒ රුව දිහා බලද්දි සියුම් ආඩම්බරයක් හිතට දැනෙද්දි අම්මි අප්පච්චි නම් බලන් උන්නේ කඳුලු පිරිච්ච ඇස් වලින්.. උනුසුම් වැළඳ ගැනීම් ගොඩක් මැද්දේ කඳුලු මැද්දේ ඔසරියට ගැලපෙන ෆ්‍රෙශ් සුදු නෙලුම් වලින් සැකසූ මල් බොකී එකත් අරගෙන නැකතට ගෙදරින් එලියට බැස්සේ අපි දෙන්නම එකටයි. රතිඤ්ඤා මල් වෙඩි හඬ මැද යාලු මනමාලියෝ ඇතුලු සියල්ලෝම සුදානම් වෙලා හෙම්හිට යන්න ඇඳුනේ හෝටලය වෙතයි..

sinhalaebooks.com

පැයකින් පමණ අපි ආවේ රෝයල් ඔඩ්ලීස් හෝටලය වෙතයි. කලින් අපි හතර දෙනාම ඇවිල්ලා සිලෙක්ට් කරපු එකක්.. විස්තර කරන්න බෑ පුදුම තරම් ලස්සනයි ඒ හොටෙල් එක. තාම අයියලානම් ඇවිල්ලා නෑ.. අන්දවන අක්කිලා දෙන්නයි යාලුමනමාලියෝ ටිකයි එක්ක අපි වැදුනේ හෝටෙල් එකේ රූම් එකකට. තව වෙලාවත් තියේනේ...

"අනේ පාරු..... හරු ලස්සනයි මගේ මැනික.. නිලියෝ පරාදයි.."

"ඇත්තමයි පාරු.. ඇස් වහ වදී බන්.."

"අක්කයි නංගි වගේ දෙන්නම හරිම ලස්සනයි මැනික.."

"අපි අන්දපු ලස්සනම බ්‍රයිඩ්ස් ලා"

කතා ගොඩක් මැද්දේ හිනා වෙවී සුහදව ඉදලා..

"ඒ මට හරි බඩගිනී"

"අඩේ පාරු අදවත් ඔය කන බතේ ඉවසගනින්කෝ.."

මගේ ලස්සන සුන්දර වදනට එසේ පිළිතුරු දුන්නේ ඇන්

"අඩෝහ් බෑ බෑ කන්න ඕනා මොනා හරි"

"යකෝ දැන් ගෙදරින් කිරිබත් කෑවා නේද"

"අනේ මේ කිරිබත් කාල මදි මගේ සුදු බණ්ඩියට"

එක වරම ඇතුලට ආවේ රිකීගේ අම්මි..

"කාල ඉන්න ඕන් දෙන්නම.. "

"අම්මා"

"මන් දන් නැතුවැ මගේ කෙල්ලො දෙන්නගේ හැටි.. මන් මේ නූඩ්ල්ස් කප් දෙකක් හදන් ආවා කෝකටත් කියල.."

"අනේ මගේ සුදු අම්මි...." කියමින්

ගත් කටටම ඒ දෙක ඇදල ගත්තේ රවීනා.. ඒකිත් මන් වගේම සා ගින්නෙද කොහෙද. ලා රස්නෙන් තිබ්බා ලොකු කොත්තු මී කප් දෙකක් වෙලාවේ හැටියට දිව්‍ය භෝජන

 අපි දෙන්නම කන්න ගත්තේ" මූන් සෝමාලියාවෙන් ආපු උන්ද බම් " ගගා අනිත් උන් කෑ ගහද්දි..

ටිකකින් ඇහෙනො නේද බෙර සද්දේ.. හම්මට අපේ කුමාරයෝ දෙන්නා ඇවිල්ලද කොහෙද කෙල හැලෙනවා

sinhalaebooks.com

මගේ කොම්ලෝ ඩෙන්නව බලා ගමින.. මගදිම මල් බොකී ඉල්ල ගත්තු හින්ද යාලූ මනමාලයෝ ඒක ගෙනත් දෙනකම් ඉන්න එපැයි ඇතුලට වෙලා

මිනිත්තු පහලවකින් විතර අපි උන්නු තැනට ආවේ හිරූ එක්ක අපේ අයියගේ යාලුවෙක්... අප්පේ මුල් ඇඳුම ඇඳලා.. හරි ලස්සනයි.. ඒ වගක් නෑ මට දැන් බලන්නෝනි රිකී වයි අයියවයි. බොකී දෙකත් අරගෙන ඇතුලේ උන්නු අපිත් හෙම්හිට හෙම්හිට අඩි තිබ්බෙ එලියටයි.. විලි ලැජ්ජාවේ බෑ හැමෝම බලන් ඉන්නව අනුභව කරන්න වගේ යන්තම් ඔලුව උස්සලා රිකී දිහා බැලුවේ අප්පා.. උඩරට නිලමේ කෙනෙක් වගේ.. අයියත් ඒමයි.. සුදු තුන්පොට්ටිය, රතුතුන් පොට්ටිය, සොමනය, සුදු රැලි කලිසම, කවනිය විල්ලුද පපු හැට්ටය, විල්ලුද හැට්ටය, විල්ලුද බද පටය, මුලූ 4 හිස්වැස්ම පරිපූර්ණ නිලමේ ඇඳුමින් සැරසිලා අම්මෝ දෙන්නම හරි තේජවන්තයි. හරිම ලස්සනයි ඒ පිරුනු මස්ගොබ වලට හැඩි දැඩි සිරුරු වලට නිලමේ ඇඳුම. හරිම පිං පාටයි.. ලෝබයි. දුවන් ගීන් තුරුල් වෙන්න හිතයි. උම්ම්ම්මා දෙන්න හිතයි. කෝලම් කරන්න හිතයි.

අපි දෙන්නා දිහා වශී වෙලා වගේ බලන් ඉන්නේ දෙන්නට දෙන්නාත් මාරුවෙන් මාරුවට

දැන් වෙලාව් රෙජිශ්ට්‍රේශන් එකටයි. ඒකටත් ඉතින් රෙජිස්ට්‍රාර් ලා දෙන්නෙක්. හැමෝම ඉදිරියේ සාක්ශිකාරයන් ඉදිරියේ දිවුරලා පොරොන්දු වෙලා අත්සන් කරලා කොම

හරි අන්තිමට අපි නීතියෙන් ස්වාමිපුරුෂයා සහ භාර්යාව උනා

හැමෝගෙම ඇස් වල සතුටු කඳුලු. හරි ආදරෙන් අයියයි රිකී අපි දෙන්නා දිහා බලන් ඉන්නේ..

පෝරුවේ චාරිත්‍ර කරන්න නැකත උදා වූවායෙන් අපේ අම්මිගේ මල්ලිලා දෙන්නා අපේ මාමලා දෙන්නා අයියවයි මාවයි පෝරුවට නග්ගන්න සූදානමින් ඉද්දි රිකීවයි රවීනවයි ත් පෝරුවට නග්ගන්න සූදානමින් හිටියේ ඔවුන්ගේද මාමාල දෙන්නෙක්. පෝරු දෙකක් හදලා එකම වගේ.. පෝරුවේ චාරිත්‍ර සියල්ල එසේ අවසන් කරලා අශ්ටක කියල තැලි බැදල මුදු මාරු කරන් අවසානයේ පිරිත් මංගල ගාථා මැද පෝරු වලින් බැස්සේ පැයක පමණ කාලයකින් පසුවයි. හම්මේ දැනුයි කතා කරන්න හරි වෙලාවක් හම්බුනේ..

ඒකත් ඒ විදියට ඉවර කරල අපි ගියේ අපි වෙනුවෙන් ලස්සන ට සරසලා තිබ්බ සෙට්බෑග් දෙක වෙතයි. වාඩි වෙන්නට මත්තෙන් අයියා ඇවිත් හරි ආදරෙන් මාව වැළඳ ගත්තේ රිකීත් රවීනව වැලඳ ගද්දි.. ඒ මොහොත නම් අර කොයි වෙලෙත් ඕන එකක් ෆොටෝ ගහන්න බලන් ඉන්න ෆොටෝග්‍රැෆි අයියලගේ කැම් එකේ සටහන් උනේ හරි ලස්සනට..

"මගේ ප්‍රින්සස්.. අනේ හරි ලස්සනයි දෙයියෝ.. ලෝබයි

මැනික යවන්න මට.. මගෙන් දුරකට.."

ඒ ඇස් වල සතුටු කඳුලු. බොකී එක එක අතකට අරගෙන චූටි ඇඟිලි වලින් අයියගේ ඇස් වල කඳුලු පිහ දලා. හිනා උනේ කිසිත් නොකියායි.

"හැමදම මේ විදියටම හිනා වෙලා ඉන්න මගේ රත්තරන්.. මගේ මැනිකට ඕනිම දේකට මන් ඉන්නවා ඕනිම

වෙලාවක.. මන් ඊයේ කියල දුන්නා නේද ගෑනු ලමයෙක් වයිෆ් කෙනෙක් හැටියට පිට ගෙදරකට ගියාම වයිෆ්ගෙන් හස්බන්ඩ් ගේ අම්මිට අප්පච්චි ට, වයිෆ්ගෙන් හස්බන්ඩ් ට වෙන්න ඕනි යුතුකම්, ඒ වගේම මැනිකට ඒම ගියාම හම්බෙන වගකීම්.. "

හෙම්හිට හිනා වෙලා හිස් වැනුවේ ඔව් කියන්නයි..

"ඒ දේවල් පරිස්සමට අපි එක්ක හිටියා වගේම චූටුම හරි වෙනසක් නොකර මගේ රත්තරන් ඒ අයටත් කරන්නොනි. ආදරේ දෙන්න ඕනි. මන් දන්නව මගේ රත්තරන් ඒම කරනව කියල.. ප්‍රශ්නයක් ආවම කලබල නොවී.. හොඳට හිතලා.. හැඟීම් වලටම තැන නොදී.. චූට්ටක් ඒ කෙනාව තේරුම් අරන් ආත්මාර්ථකාමී නොවී.. හැමෝම ගැන හිතලා වැඩ කරන්න ඕනි.."

"ඔය හිනාව හැමදම තියා ගන්න මගේ රත්තරන් .. මන් දන්නව රිකීයා කවදවත් ඔය හිනාව නැති වෙන්න දෙන් නෑ.. දැන් ඉතින් ඌ ලියාගෙන ඉවරයි නේ. අද ඉදන් අපේ භාරයේ නෙමේ එයාගේ භාරයේ.. මන් කිව ඔක්කොම දේවල් මතක තියාගෙන ලස්සනට ජීවත් වෙන්න මගේ රත්තරන් අයියා ගොඩා..........................ක් ආදරෙයි"

හෙම්හිට නලලට හාදුවක් තවරලා අයියගේ අතින්ම මාව රිකීට දීලා අපි දෙන්නවත් සෙට් බෑග් එකෙන් ඉන්දවලා රවිනවත් තුරුලට අරගෙන වාඩි උනේ ලස්සන හිනාවකින්.. හෙම්හිට ඇස් උස්සලා රිකී දිහා බැලුවේ. එයත් මගේ ඇස් දිහාම බලාගෙන.

"මගේ රත්තරන්.. අනේ හරි ලස්සනයි මැතික.. හරිම

ලස්සනයි.. ලෝබයි රත්තරන්.. පිච්ච මලක් වගේ.."

" හී හී"

"පිච්ච මල් හිනාව.. දෙයියන්ගේ පිහිටයි මගේ රත්තරන්.. හැමදම දෙන්න මට ඔය හිනාව"

ආදරෙන් තුරුල් කර ගත්තේ නලලත උනුසුම් හාදුවක් දෙමින්. හැමෝගෙම සතුටු හිනා මැද කතා බහ බැද ලන්වෙන්න වෙලාවත් ලන් උනාවෙන් හැමෝම කෑම කන

වෙලාව බලලා අපි ගියේ, ගොයිනවේ ඇඳුමට මාරු වෙන්නයි.

ක්‍රීම් කලර් එකෙන් මර්මෙයිඩ් ස්ටයිල් ගවුම් දෙකක් එකම ඩිසයින් එකෙන්. උඩකොටස ලස්සන ක්‍රීම් පාට ලේස් වලින් හැඩ වෙලා.. දනහිස් ලගට වෙනකම් ෆුල් ෆිට් ටයිට් එකට, ඉතුරු ටික යටි පතුල් දක්වා ෆ්ලෙයාඩ් එකට. ලස්සනට මර්මෙයිඩ් ස්ටයිල්. ඉක්මනට සාරිස් ඉවත් කරල හෙයා ස්ටයිල් එක චුට්ටක් වෙනස් කරලා මිනිත්තු 30 ක් වගේ ඇතුලත අපි මාරු වුනේ ඒ ඇඳුම් වලටයි. ඒකටම ගැලපෙන ක්‍රීම් කලර් එකෙන් චූටි මල් බොකී දෙකක් එක්ක මූණට වැටෙන්න දෙපැත්තෙන් රැලි දෙකක් දාල කර්ල් කරලා. ක්‍රීම් කලර් එකෙන් ම කොන්ඩෙට මල් කීපයක් ගහල

යාලු මනමාලයෝ ත් මනමාලියෝ ත් වෙනස් වෙලා ක්‍රීම් කලර් එකට. හිරුයි අර අයිය කෙනෙකුයි ඇවිත් අපි දෙන්නව එක්කන් ගිහින් සෙට් බෑග් එකෙන් ඉන්දවද්දි, අපි බැලුවේ අර ඩබල කෝ කියල යි. පේන්න නෑ.. තාම ලෑස්ති වෙනව ඇති හිතල අපි දෙන්නත් වට පිට බල බල හිටියේ.

ටිකකින් මයික් දෙකකුත් එක්ක ඩාන්සින් ෆ්ලෝ එකට අවේ අයියයි රිකීයි.. අපින්දෙන්නගේ ක්‍රීම් කලර් එකෙන් ක්‍රීම්

sinhalaebooks.com

කලර් ශර්ට් එකක් ඇදලා බ්‍රවුන් කලර් එකෙන් කෝට්
එක ඇදක බෝ එක දලා ශූස් දල කොන්ඩේ උඩට හදලා
අප්පේ මගේ හැන්ඩියෝ දෙන්නා. දෙන්නත් එක්කම මියුසික්
එකක් එක්ක සිංදුවක් පටන් ගත්තේ හැමෝම ඒ
කටහඬවල් වලට වශී වෙද්දි..

තුරුල් වෙන්න ආසයි හැන්දෑවේ
ඉගිල්ලෙන්න ඇත්නම් අකාසේ
හිතින් පෙම් කලා මං ඔබ දන් නෑ නේ
රෑයේ සිහිනයෙන් මා ලං වුනා නේ

ඉවසන්න බෑ.... හඳගින්න මාගේ....
පවසන්නකෝ.... ඔබේ ආදරේ.... //
හිතුවක්කරී යන්න එපා දැන්
ආදරේ සැමදා, මං ආදරේයි

තුරුල් වෙන්න ආසයි හැන්දෑවේ
ඉගිල්ලෙන්න ඇත්නම් අකාසේ
හිතින් පෙම් කලා මං ඔබ දන් නෑ නේ
රෑයේ සිහිනයෙන් මා ලං වුනා නේ
නෙතුකැන් ආනන්දේ ඇයි ඔබ ඔරවන්නේ
තනිකම වද දෙන්නෙ ඔබේ ආදරේ

උහුලන්න බෑ.... ඔය කැල්ම දැසේ....
ඉගිලෙන්නකෝ.... හඳ මන්දිරේ.... //
හිතුවක්කාරී යන්න එපා දැන්

ආදරේ සැමද, මං ආදරේයි

තුරුල් වෙන්න ආසයි හැන්දවේ
ඉගිල්ලෙන්න ඇත්නම් අකාසේ
හිතින් පෙම් කලා මං ඔබ දන් නෑ නේ

රෑයේ සිහිනයෙන් මා ළං වුනා නේ
නෙතුකැන් ආනන්දේ ඇයි ඔබ ඔරවන්නේ
තනිකම වද දෙන්නෙ ඔබේ ආදරේ

ලා.....ලා.....ලා...ලා...ලා..ලා.

දඟකාර හැඩකාරි ඔබේ කම්බුල් වලට වඩා
මල් පෙති සිනිඳු නෑ කියා මම දන්නවා
ඔබේ මිහි නිල් දෑස වසා
මගේ සිත උමතු කලා කියා ඔබ දන්නවා

දඟකාර හැඩකාරි ඔබේ කම්බුල් වලට වඩා
මල් පෙති සිනිඳු නෑ කියා මම දන්නවා
ඔබේ මිහි නිල් දෑස වසා
මගේ සිත උමතු කලා කියා ඔබ දන්නවා

ඔබ මලක් වෙලා සොඳුරු
මගෙ පපුව පුරා පිරුණු
නිමාවක් නැති ආදරේ
කවුරුවත් දන්නේ නෑ

sinhalaebooks.com

අපේ දිවි තිබෙන තුරා
ඔබ මට ලැබුනා කියා

දිවි මැදුර පුරා පිරිණු
දෙව්දුවක් වෙලා තුරුළු
නිමාවක් නැති ජීවිතේ
කවුරුවත් දන්නේ නෑ
සසරින් සසර සරා
ඔබ මට ලැබුනා කියා

දඟකාර හැඩකාරි ඔබේ කම්බුල් වලට වඩා
මල් පෙති සිනිඳු නෑ කියා මම දන්නවා

ඔබේ මිහි නිල් දෑස වසා
මගේ සිත උමතු කලා කියා ඔබ දන්නවා

දඟකාර හැඩකාරි ඔබේ කම්බුල් වලට වඩා
මල් පෙති සිනිඳු නෑ කියා මම දන්නවා
ඔබේ මිහි නිල් දෑස වසා
මගේ සිත උමතු කලා කියා ඔබ දන්නවා

සිත උමතු කලා කියා ඔබ දන්නවා

දෙන්නා මාරුවෙන් මාරුවට කියූ සිංදු දෙක අවසන්
වනවත් එක්කම දෙන්නම අපිදෙන්නගේඅත් වලින් අල්ලගෙන
ඩාන්සින් ෆ්ලෝ එකට එක්කන් ගියේ. ඒත් එක්කම වගේ

යාලු මනමාලයෝ මනමාලියෝ ටිකත් අපිව වටකර ගද්දි.. ලස්සන සිංදු මාශප් එකකට හැමෝම ඩාන්ස් කරන්න ගත්තේ කපල් දෙකත් වටකරගෙන. ඒ මොහොත ඒ විදියට නිමා උනේ.. අවසානයේ වෙඩින් එකට ආපු ඔක්කොම ඩාන්ස් කරන්න අරගද්දි..

උදා උනේ මංගල සභාව රැස් වන වෙලාවයි. කොච්චර හිතුවත් අඩන් නෑ දුක් වෙන් නෑ කියල.. අද ඉදන් අම්මි අප්පච්චි අයියා එක්ක නෙමේනේ ඉන්න වෙන්න්නේ කියල දැනෙද්දි හිත ට දුකයි. බලන් ඉද්දි අපේ මූණු වෙනස් උනේ ඒ දුක කාටත් නොරහසක් වෙද්දි. දෙපාර්ශවයෙන්ම කතාවල් අවසානයේ පිටත් වීමට ඒ සුභ මොහොත උදා වූවායෙන් හැමෝටම කතා කරල ආශිර්වාද අරගෙන අම්මි අප්පච්චි ලගට දුවල තුරුල් උනේ කදුලින්මයි.. අම්මි අඩනව හෝ ගාල අයියගෙත් ඇස් වල කදුලු. රිකීගේ අම්මිගේ අප්පච්චි ගෙත් එහෙමයි.. අප්පච්චි ඇවිත් රිකීව වැළඳ ගෙන මොනවදෝ කියෙව්වේ මන් ගැනයි.. ඉතින් ඒම තමයි අප්පච්චි ලා අම්මිලා.. දුකින් උනත් සමුඅරගෙන නැකතට

එලියට අඩි තියලා අපි සූදානම් උනේ තෝරාගෙන තිබු හොටෙල් එක් සඳහා පිටත් වීමටයි.. කදුලින්ම උනත් අපහසුවෙන් මැඩ ගෙන ඉවසගෙන හිනාවක් මවාගෙන අපි පිටත් උනේ ඒ හෝටල් වෙතයි.. වෙඩින් එකේ හැම දෙයක්ම එකම විදියට තෝර ගනිද්දි, හොටෙල්ස් දෙක

නම් තෝර ගත්තේ වෙන වෙනම.. ඇයි කියන්න මම්දන් නැ අර දෙන්නගේ තමා..

## අවසන් කොටස

"පැංචී........ අපි ආවා මැනික.. ඇහැරෙන්න මගේ චූටි රෝස මල"

පැය දෙකක පමණ ගමනකින් පස්සේ අපි ඇවිත් තිබ්බේ ලස්සන හොටෙල් එකකට. බීච් එක ඉස්සරහ. බලන්න හරිම ලස්සනයි. හොටෙල් එක ලගින් බහිනකොටම ලස්සන සන්සෙට් එකක්. අතෑරල යන්න ලෝබයි. ඒ ඇඳුමින්ම ගිහින් සන්සෙට් එක බැලුවේ ආසාවටමයි..
මුහුද ඉර ගිලිනවා.. චූටි කාලේ අයියා කියන්නේ එහෙමයි මිනිත්තු 15 ක් පමණ ඒකත් බලලා අපි ආවේ අපිට වෙන් කරල තිබ්බ හොටෙල් රූම් එකට.
උඩ................ම තට්ටුවක... ජනෙල් කවුලු වලින් එලිය බැලුවම මුහුද හොදට පේනවා ගවුමත් උස්ස උස්ස වටේම ඇවිද ඇවිද බැලුවේ ලොකු..................ම ලොකු........ රූම් එකක්.. චූටි පූල් එකකුත් තියෙනවා..බැල්කනී එක ඒම හරිම ලස්සනයි. පැද්දෙන පුටුවකුත් තියනව.. මරු අප්පා... ඇස් කරකව කරකව රූම් එකේ එහෙ මෙහේ බල බල පැන පැන ඉද්දි එක පාරට ඇදල ගත්තා නේද..

sinhalaebooks.com

"ඔය ඇති බම් බැලුවා.. එහෙට යනව මෙහෙට යනවා.. යන එන දිහා බලන් ඉදලම මගේ ඔලුව කැරකෙනවා .."

"ඉතින් ඇයි ඔයා බලන් ඉන්නේ "

"මේකි යකෝව්.."

"ඉතින් ඇත්තනේ අනේ.. වෙන දිහාක් බලන් ඉන්න මිහ්"

කියල හිනා වෙලා ආයෙත් යන්න හැදුවත් හරි ගියේ නෑ.. පැනි හිනාවක් දලා තුරුල් කරගෙනම ඇඳට වැටුනා නේද.. හත්තික්කේ කොන්ද කඩනව තව ඩිංගෙන්..

"කොහොමද බම් ඕක ගලවන්නේ.."

ගවුම දිහා බලලා අහපු විදියට නම් හිනා මැරෙන්න.. කිසිත් නොකියා හිනා වෙලා මන් පටන් ගත්තේ ජුවෙලරීස් ගලවන්නයි. අම්මේ මාල මුදු කරාබු වළලු වෙලාවට අක්කා උදේ ඇන්ද ඇදුම නම් ගැලෙව්වේ.. ඒක පිටින් ආව නම් ඒම ඒකෙ කෑලි ගලවන්න පණ යනවා..

"මෙච්චර ගොඩක් දන් හිටියේ කෝමද පැංචි.. බලන්නකෝ මේ ජුවෙලරීස් විතරක් කිලෝ පහක් විතර ඇති."

"ඔව් අප්පා අනේ මේ කටු ටික ගලවන්නකෝ කොන්ඩේ "

ගලෝනව ගලෝනව ගලෝනව ඉවරයක් නෑ. කෝම හරි තවත් පැයකින් විතර ඔක්කොම කොන්ඩ කටු ජුවෙලරීස් ගැලෙව්වේ අරයා අත කටෙ තියා ගනිද්දි

"දෙයියනේ මෙච්චර ගොඩක්😱 "

"ඔව් අප්පා.."

ඒ සියල්ල ඩ්‍රෙසින් ටේබල් එක උඩ පිලිවෙලට තියලා, ආයෙමත් ඇහැ ගියේ මගේ ජනෙල් කවුලුවෙන් පේන ඒ ලස්සන දර්ශනය වෙතයි.. ඔහුද පිටුපසෙන් ඇවිත් ඉන වටා අත් යවා තුරුල් කර ගත්තේ මගේ එක් උරහිසකින් ඔහුගේ නිකට තබාගෙන

"ඔච්චර ආසයිද බම් මුහුදට..."

"ම්ම්ම්"

"ශේල් නුවර එළි යන් කියල කියද්දිත් බෑ මෙහේ හොදයි කියල මන් හිටියෙම ඒකයි.."

"අයියලා නුවර එලිද ගියේ"

"ම්ම් ඔව්... ආසයිද ම්ම්"

sinhalaebooks.com

"අනේ ඊට වඩා මෙහේ ශෝයි"

"පිස්සි..මත් දන්නෝනේ ඉතින්"

"හී හී"

"සුවඳයි බම්..තාමත්"

"ආහා.."

"මගේ පිච්ච මල.."

"මේ........."

"ම්ම්ම්ම්"

"අම්මිලට අද ගොඩක් පාලු හිතෙයි නේද"

"මාත් මේ හිතුවේ ඒක සත්තලන්.. දරුවෝ දෙන්නගෙන් එකෙක් වත් අද නෑ නේ ගෙදර "

"හුම් අපෙත් ඒමනේ, හැබැයි අර නෑයෝ නම් ඉන්නවා ඉතින් ගේ පුරොලා වෙඩින් එකට උදව් කරන්න ආව"

"ම්ම්ම්ම්"

"ඒත් ඒකෙන් අපි නැති පාලුව මැකෙන එකක් නෑ"

"කෝල් එකක් ගන්න මගේ සත්තලන් ඒනම් අම්මිට.. මාත් ගන්නම්කෝ අපේ අම්මිට.."

"හා"

මිනිත්තු 15 ක් විතර අම්මි එක්ක කතා කරලා දැන් නම් මේ ගවුම ඇදන් ඉදලා එපා වෙලා...

"මේ.........."

"ම්ම්ම්ම්"

"මේ පිටිපස්සේ තියෙන ලේස් එක ගලවලා ඊට යටින් චූටු zip එකක් ඇති ඒකත් ඕපන් කරන්නකෝ.."

"මාත් මේ ඕක ගලවන හැටි තමා හොය හොය හිටියේ.."

"වලත්තයා" හෙමිහිට කුටු කුටු ගෑවේ නෑහෙන ගානටයි

"මට ඇහුනා ඈ.."

හෙමින් හෙමින් ලේස් එකත් ලෙහලා zip එකක් ඕපන් කරලා.. හෙමිහිට කර පාත් කරලා ගවුමේ අත් දිගයිනේ.. අතුත් පරිස්සමට ගලවලා ගවුම ඉන තෙක් පාත් කරේ..

මාස හයකට විතර පස්සේ ආයෙත් සැරයක් මාව විලියෙන් රතු වෙද්දි...

"කැපිලා රතු වෙලා මේවට මිම්මි.. පෞ මගේ පැටියා අප්පා.."

තවත් මිනිත්තු කීපයකින් සම්පූර්ණයෙන්ම නිරුවත් උනේ..

ලැජ්ජාවට ඒ පපුවේ මූණ හොවා ගද්දි.

"පුදුම ලැජ්ජාවක්නේ යකූ මේ ගැහෙනවා හෝ ගාල මගේ හා පැටියා..කෝ බලන්න මූණ"

යන්තම් ඔලුව උස්සලා මූණ පෙන්නලා ආයෙමත් මූණ හොවා ගත්තේ ඒ පපුවේ...

"කෝ අපි යමු වොශ් දන්න..කෝ මේක ඇදගන්න මගේ හා පැටියා.. රූම් එකේ තියල තිබ්බ සුදු පාට ලොකු ටවල් එකක් අරන් ඇන්දෙව්වේ එයාමයි...ඉන්නකෝ මාත් මේවා ගලවනකම්..."

ලැජ්ජයි මට එතන ඉන්න.. හිම්ට අඩි තියලා මන් ආවේ හොරා වගේ බැල්කනි එකටයි. එයාහිනා වෙනවා මගේ හොර වැඩ වලට.. මිනිත්තු කීපයකින් ඔහුත් ටවල් එකක් ගත දවටත් ආවේ බැල්කනී එකට..

"රැල්ල පාගන්නෝනිද මිම්මි පැටියට..."

"ඔව්"

"එනා ඒනම් ඉක්මනට වොශ් දන් යමු..හා පැටික්කා.."

"හා"

"කෝ එනා.."

කියල අත් දිගු කරේ මාත් ඒ තුරුලට පනිද්දි.. හැමදාමත් වගේ මගේ දෙපා ඔහුගේ බඳ වටා එතෙද්දී. ටවල් එක කැඩෙන්න ඔන්න මෙන්න. ක්ශනිකව තදින් අල්ල ගත්තේ එයාට හිනා.. චූටි එකෙක් වගේ හිමිට පරිස්සමට බාත් රූම්

එකට අරන් ගියේ මග දිගට හාදු වැස්සක් තවරමින්..

හම්මට සිලි ලොකූ..........බාත් ටබ් එකේ වතුර පුරෝලා සෝස පෙති දාලා.. ලස්සන හිනාවක් එක්ක හෙමිහිට ටවල් එක ඉවත් කරේ මන් ඒ තුරුලට තවත් තුරුල් වෙද්දි.. මාවත් ටබ් එකේ පරිස්සමට තියලා ඔහුත් ටවල් එක ඉවත් කරලා ටබ් එකට ආවේ පැනි බැල්මක් දාගෙන.

අප්පේ.... පැයක් විතරම හරි හරි කෝලම් ටබ් එකක් ඇතුලේ කරන්න පුළුවන් ඔක්කොම දේවල් ටික

කරලා අන්තිමට දෙන්නම එළියට ආවේ වොශ් එකකුත් දාගෙන.. දඟයා මගේ..

"ඒ ඇදට වටා ටබ් එකේ හොදයි නේද " ඔලුවත් කස කස පැනි බැල්මක් දාල ඇහැක් ගහල කිව්වේ මගේ මුලු ඇඟම රතුම රතු වෙද්දි..

"කෝ මෙහේ එනවා මගේ හා පැටියා.. දෙයියනේ ඔය ගැහෙන රතු වෙන එක කවදා........ හරි යයිද මන්දා "

"හී හී"

මන් ඒ තුරුලට පැන්නේ ආයේ ඇරපුඅතක් නැ හා පැටියෙක් වගේම තමා..තාම දෙන්නම ටවල් පිටින්

"කෝ එනා එනා අපි යමු රැල්ල පාගන්න මගේ චූටි මැනිකට.."

"යේ.......... යමු යමු යමු....."

"එහෙනම් උම්ම්මා එකක් දෙනා"

"උම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම ්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම ්
ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම ්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම ්
ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම ්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම"

"අම්මෝහ් ඒවට නම් දෙවෙනි නැ නේද.."

"හුම් යමුකෝ යමුකෝ ඉතින්"

ඉක්මනට ඉක්මනට ලෑස්ති වෙලා දෙන්නත් එක්කම වෙරළට ගියේ වෙලාව රාත්‍රී 7.30 විතර. හොටෙල් එකට ආපු අය විතරයි මේ හරියේ බීච් එකේ ඉන්නේ.. හිතේ හැටියට රැල්ල පාගලා.. ඩිනර් එකත් පල්ලහැයින්ම අරගෙන ආයෙම අපි ආවේ හොටෙල් රූම් එකට. වෙලාව නම් 10 යි ඒත් හරි මහන්සී අද දවස අපි දෙන්නටම.. කියෝ කියෝ ඉදලා නින්ද ට වැටුනු වෙලාවක් මතක නැ

පසුද උදෑසන කලින් නිද ගත්තු හින්ද ද කොයිද උදෙන්ම ඇහැරුනේ මට.. අප්පේ සැපට නිදි මට තුරුල් වෙලා.. හරි ලෝබයි අප්පා.. හරි ලස්සනයි ඉතින් ඒ රුව.. හරි කඩවසම්.. හරි ගාම්බීරයි.. ඕවා කියන්න බැ ඉතින් එතකොට අඩි දෙක තුනක් උඩින් යන්නේ. කෝම හරි ඉන්න හිතෙන් නැ දැක්කම.. චුට්ටක් මූණ මිරිකල හපප උම්ම්මා දෙන්න හිතෙනවා මුලු මූණටම.. ඔන්න ඉතින් මිනිත්තු දෙකක් විතර ඉවසන් හිටියත් ඉවසීම ඉක්මවූ තැන... උම්මා දීගෙන දීගෙන ගියේ.. එයත් ඇස් ලොකු කරගෙන ලස්සන හිනාවකින් ඇහැරෙද්දි...

"මොකද මොකද මේ මිම්මි"

"මොකුත් නැ ඇයි ..."

"මොකුත් ඇත්තෙම නැද්ද ආහ්.."

හිනාවේගනම ඒ වත උඩට මාව උස්සලා ගත්තේ ආයෙත් සැරයක් හාදු වැස්සක්ම තවරමින්.. හාදු දෙන ගමන්ම ටික ටික ඒ දෑගිලි වලින් ලිහිල් වෙන්නේ දුහුල් නිදන ඇදුමයි. හරි හිනා එයාට නම්.. ඇහෙන නෑහෙන ගානට කනට කොඳුරමින්

"පැංචි...."

"ම්ම්ම්ම්"

"දැන් අවුරුදු 4 ක් විතරම අපි ජීවිතේ වින්ද"

"ම්ම්ම්ම්"

තේරෙන් නෑ මොනා කියන්න යනවද කියන්න.. චුට්ටි බයකුත් හිතට දැනෙද්දි මොනා කියන්න යනවද්දෝ කියල.. යන්තමට ඒ ගතින් මෑත් වෙලා බැලුවේ මොකක්ද යන්නයි.

"ඉතින් බම් තවත් නාකිවෙන්න බෑ.. මට චූටි මැතිකක් ඕනි ඔය චූටි බණ්ඩියගෙන්"

"ආහ්..දැන්ම"

"ඒක තමා කිවේ මගේ මෝඩ්.. දැන් අවුරුදු 4ක් විතරම අපි ජීවිතේ වින්දනේ.. දැන් අම්මිලා අප්පච්චි ලා විදියට ත් විදිමු තවත් පරක්කු නොකර මිම්මි.."

"ආහ්"

"මොකද කියන්නේ හතී මූන් බබෙක් හදමුද ආ"

"හා"

"දිනත් හරිනේ"

"ඒවත් ගනන් කරාද අප්පා"

"නැතුව මේ දවස් දෙකේ තුනේ ඉතිම් හලියට කරොත් ඉතිම් චූටි ලස්සන රෝස මලක් මේ සුදු බණ්ඩියට එයි.. මිම්මි මොකද කරන්නේ..."

ඒ ක්ශනයෙන් මගේ හිතට ආවේ අර පුංචි පැටියගේ රුවයි.. අනෙ මගේ රත්තරන් ඔයා කොයිද දැන් ඉන්නේ මැනික.. අනේ ඉන්න තැනකින් මගේ කුසටම එන්න රත්තරන්..

"ඒයි ඒයි හා පැංචි.. අනේ ඔයා ලෑස්ති නැත්නම් ඒකට කමක් නෑ දෙයියෝ.. අපිට තව කල් තියේනේ.. ඇයි ඕක ඔච්චර හිතන්නේ ආ මගේ රත්තරන් "

"අනේ නෑ අප්පා.. මරු කියල හිතුනා ඉතින්..."

"ප්‍රොමිස්"

"තයිශූ ප්‍රොමිස් "

"ආහ් හා එහෙනම් එනා මෙහේ..."

වෙනදට වඩා පරිස්සමින් හැමදේම කරේ පැටියෙක්

බලාපොරොත්තුවෙන් මයි.. ඒ හැමදේම එක්ක මගේ හිතේ තිබ්බ එකම ප්‍රාර්ථනාව මාස ගානකට කලින් නැති උන ඒ පුංචි මල් කැකුල මගේ කුසේම ඉපදෙන්න කියල යි..ඒ දවස් දෙකත් හරී ලස්සනට ඒ විදියට ගෙවෙද්දි අපි ලෑස්ති උනේ..අපේ හෝම් කමින් එකට.. අන්දවන අක්කි ආවේත් ඉන්න හොටෙල් එකටමයි.

තෝරගත්තේ අපි ඉන්දියන් ස්ටයිල් එකට ලෙහෙන්ගා එකයි රිකීට ඒකටම මැච් වෙන කුර්තා කිට් එකයි. ලොකු...... ලස්සන ජුවෙලරීස් දලා.. කර වැහෙන්නම ලොකු... මාල දල වලලු දලා.. රතුම රතු ලෙහෙන්ගා එකට සිල්වර් කලර් එකෙන් වැඩ ගියපු ඒ රෙද්දෙන්ම අත් දිග ජැකට් එක ඇදලා.. ශෝල් එක හිස් මුදුනෙන් බාගයක් වැටෙන්න දලා.. ලස්සන ඉන්දියන් ස්ටයිල් තැල්ලක් දලා..චුට් හිල් දෙකක් දල නහයටත් අර එල්ලන

ලොකු රින්ග් එකක් දලා..චාම් ලස්සන මේකප් එකක් දල ලස්සන චූටි මල් බොකී එකක් එක්ක මන් හැඩ උනේ එහෙමයි..

රතු එකට සිල්වර් කලර් එකෙන් වැඩ දැම්ම කුර්තා කිට් එකක් ඇදන් ඒකටම ගැලපෙන්න රැවුල කොන්ඩේ හදල ශූස් දලා.. අප්පේ මගේ හැන්ඩියගේ ලස්සන.. එයා ඇදගෙන පල්ලහැට වෙලා ඉද්දි මන් අන්දවන අක්කි එක්ක පල්ලහැට ආවේ.. උදව්වට ආපු දූනීලත් එක්ක දෙයියනේ අද දැක්කා වගේ බලන් ඉන්නවා..ලගට ගියාම

"අද නම් පිච්ච මලක් කියන්න බෑ.. මැනික.. රතුම රතු චූටි රෝස මලක්..."

"ම්ම්ම්ම් හී හී"

"මන් ආදරෙයි මගේ රත්තරන් මගේ පණ ටික එන්න

පරිස්සමට අඩිය තියලා මගේ හා පැටියා...."

ඒ දවසත් ඉතාමත් ආදරණීය ලෙස නිමා උනේ.. අවසානයේ මමයි රවීනයි අපේ ගෙවල් දෙකේ රීප්ලේස් වෙද්දි... සති දෙකක් විතර එකම සිතුවිල්ලක්ම එක්ක පමණක් ජීවත් උනේ හරිම ආසාවෙන් ඔව්... පුංචි පැටියා ඇවිල්ලද්දෝ කියලයි.. මන් වගේම ඔහුත් දින ගැන ගැන හිටියා.. දවසක එක උදේක රිකී ඔෆිස් යන්න කලිම් ඇදේ

ගුලිවෙලා අපින්දෙන්නා හිටියේ කියෝ කියෝ..

"පැංචී........."

"ම්ම්ම්ම්"

"අදට දවස් 14යි..."

"ම්ම්ම්ම්"

"ටෙස්ට් කරල බලමුද ම්ම්ම්"

"අනේ හා.."

"ඔන්න දුක් වෙන් නෑ හොඳද ඒම දෙයක් නැත්නම්.. තව ගොඩක් කල් තියේනේ ම්ම්"

"ඕකේ බොස්.. ප්‍රොමිස් "

"ගුඩ් ගර්ල්"

"මන් අරන් ආවා.. අර ඩ්‍රෙසින් ටේබල් එකේ දකුණු පැත්තේ එකේ ඇති චූටි බොක්ස් එකක දලා ටෙස්ට් ටියුබ් එකකුයි

ටෙස්ට් ස්ට්‍රිප්ස් වගේකුයි.. පරිස්සමට ගිහිම් අරන් එනා

මගේ හා පැංචි..හෝචි හෝචි.. එක්කො ඉන්නකෝ මෙතනම මන්ම ගේන්නම්.."

"හා"

"කෝ එන්න මගේ හා පැටියා බාත් රූම් එකට.."

හෙමිහිට අඩි තියල ගියේ.. බාත් රූම් එකටයි

"මිම් මේකට ගන්න යූරින් චූටි සාම්පල් එකක්.."

"අනේ"

"මොකද"

"ඔයා එළියට යන්නකෝ හුම් ලැජ්ජයිනේ.."

හිනා වෙනවා නේද හෝ ගාලා..

"අනේමන්ද අප්පා ඔය ලැජ්ජාව නම් කවදා නැති වෙයිද කියන්න.. හා හා පරිස්සමට අරන් එනාකෝ.." කියල දෙරත් වහගෙන එයා ගියේ මමත් පරිස්සමට කිව විදියටම කරල සාම්පල් එකක් එයාගේ අතට දෙද්දි.. ඇස් ඇරන් ඉන්න බෑ.. රිසල්ට් එක මොකක් වෙයිද කියන්න.. අත් දෙක තියාගෙනම හොඳටම තදින් ඇස් පියා ගත්තේ මිනිත්තු තුනක් විතර.. සද්දේ නෑ මෙයා.. තවත් මිනිත්තු

දෙකක් විතර ඉදලා තවත් ඉවසන් ඉන්න බැරිම තැන ඇස් ඇරලා බැලුවේ දෙයියනේ... ලයින් දෙකම පාට වෙලා.. දෙයියනේ.. එතකොට.. හිතාවේගන ඒක දිහාම බලාගෙන එයත් ඉන්නවා හරි සතුටින්.. හරි ලස්සන ට හිනා වේගන.. ඒ තුරුලට උනේ.. කදුලින්මයි..

"අප්පච්චියෙක් කරා නේද මගේ රත්තරන්.... අනේ මට උස්සන් දුවන්න හිතෙනව මගේ රත්.. ඒත් බෑ නේ මිම්මි.. ඔයාට පින්මැනික..."

අනේ මැනික ඔයාම නේද මගේ බණ්ඩියට ආවේ.. කියන්නකෝ ඔයාම නේද.. හිත දහක් දේ කියල ඉගි බිගි දෙද්දි මන් විශ්වාස කරේම එයාමයි මන් ලගට ආවේ කියල ...

මේ දේ මෙච්චර ඉක්මනට දැන ගත්තත් අපි හැමෝටම මේ ගැන කියන්න මාස තුනක් වෙනකම් හිටියා.. එදා ඉදන් මේ වෙනකම්ම මගේ වැඩ හැමදෙයක්ම කෙරුනේ මගේ මැනික අතින්.. උදේම ඔෆිස් යන්න කලින් එයාට පුළුවන් හැමදෙයක්ම මට කරලා දීලා යනවා.. පැයෙන් පැයට අමාරු අහ අහ කෝල් කරනවා එයාගේ අම්මිට වද.....දෙනවා මන් ගැන බලන්න කියල.. ලන්ච් ටයිම් එකට දුවගෙන මන් ලගට එනවා.. මටත් කෑම කවලා ආයෙම ඔෆිස් යනවා.. කොච්චර මහන්සිවෙලා තෙහෙට්ටු වෙලා ගෙදර ආවත්.. කෑම කවල බේත් දීලා.. ඉදිමුන කකුල් තවලා.. අත ගාලා.. චූටි මැනික එක්ක කියෝලා

sinhalaebooks.com

කියෝලා ඒ උනුහුමේම දෙයියන එක මේ මාස 10 ටම එයාගේ පුරුද්දක් උනා..

අද තමයි මට හොස්පිට්ල් ඇඩ්මිට් වෙන්න දින දුන්නේ.. එයා එක්කම පරිස්සමට අපේ අම්මි එයාගේ අම්මි රවීනයි ඒ හැමෝමත් එක්ක අපි ගියේ ලයිෆ්කෙයා ප්‍රයිවට් හොස්පිට්ල් එකට.. දවස් එකාමාරක් විතර එහේ ගෙවුනේ පසුද හවසක කොන්ද ප්‍රදේශයෙන් දැනුනු වේදනාවත් එක්ක යටි ගිරියෙන් මට කෑ ගැහෙද්දි.. එවෙලෙම තියටර් එකට ගත්තේ.. එක මොහොතකට වත් මත් ලගින් මෑත් නොවුනා..

මටත් වැඩිය බය වෙලා ඒ රුව.. මටත් වැඩිය කලබලයි ඒ හදවත.. මගේ ජීවිතේ..

ඇට කටු හත් අට කඩකට බිදිලා යන්නාක් මෙන් දැනුනු වේදනාවත් එක්ක මුලු තියටර් එකම දෙගුරුම් දෙන්න කෑ ගැහුව හඩත් එක්ක.. මේ ලෝකේ ලබන්න පුළුවන් ලොකුම වේදනාව හරී ආදරෙන් සතුටින් දරා ගනිමින්.. මේ ලෝකේ අම්මෙක් අප්පච්චි යෙක් අහන්න පුළුවන් සතුටුම හඬ ඔව් පුංචි පැටියෙක් අඩන හඬ.. පලවෙනි පාරට පුංචි පැටියා අඩන හඬට අපි දෙන්නම හිනා උනේ කඳුලු අතරින්මයි... ඔව් ඒ දූ පැටියෙක්.. ඩොක්ටර් පැවසුවේ එහෙමයි.. පුංචි පැටියගේ මූණ විතරක් යන්තම් පෙන්නලා.. එයාව සෝදන්න අරන් ගියේ චූටි නර්ස් කෙනෙක්.. දබිඳු අතරින් කඳුලු අතරින් ඔහුගේ උනුසුම් නලලත හාදුවක් ලැබෙද්දි..

කතා කරන්න වචන ආවේ නෑ අපි දෙන්නටම කඳුලු අතරින් සිනා සෙනවා මිසක්.. තවත් මිනිත්තු ගනනාවකින් මගේ පුංචි පැටියා.. රෝස පාට බ්ලැන්කට් එකක ඔතලා මන් ලගින් තැබුවේ.. ඇස් වල කඳුලු ආයෙම අලුත් වෙද්දි.. අනේ ඒ ඇස් නහය මූණ ඒ හැමදේම දූගේ අප්පච්චි ගේ වගේමයි... නර්ස් ගේ උදව්වත් ඇතුව දූ වෙනුවෙන් උනපු පලමු රන් කිරිටික දූගේ තොල ගෑවේ... හරී පුරුදු කාරයෙක් වගේ බීගෙන බීගෙන යද්දි... සියුම් කිතියක් ලැමදෙන් දැනෙද්දි.. ඒක හුරු වෙන්න චුටි වෙලාවක් ගියා. මේ හැමදේම හරිම අලුත්.. හරිම නුහුරුයි ඒත් මන් හරිම ආසයි.

මාවයි දූ පැටියවයි තියටර් එකෙන් නෝර්මල් රූම් එකකට මාරු කරද්දි.. නුපුරිදු නිසාම නර්ස් අතින්ම පැටියව තොටිල්ලෙන් තිබ්බේ දෙයක් මතක් වෙලා මන් ඉක්මනට පැටිය දිහා උවමනාවෙන් බලද්දි.. ඔව්.. මන් බැල්වේ පුංචි පැටියගේ අත් දෙසයි..

ඇස් අදහා ගත නොහැකි විදියට වගේම මගේ විශ්වාසේ

මන් මෙච්චර කල් බලන් උන්නු ඒ පුංචි මැතික.. ඔව් එදා අර විදියට අපිව දාල ගිය ඒ පුංචි මැතිකගේ එක අතක බෝල දෙකක් එකතු වෙලා චුට්වට ලස්සනට හැදිලා තිබ්බ ඒ හාට් හැඩයේ උපන්ලපේ දෙයියනේ ඒ විදියටම කැටයම් වෙලා.. හාස්කමක් ද මේ.. පතන් ආපු දෙයක්ද මේ.. කෝම හරි ඒ පුංචි මැතිකට ආයෙමත් ජීවිතේ දෙන්න මට

sinhalaebooks.com

පුළුවන් උනා...

"රායා තිනෙති"

එයාගේ අප්පච්චි එයාට දාපු නම....

තිමි...........................